# නියමුවා

ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත

ISSN 1391 - 1031
2018 ජනවාරි
23 වෙළුම 10 කලාපය

ආධාරය රු 30/-

පුවත්පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී


*"ආත්ම ලාභය නොතකා වැඩ කිරීමෙන් තොරව, සෑම සියලු පුද්ගලයෙක්ම දරන යෝධ ප්‍රයත්නයක් නොමැතිව, ජීවිතය නව රටාවකට ගොඩනැංවීම සඳහා දැඩි බවක් සහ අධිෂ්ඨානයක් දක්වන්නේ නැතිව, සියලුම කම්කරුවන්ගේ සහ සියලුම දුප්පත් ගොවියන්ගේ දැඩි සංවිධාන වීමක් සහ සහෝදරාත්මක විනයක් නොමැතිව, මේ සියල්ල නොමැතිව ගැලවීමේ මඟක් නොමැත."*

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**5 වන වෙළුම**
*141 පිටුව)*

## 2018 පළාත් පාලන මැතිවරණයේදී

# සතුරු කඳවුරු අවුලට වැඩි වාසි ජ.වි.පෙ.ට

**පළාත් පාලන මැතිවරණයට අදාළ පූර්ව මැතිවරණ දේශපාලන පෙළගැස්ම තුළ ජ.වි.පෙ.ට එරෙහි සියලු දේශපාලන පක්ෂ අර්බුදයට යමින් ඇති බවත් සියලු ජනබලවේග සහ සමාජ ස්ථරයන් අතර වැඩි වාසි ජනතා විමුක්ති පෙරමුණට අත්වෙමින් ඇති බවත් නිරීක්ෂණය කළ හැකි යැයි දේශපාලන විචාරකයෝ පවසති.**

විශේෂයෙන් සාම්ප්‍රදායික ධනේශ්වර පක්ෂ සියල්ලම පාහේ මෙම මැතිවරණය සමය වන විට විවිධ ස්වරූපයේ අර්බුදයන්හි ගිලී ගොස් තිබේ. ආණ්ඩුවේ පාර්ශ්වයක් වන එක්සත් ජාතික පක්ෂය බලයට පැමිණ වසර තුනක් ගතවන විට පෙර මැතිවරණ පොරොන්දු ඉටුකිරීමට අසමත්වීම හේතුවෙන්ද රට සහ ජනතාව පෙළමින් ඇති ආර්ථික අර්බුදවලට විසඳුම් නොමැතිකම නිසාද ජනතාව අතර වේගයෙන් පිරිහෙමින් ඇත.

ආණ්ඩුවේම අනෙක් පාර්ශ්වය වන ජනාධිපතිවරයාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද එම තත්වය එලෙසම බලපා තිබේ. ඊට අමතරව ඔවුනට පක්ෂය දෙකඩවීම නිසාද බරපතළ හානියක් සිදුව ඇති අතර විවිධ පක්ෂවලින් ඉවත්වූ, ඉවත්කරන ලද කොටස් විශාල මාධ්‍ය ප්‍රචාරයක් සහිතව එක්කර ගනිමින් තිබීම එම අර්බුදයේ තීව්‍ර ස්වභාවය පෙන්වා දෙයි.

එසේම ශ්‍රීලනිපයේ රාජපක්ෂ පාර්ශ්වය ජී.එල්.ගේ පක්‍ෂයෙන් ඉදිරිපත් වෙමින් මෙම මැතිවරණය ඔවුන්ගේ බලය පෙන්වීමක් ලෙස ප්‍රදර්ශනය කරන්නට උත්සාහ ගෙන තිබිණි. කෙසේ වුවද ආණ්ඩුවේ ශ්‍රීලනිප මන්ත්‍රීන් විශාල පිරිසක් තමන් සමග එක්වන බවටත් තමන්ට ආණ්ඩු විරෝධී ජන රැල්ලක් ඇති බවටත් ගෙන ගිය ප්‍රචාරය අසාර්ථක වී වනවාට අමතරව එහි සහයකයින් ගණනාවක් ජනාධිපතිවරයාගේ රැකවරණට පැමිණ ඇති බවක්ද පෙනී යයි. මෙම තත්වය මහින්ද රාජපක්ෂ දුබල කරවා ***02 වැනි පිටුවට***




**05 පුංචි ඡන්දයේ...**



මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ, මෙවර ඡන්දයේ ප්‍රධාන ධනපති දේශපාලන කණ්ඩායම් තුනම...

**07 කෑම් සම්බාධකයට...**




නායකයින් වහසි බස් දොඩමින් මැතිවරණ වේදිකා දෙදරුම් කැව්වද රටින් පොල්, එළවළු...

**11 ප්‍රචාරණය හා පරිභෝජන...**



වෙළඳ ප්‍රචාරණය මිනිසාගේ සියලු සියුම් දුර්වල නිලයන් හඳුනාගෙන ඒවාට ආමන්ත්‍රණය...

**12 අවසන් විසඳුමක් නැති රැකියා...**



පැවති හා පවතින කිසිදු ආණ්ඩුවකට උපාධිධාරීන් සඳහා රැකියා ලබාදීම වෙනුවෙන් වැඩපිළිවෙලක්...


| | |
|---|---|
| සංවාදය.......................... | 03 |
| තරුණ.............................. | 04 |
| ආවර්ජනා......................... | 06 |
| විශේෂ............................ | 08-09 |
| කාන්තා............................ | 10 |
| ජාත්‍යන්තර......................... | 13 |
| විශේෂාංග.......................... | 14 |


***යුක්තිගරුක දේශයක්! සාධාරණ සමාජයක්!! නිවහල් මිනිසෙක්!!!***

# ජනතා විමුක්ති පෙරමුණේ පළාත් පාලන අපේක්ෂකයින් සඳහා වන ආචාරධර්ම පද්ධතිය

01. මා වෙත ලබාදෙන ලද සෑම මහජන ඡන්දයකම වටිනාකම අරුත් ගැන්වෙන පරිදි අවංක ලෙසත්, ආදර්ශමත් ලෙසත්, යුක්ති සහගත ලෙසත්, මහජන සේවය සදහාම කැපවෙන බවටත්,

02. අපේ පක්ෂයේ ප්‍රතිපත්තිවලට සහ අනන්‍යතාවන්ට අනුකූලව හැසිරෙන බවටත්,

03. අල්ලස, දූෂණය, වංචාව හා නාස්තිය මුළුමනින්ම පිටුදකින බවටත්,

04. සංවර්ධනය සදහා වෙන්කරනු ලබන මහජන ධනය සෑම රුපියලකටම වඩා වැඩි වටිනාකමක් දෙමින් කොන්ත්‍රාත් දේශපාලනය වෙනුවට ස්වේච්ඡා සේවය සදහාම කැප වන බවටත්,

05. අපේ පක්ෂයේ සියලු මහජන නියෝජිතයින් විසින් ප්‍රතිපත්තියක් ලෙස මෙතෙක් අනුගමනය කළ මහජන නියෝජිතයින්ගේ වැටුප් හා දීමනා පෞද්ගලිකව පරිහරණය නොකිරීමේ ප්‍රතිපත්තියට අනුව කටයුතු කරන බවටත්, මා හට හිමි වැටුප් හා දීමනා දිස්ත්‍රික් පදනමින් කරනු ලබන මහජන සේවා සඳහා පොදු අරමුදලකට බැර කිරීමට කටයුතු කරන බවටත්,

06. මහජනයා ලබාදෙන ජන වරම අයුතු බලයක් ලෙස සලකා කටයුතු නොකරන බවටත්, අයුතු සහගත ලෙස එය ක්‍රියාවේ නොයොදන බවටත්,

07. ආචාරශීලී, ගුණගරුක, නිහතමානී මහජන සේවකයකු ලෙස සමාජයට ආදර්ශයක් ලබා දෙමින් කටයුතු කරන බවටත්,

08. පළාත් පාලන ආයතන වෙතින් සිදුකරනු ලබන සංවර්ධන කාර්යයන්හිදී, මහජනතාවට ලබාදිය යුතු සියලු තොරතුරු ලබාදෙන බවටත් විශේෂයෙන් මුල්‍ය පරිහරණයේදී විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන බවටත්,

09. ගමෙහි ඇති පොදු මහජන සුභසාධනයට අදාළ ගැටලු හඳුනා ගෙන ඒවා විසඳා ගැනීම සඳහා උපරිම දායකත්වය ලබා දෙන බවටත්,

10. ගම ගොඩනගන කාර්යයේදී අදාළ බල ප්‍රදේශයේ විවිධ ජනකොටස්වල ප්‍රමුඛ අවශ්‍යතා හඳුනාගනිමින්ද ඔවුන්ගේ ගැටලු සඳහා විසඳුම් සෙවීමේදී ඒ ඒ ජන කොටස්වල අදහස් හා යෝජනා සැලකිල්ලට ගනිමින්ද ප්‍රදේශයේ කාර්යයන් සඳහා සෑම විටම ජන සහභාගිත්වය සහිතව කටයුතු කරන බවටත්,

11. මහජනයා විසින් ලබාදෙන ජනවරම භාවිතා කරමින්, කිසිම ආකාරයකින් පෞද්ගලිකව මාහට හෝ අන් අයෙකුට අයුතු වාසියක් හෝ වරප්‍රසාදයක් සැලසෙන අයුරින් ක්‍රියා නොකරන බවටත්,

12. ආගම්, කුල, ජාති සහ පක්ෂ භේදයකින් තොර පරිසර හිතකාමී යහපත් ගමක්/නගරයක් නිර්මාණය කිරීම අරමුණ කරගනිමින් ජනතා සේවකයකු ලෙස ඔබගේ ජනවරමට එකඟව කටයුතු කරන බවටත්,




## එතෙරින්...

### පලස්තීන සහයෝගීතාව වෙනුවෙන් ඉතාලියේදී

රෝමයේ Via venetoහි ඇමරිකා එක්සත් ජනපද තානාපති කාර්යාලය ඉදිරිපිට පලස්තීනයට සහාය පලකරමින් පසුගියදා පැවැති උද්ඝෝෂණයට ජනතා විමුක්ති පෙරමුණේ ඉතාලි ශාඛාවේ විශාල පිරිසක්ද එක්ව සිටියහ. මෙම උද්ඝෝෂණයට ඉතාලිය තුළ ක්‍රියාත්මක විවිධ අධිරාජ්‍ය විරෝධී අරගල කණ්ඩායම් හා ප්‍රගතිශීලී සංවිධාන සහභාගි වී තිබිණි. ඉතාලි උද්ඝෝෂණයක් සඳහා ශ්‍රී ලංකාවේ ජ.වි.පෙ. මැදිහත්වීම සුවිශේෂී විය.




### සහෝදරත්වයේ දිනය රෝමයේදී

සමාජවාදී තරුණ සංගමයේ රෝම සංවිධානය විසින් තුන්වන වරටත් සංවිධානය කරන ලද රෝම සහෝදරත්වයේ දිනය විවිධ රටවල සංස්කෘතික අංගද සහිතව පසුගිය දෙසැම්බර් 10වැනි දින රෝමයේදී පැවැත්විණි. මෙම අවස්ථාවට ආරාධිත දේශකයකු ලෙස ජ.වි.පෙ. ස්වීඩන් කමිටුවේ කුමාර ගිනිගත්ගල සහෝදරයාද සහභාගී විය. මෙම අවස්ථාවට ජාත්‍යන්තර සංවිධාන රැසක නියෝජිතයෝ සුභ පැතුම් එක්කළහ. ඉතාලියේ විශ්වවිද්‍යාල ආචාර්යවරු රැසක්ද එක්ව සිටියහ.




### වැලිකතරේ සිත්තම සමාප්ති උළෙල

එතෙර අපි කුවේට් ශාඛාව සංවිධානය කරන වැලිකතරේ ලාංකේය සිත්තම කලා උළෙල සමාප්ති උත්සවය පෙබරවාරි 16වැනි දින කුවේට්හි නවාලි බෝයිස්කවුට් ශාලාවේදී පැවැත්වීමට නියමිතය. මේ සඳහා ප්‍රධාන ආරධිත ලෙස එතෙර අපි සංවිධානයේ සුනිල් හඳුන්නෙත්ති සහෝදරයා සහ මඩකලපුව විශ්වවිද්‍යාලයේ සෞන්දර්ය පිළිබඳ බාහිර කථිකාචාර්ය කාලිදාස් මුණියන්ඩි මහතා සහභාගි වීමට නියමිතය. මීට අමතරව කලාවේදීන් වන ප්‍රවීන ගායක ශිල්පි මිත්‍ර කපුගේ, රංගන ශිල්පිනි දීපානි සිල්වා, නාට්‍යවේදී චන්ද්‍රසෝම බිංදුහේවා, රංගන ශිල්පි ප්‍රේමරත්න තෙන්නකෝන් ඇතුළු පිරිසක් සහභාගි වීමට නියමිතය.




### මහාචාර්ය රාජ් සෝමදේව ඉතිහාසය දේශනයකට

එතෙර අපි සංවිධානයේ කටාර් ශාඛාව සංවිධානය කරන මහාචාර්ය රාජ් සෝමදේවයන්ගේ විශේෂ දේශනයක් 2018 ජනවාරි 19 දෝහා නගරයේ ප්ලාසා ඉන් හෝටලයේදී පැවැත්වේ. මෙහි ප්‍රධාන ආරාධිත ලෙස කටාර් රාජ්‍යයේ ශ්‍රී ලංකා තානාපතිවරයා සහභාගි වීමට නියමිතය. මීට අමතරව මහාචාර්ය සෝමදේවයන් විසින් එහි ස්වාෆර්ස් ජාත්‍යන්තර පාසලේ ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට විශේෂ දේශනයක්ද ගුරුවරුන් සඳහා වැඩමුළුවක්ද පැවැත්වීමට නියමිතය.



### 2018 පළාත් පාලන...

මුල් පිටුවෙන්

ඇති අතර ඔහුගේ සහයක පක්ෂද මේ වන විට පවතින්නේ ඔහු ශක්තිමත් කළ නොහැකි තරමේ දුබල බවකය. එසේම මහින්ද පිලේ ඇතැමුන් මෛත්‍රී පිලට පනිද්දී මෛත්‍රී සමග සිටි අය මහින්ද පිලට මාරු වෙමින් සිටීම මගින් ප්‍රතිපත්ති විරහිත ධනවාදී බලලෝභී දේශපාලනයේ නිරුවතද මනාව ප්‍රදර්ශනය වෙමින් තිබේ.

මෙම ගැටලු එම දේශපාලන පක්ෂවල අභ්‍යන්තර දුබලතා හා බලය පිළිබඳ අපේක්ෂාභංගත්වයන් මෙන්ම පොදුවේ නව ලිබරල් ධනවාදය මුහුණු දී ඇති අර්බුදයේම ප්‍රකාශනයක් බව පවසන දේශපාලන විශ්ලේශකයෝ මෙම තත්වය හමුවේ ජනතා විමුක්ති පෙරමුණ වැනි විකල්ප සමාජ ආර්ථික දේශපාලන වැඩපිළිවෙළක් සහිත ස්ථාවර දේශපාලන ව්‍යාපාරයකට විශාල ඉඩකඩක් සමාජය හමුවේ විවර වෙමින් ඇති බව පෙන්වා දෙති. ඒ අනුව එළඹ ඇති මැතිවරණ වකවානුව තුළ ගම් සහ නගර මට්ටමින් ජන පදනම පුළුල් වෙමින් ඇති එකම දේශපාලන පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ බව බොහෝ විචාරකයින්ගේ මතය වී තිබේ.

නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# ‘සුභ’ ‘අලුත්’ අවුරුද්දක් සඳහා...

කැලැන්ඩරයට අනුව අලුත් අවුරුද්දක් ලබන ජනවාරියේ කතුවැකිය ලිවීමට සූදානම්ව බලන විට පෙනීගියේ මෙවර කතුවැකියද මීට පෙර ජනවාරිවල ලියූ කතුවැකිවලටම සමාන විය හැකි බවය. සෑම වසරක්ම අවසන්ව අලුත් අවුරුද්දක් ආරම්භ වන විට එම අලුත් අවුරුද්ද සැබවින්ම ‘සුභ’ හා ‘අලුත්’ අවුරුද්දක් බවට පත්කර ගත යුතු යැයි අපි සැමවිටම ජනතාවට අවධාරණය කළෙමු. එහෙත් පසුගිය වසර දෙස ආපසු හැරී බලනවිට පෙනීයන්නේ, ගෙවී ගිය අවුරුද්දේද අලුත් යමක් කිරීමට ජනතාව අසමත්ව ඇති බවත් පරණ ක්‍රමයටම ජීවත්ව ඇති බවත්ය.

ඒ අනුව සෑම වසරක මෙන්ම, වසර ආරම්භයේදී සම්ප්‍රදායට අනුව කරගන්නා සුභ පතා ගැනීම්වලින් අනතුරුව පසුගිය වසර ගෙවී ගොස් ඇත්තේ පැරණි ක්‍රමයටමය. පැරණි පාරේමය. දැන් සැම වසරක සිදුවූ ලෙසටම මේ වසරේදීද ගෙවුණු වසරේ තිබුණු පැරණි ප්‍රශ්නද, පැරණි දුක්වේදනාද, පැරණි ආකල්පද, පැරණි දේශපාලනයද කරගසාගෙන අලුත් අවුරුද්දට පා තැබීමට ජනතාවට සිදුව තිබේ. අවුරුද්ද ආරම්භයේදී කරනු ලබන සුභ ප්‍රාර්ථනා ඉටුවී නැති බව පෙනීයන්නේ එවිටය.

ගෙවුණු හැම අවුරුද්දකින්ම පසු අලුත් අවුරුද්ද සුභ වී තිබෙන්නේ කාටද? එක් අතකින් ‘අලුත් අවුරුද්ද’ ‘මාර්කට්’ කර ජනතාව එහි ගොදුරු බවට පත්කර මුදල් හම්බකරන වෙළඳුන්ටය. අනෙක් අතට ජනතාවට බොරු පොරොන්දු කප්පරක් දී බලය ලබාගෙන මහජන මුදල් ගසාකමින් සුර සැප විඳින පාලක පංතියේ දේශපාලකයන්ටය. පොදු ජනතාවට අවුරුදු සුභ වී නැත. රටේ ණය බර වැඩිවෙන වේගයෙන්ම පෞද්ගලිකව ජනතාවගේ ණය බරද වැඩිවෙමින් තිබේ නම්, රටේ දුප්පත්කම වඩිවෙන වේගයෙන්ම ජනතාවගේ දුප්පත්කමද වැඩිවෙමින් තිබේ නම් ආණ්ඩුවක් විසින් ජනතාවට ලබාදිය යුතු මූලික පහසුකම් වන අධ්‍යාපනය, සෞඛ්‍ය සේවය, ගමනාගමන පහසුව නොලැබීම නිසා ජනතාව ඉන් පීඩාවට පත්ව සිටී නම්, ජනතාව අනාරක්ෂිත තත්වයට හා බලාපොරොත්තු කඩවූ තත්වයට පත්ව සිටීනම් එවන් ජනතාවකට අලුත් අවුරුද්ද සුභ වන්නේ නැත. අප වෙනස් කළ යුත්තේ මේ විෂම චක්‍රයය.

කෙසේ වෙතත් 2018 වසර ලබන්නේ, වෙනස් තත්වයක් යටතේය. ඒ අලුත් අවුරුද්ද මෙන්ම ඉදිරි අනාගතයද සුභකර ගැනීමට ඔබ කැමැති නම් ඒ සඳහා වන අනඟි අවස්ථාවක් සහිතවය. එනම් වසර මුලදීම පවත්වන පළාත් පාලන මැතිවරණයද සමගය. අලුත් අවුරුද්ද සැබෑ ලෙසම ‘අලුත්’ හා ‘සුභ’ කරගැනීම සඳහා වෙනස් තීරණයක්, අලුත් තීරණයක් ගැනීමට ජනතාව සූදානම් නම් මේ වසරේ ඒ සඳහා ජනතාව ඉදිරිපිට මහඟු අවස්ථාවක් තිබේ. ඒ, පළාත් පාලන මැතිවරණයෙන් රට ‘අලුත්’ කිරීමේ ගමන ඇරඹීමට අදිටන් කර ගැනීමය.

අලුත් අවුරුද්ද ආරම්භයේදීම එන පළාත් පාලන ඡන්දය අලුත් ඡන්ද ක්‍රමයක් සහිත එකකි. එහි මනාප ක්‍රමය නැත. එය හොඳ දෙයකි. එහි කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් තෝරාගැනේ. එයද හොඳ දෙයකි. අලුත් වෙනසකි. කාන්තා නියෝජනය 25%ක් ලෙස අනිවාර්ය වී තිබේ. එය කාන්තාවන් ලද ජයග්‍රහණයකි. අලුත් වෙනසකි. මෙම අලුත් වෙනස්කම් සහිත පුංචි චන්දයේ සැබෑ අරුත එලගැන්වීමට නම් එම ඡන්දයේ ප්‍රතිඵලයද ‘පැරණි’ වර්ගයේ ප්‍රතිඵලයක් නොවී ‘අලුත්’ ප්‍රතිඵලයක් විය යුතුය. අලුත් අවුරුද්දේ අලුත් ක්‍රමයකින් එන ඡන්දයේ ප්‍රතිඵලය සුභ හා අලුත් එකක් වීමට නම් පුංචි ඡන්දයේදී ඡන්දදායකයා ‘අලුත්’ තීරණයක් ගත යුතුය. ‘අලුත්’ අරමුණකින් ඡන්දය පාවිච්චි කළ යුතුය. සැබෑ වෙනසක ආරම්භය පුංචි ඡන්දයෙන් පටන් ගැනීමේ අලුත් ආකල්පයකින් දේශපාලනයට දායක විය යුතුය.

වසර ආරම්භයේදීම තේරී පත්වන තමන්ට වගකියන තම කොට්ඨාසයේ මහජන නියෝජිතයා ලෙස දූෂිතයින්, හොරුන් හා තක්කඩියන් වෙනුවට වංචා දූෂණ නැති හා දූෂණය පැරදවීමේ ජවය ඇති හොඳ අපේක්ෂකයෙකු පත්කර ගතහැකි නම්, මෙතෙක් වංචාවේ දූෂණයේ තිප්පොලවල් බවට පත්ව තිබූ තමන්ගේ සභාව වංචාවෙන් දූෂණයෙන් තොර මිත්‍රශීලී සැබෑ මහජන ආයතනයක් බවට පත්කර ගත හැකි නම්, එය නව වසරේ ලද ඉහළම ජයග්‍රහණය වනු ඇත. ඒ සමගම සැබෑ ලෙසම අලුත් අවුරුද්ද ‘අලුත්’ හා ‘සුභ’ වනු ඇත.

එබැවින් ලැබුවාවූ අලුත් අවුරුද්ද සැබවින්ම ‘සුභ’ හා ‘අලුත්’ අවුරුද්දක් බවට පත්කර ගැනීම සඳහා ගත යුතු නිවැරදිම තීරණය ගැනීමට හැකිවනු ඇතැයි විශ්වාස කරන අපි, ඒ සඳහා ඔබට නව වසරේ නව තීරණයකට, නව ගමනකට සුභ පතමු.

# ජනතාව සුවිශේෂී ජයග්‍රහණයක් ජවිපෙට ලබාදේවි



ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

***නියමුවා:- පළාත් පාලන මැතිවරණ සටන ඇරඹී තිබෙනවා. ජ.වි.පෙ. සටන් පෙරමුණේ ස්වභාවය, ශක්තිය පිළිබඳ ඔබේ තක්සේරුව කවරාකාරද?***

*අනුර දිසානායක සහෝදරයා:-* විශේෂයෙන්ම පසුගිය අවුරුදු තුන පුරාවටම ජනතා විමුක්ති පෙරමුණ මේ රටේ ජනතාව ගේ සැබෑ ගැටලු නියෝජනය කරමින්, ඒ වගේම රටේ ජනතාව ගැටලුවලට මුහුණ දෙන සෑම තැනකම ඔවුන්ගේ අයිතීන් සහ ඔවුන්ගේ සාධාරණ ඉල්ලීම් වෙනුවෙන් කටයුතු කරලා තිබෙනවා. ඒ වගේම මේ මැතිවරණය නව ඡන්ද ක්‍රමයක් සහිත එකක්. මනාප ඡන්ද ක්‍රමය අහෝසි වන කොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් ලැබෙන කාන්තා නියෝජනය අනිවාර්ය කෙරෙන ඡන්ද ක්‍රමයක්. මෙමකොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් ලැබෙන ක්‍රමයක්. ඒ නිසා මේ වන විට අපි අපේ පක්ෂයේ ග්‍රාමීය මට්ටමේ සංවිධාන ජාලයක් සහ ඊට අදාළ නායකත්වයනුත් තහවුරු කරගැනීම සඳහා ඉතාමත් වැදගත් කාර්ය භාරයක් කරමින් සිටිනවා.

මෙම මැතිවරණය එලැබෙන්නේ රනිල් - මෛත්‍රී හවුල් ආණ්ඩුවේ අවුරුදු තුනක පාලනයකින් පසුවයි. විශේෂයෙන් පැවති පාලනයත් වර්තමාන පාලනයත් ඉතා හොඳින් ජනතාවට ඔප්පුකොට තිබෙනවා, ඔවුන් ජනතාවගේ වුවමනාවන් ඉෂ්ටකරනවා වෙනුවට ඔවුන්ගේ සහ ඔවුන්ගේ සහචර කණ්ඩායම්වල වුවමනාකම් නියෝජනය කරන බව. වංචාවේදී දූෂණයේදී නාස්තියේදී ඒ වගේම ආර්ථික ප්‍රතිපත්තියේදී දේශපාලන සංස්කෘතියේදී මේ සියලු කරුණු ගත්තම මේ කඳවුරු දෙකක් නොව එකම කඳවුරක පාර්ශ්වකරුවන් බව ඉතා හොඳින් පෙන්නුම් කර තිබෙනවා.

එක්සත් ජාතික පක්ෂය ඡන්දයට අවතීර්ණ වෙන්නේ, තමන්ගේ අසාර්ථක ආණ්ඩු පාලනයෙන් අවුරුදු තුනකට පසුවයි. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පිල මෙම මැතිවරණයට අවතීර්ණ වෙන්නේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඇතිවූ දරුණුතම බෙදීමක් හා පසුගිය ජනාධිපතිවරණයේදී ඔහුට ඡන්දයවත් ලබා නොදුන් කණ්ඩායමක් සමගයි. ඒ වගේම රාජපක්ෂ කඳවුරත් හුරුවී තිබෙන්නේම ආණ්ඩු බලය සමගම මැතිවරණ කරන්නයි. කාලයක් මුළුල්ලේම ඔවුන් මැතිවරණ කරනු ලැබුවේ රාජ්‍ය මාධ්‍ය, රාජ්‍ය දේපළ, බඩු බෙදීම, පොලිසිය, හමුදාව, මූල්‍ය බලය, මැර බලය, මේ සියල්ල එක්රැස්කරගෙනයි. එහෙම මැතිවරණ කරපු යුගය ඉතිහාසය තුළ පරාජයට පත්වී තිබෙනවා. එසේම පසුගිය අවුරුදු තුන ඇතුළත ඔවුන් තමන්ගේ පරාජයට හේතු වූ කිසිදු කරුණක් සාධනීය ලෙස වෙනස්කර ගැනීමට අසමත් වූවා පමණක් නොවෙයි, එම ගමන්මගේම වඩාත් තීව්‍ර ලෙස ගමන්කොට තිබෙන බව පෙන්නුම් කරනවා.

එනිසා ලංකාවේ ධනපති කඳවුරේ ඉතාමත් දුර්වල අවස්ථාවක තමයි මේ මැතිවරණය ඇවිත් තිබෙන්නේ. ඊට පරස්පර ලෙස ජනතා විමුක්ති පෙරමුණ, පැවති පාලනයටත් පවතින පාලනයේ අවුරුදු තුනක කාල පරිච්ඡේදය තුළත් ජනතාව පීඩාවට පත්කරන කවර ක්ෂේත්‍රද ඒ ගොවි ජනතාව වෙන්න පුළුවන්, තරුණ පරම්පරාව වෙන්න පුළුවන් ශිෂ්‍යයන් වෙන්න පුළුවන්, කම්කරුවන් වෙන්න පුළුවන්, කුඩා තේවතු හිමියන් වෙන්න පුළුවන්, ධීවරයන් වෙන්න පුළුවන්, සමාජයේ කවර කණ්ඩායමක් වුවත්, ඔවුන් පෙළන අසාධාරණයට එරෙහිව හඬනගා තිබෙනවා. ඔවුන්ගේ සාධාරණය වෙනුවෙන් සටන්කර තිබෙනවා. ඒ නිසා ජනතාවගේ සුවිශේෂී විශ්වාසයක් දිනාගත් පක්ෂයක් ලෙස අපි මේ මැතිවරණයට අවතීර්ණ වී තිබෙනවා.

අනික් පසින් ගත්තොත් මෙම මැතිවරණය එන්නේ නව ඡන්ද ක්‍රමයක් යටතේ. එහි විශේෂත්වයක් තමයි කොට්ඨාසයට මන්ත්‍රීවරයෙක් ලැබීම. ඒ මගින් අපට හැකියාව ලැබී තිබෙනවා, අපේ පක්ෂයේ පහළ මට්ටමේ යාන්ත්‍රණය ඉතාමත් සක්‍රීය කරගැනීමට අවස්ථාවක්. එක පැත්තකින් සෑම කොට්ඨාසයකට සංවිධාන ජාලයක් වගේම එයට ප්‍රධාන නායකයෙක් පත්කර ගැනීමේ හැකියාව මෙයින් ලැබී තිබෙනවා. ඒ වගේම ප්‍රාදේශීය සභා කිවුවහම, පළාත් පාලන ආයතන කිවුවහම ජනතාව තුළ මතය තමයි වංචා, දූෂණ, අල්ලස, කොන්ත්‍රාත් සංස්කෘතිය. ඒ නිසා එම අල්ලසට, දූෂණයට කොන්ත්‍රාත් සංස්කෘතියට එරෙහිවීමේ සුජාත අයිතිය සහ එම දේශපාලනය බැහැර කිරීමේ අත්දැකීම් සහ වුවමනාව තිබෙන්නේ ජනතා විමුක්ති

> ආණ්ඩුවේ විනාශකාරී ගමන පිළිබඳ ජනතාව තැන තැන බනිමින් ඉන්නවා. මළ ගෙදරදි, කඩපොළේදි, බස් රියේදි, දුම්රියේදි, ආණ්ඩුවට බරපතළ විවේචන එල්ලකරමින් සිටිනවා. හැබැයි කෝච්චියේ, බස්පොළේ, කඩපොළේ බැන්නයි කියල ඒ ක්‍රියාමාර්ග ආපසු හැරවෙන්නේ නැහැ. ඒ නිසා ඒ ක්‍රියාමාර්ග ආපසු හැරවීම සඳහා හොඳම අවස්ථාව තමයි මේ මැතිවරණය.

පෙරමුණට විතරයි. ඒ නිසා දේශපාලනික වශයෙන් ගත්තොත් ඉතාමත් වාසි සහගත දේශපාලනයක් සහිතව අපි මෙම මැතිවරණයට අවතීර්ණ වෙමින් සිටිනවා. මේ වෙනුවෙන් අපි දීර්ඝ කාලයක් තිස්සේ අවශ්‍ය වන සැලසුම් සහ ක්‍රියාමාර්ග සංවිධාන වැඩකටයුතු සකස්කරමින් තිබෙනවා. ඒ නිසාම අපි වේගයෙන් අපේ මැතිවරණ ක්‍රියාවලිය ආරම්භ කළා. ඒ නිසා අපි විශ්වාස කරනවා, මේ රටේ ජනතාව මෙම මැතිවරණයේදී සුවිශේෂී ජයග්‍රහණයක් ජනතා විමුක්ති පෙරමුණට ලබාදේවි කියලා.

***නියමුවා:- ආණ්ඩුව නියෝජනය කරන එ.ජා.ප.යට සහ ශ්‍රීල.නි.ප.යට ආණ්ඩු බලය හෙබවීම විසින් අත්කර දුන් විශේෂ වාසිදායක තත්වයක් මේ මැතිවරණය තුළ පෙනෙන්නට නැහැ. ඒ ඇයි?***

*අනුර දිසානායක සහෝදරයා:-* ඔව්, ආණ්ඩු බලය හෙබවීම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ මෛත්‍රී පිලට හා එක්සත් ජාතික පක්ෂයට වාසියක් වී තිබෙන්න ඕනෑ. නමුත් පසුගිය ජනවාරි මාසෙ 08වැනිදා ජනාධිපති මෛත්‍රීපාල මහත්තයා ජනාධිපති පුටුවේ වාඩිවුණාට පසුව, රනිල් වික්‍රමසිංහ අගමැති පුටුවෙ වාඩිවූවාට පසුව ඔවුන්ගෙ පාලනයන් පිළිබඳව කවර හෝ සාධනීය බලාපොරොත්තුවක් තියන ලද කිසිදු ජනකොටසක වුවමනාවන් ඉටුකිරීමට අසමත් වී තිබෙනවා. විශේෂයෙන් ග්‍රාමීය වශයෙන් ජනතාව ආණ්ඩුව ප්‍රතික්ෂේප කොට තිබෙනවා. තරුණයන් අතර විසුළුකාරී තත්වයට පත්වී තිබෙනවා. යහපාලනය විගඩමක් බවට පත්වී තිබෙනවා. ඒ නිසා ආණ්ඩුව බලය හෙබවූවන්ට අවාසිසහගත තත්වයක් ඇතිවී තිබෙනවා.

ඒ වගේම මේ ආණ්ඩුවේ සංයුතිය පාර්ශ්ව දෙකක්. එකක් ආණ්ඩුවේ මෛත්‍රී පිල. අනෙක එක්සත් ජාතික පක්ෂයේ පිල. ඔවුන් ආණ්ඩු කරන්නේ එකට. උදාහරණයක් විදිහට ගත්තොත් ඔවුන් ඇමතිවරු සහ නියෝජ්‍ය අමාත්‍යවරු සම්මිශ්‍රකොට බෙදාගෙන තිබෙනවා. ඒත් ඔවුන් එකට ආණ්ඩුව කරමින්ම බෙදීලා ඡන්ද ව්‍යාපාරය කරනවා. ඒ

15 වැනි පිටුවට




# යුක්තිය හා සාධාරණය ඉල්ලන මිනිසුන් වෙනුවෙන්...



පලස්තීනය වසර ගණනාවක් පුරා තම දේශය ආරක්ෂා කර ගැනීමේ බරපතළ ප්‍රශ්නයකට මුහුණ දෙමින් සිටියි. ඊශ්‍රායලය හා පලස්තීන අතර දේශසීමා ප්‍රශ්නය යනු ඊශ්‍රායලය විසින් අත්තනෝමතික ලෙස පලස්තීන භූමිය ආක්‍රමණය කිරීමයි. අද එය හුදෙක් රාජ්‍යයන් දෙකක පවතින ගැටලුවකට එහා ගිය ලෝක සාමයට තර්ජනයක් බව ප්‍රකාශ කරන සලකුණු බොහෝ වෙයි.

ජෙරුසලම ඊශ්‍රාලයේ අගනුවර ලෙස ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් ප්‍රකාශයට පත් කිරීමත් සමග පලස්තීන රාජ්‍යයට විරුද්ධව පවතින ජාත්‍යන්තර හස්තයන් කෙතරම් ප්‍රබලදැයි හඳුනාගත හැකි විය. නමුත් එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය තුළ රටවල් අති බහුතරයක් පලස්තීනයට සහයෝගය පළ කිරීම තුළින් ලෝක බලවතකු වන ඇමරිකා එක්සත් ජනපදයට සිතූ ලෙස ලෝකය හැසිරවිය නොහැකි බවට වන පණිවිඩයත් ලෝක සාමය, සමගිය, ඒකත්වය පිළිබඳ මුළු ලොවම අවධියෙන් සිටින බවත් ට්‍රම්ප් ඇතුළු අධිරාජ්‍යවාදී බලවතුන්ට හඟවන ලදී.

එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය තුළ පලස්තීනයට සහයෝගය දැක්වූ රටවල් ගණන 128කි. ඇමරිකාව වෙනුවෙන් පෙනී සිටියේ කුඩා රාජ්‍යයන් 09ක් පමණි. එක් රටක් සිදුකරන අසාධාරණ බලපෑම්වලට එරෙහිව ලෝකයේ රටවල් බොහොමයක් එකට එක්වුණු අවස්ථාවක් ලෙස පලස්තීන රාජ්‍යයට සහයෝගය දක්වමින් එක්සත් ජාතින්ගේ මහා මණ්ඩලය තුළදී රටවල් 128ක් ඡන්දය භාවිතා කිරීම පෙන්විය හැක. ඡන්දය පැවැත්වීමට ප්‍රථම ඇමරිකානු ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් තම රටින් විශාල ආධාර ප්‍රමාණයක් ලෝකයේ කුඩා රාජ්‍යයන් බොහොමයකට ලබාදෙන බවත් තම රාජ්‍යයට එරෙහි වන රාජ්‍යයන් පිළිබඳව ඉදිරියේදී දැඩිව ක්‍රියා කරන බවත් පවසමින් තර්ජනාත්මකව සිදුකළ දේශනයට පවා විරුද්ධව කටයුතු කළ රටවල් පිළිබඳව සතුටු විය හැකිය. එක් රටක ස්වාධීන අයිතියට තර්ජනයක් එල්ලකරන අධිරාජ්‍යවාදය පැරදවීමටම ලෝකයම එකතුවීම ලෝක දේශපාලනයේ විශාල පියවරක් ලෙස සැලකිය හැකිය.

පලස්තීන සහයෝගීතාවය වෙනුවෙන් ලෝකයම පෙළ ගැසෙනවිට ශ්‍රී ලංකාවද පලස්තීනයට සහයෝගීතාවය ප්‍රකාශ කිරීම වැදගත් කරුණකි. මෙරට කිසිම ජාති, ආගම්, කුල, දේශපාලන පක්ෂ, පාට භේදයකින් තොරව පලස්තීනයට සිදුවන අසාධාරණය වෙනුවෙන් රටක් ලෙස ශ්‍රී ලංකාව පෙනී සිටීම යහපත්ය.

පලස්තීනයට සහයෝගය දැක්වීම වෙනුවෙන් ශ්‍රී ලංකාව පුරා බැනර්වල පෙත්සමක් අත්සන් කරන ලදී. පලස්තීන සහයෝගීතා සම්මන්ත්‍රණය මගින් රටේ සියලු දේශපාලන පක්ෂ, සියලුම ආගමික නියෝජිතයන්, මාධ්‍යවේදීන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විද්වතුන්, ශ්‍රී ලංකාවේ විදේශ තානාපතිවරුන් රැසකගේ සහයෝගීතාවයෙන් පලස්තීන සහයෝගීතා සම්මන්ත්‍රණය පැවැත්විණි. සමාජවාදී තරුණ සංගමයද පසුගිය වසරවලදීත් පලස්තීන ජනයා ගෙනයන සාධාරණ අරගලය වෙනුවෙන් රට පුරා ජනතාව දැනුවත් කරමින් හඬ නැගුවේය. එම හඬ මෙවර තවත් උපරිම ලෙස නැඟීමට හැකිවීම යුක්තිය හා සාධාරණත්වය අගයන මිනිසුන් වෙත මහත් ධෛර්යක් වූ බවට නොඅනුමානය.

# රෝමයේ සහෝදරත්වයේ දිනය

සමාජවාදී තරුණ සංගමයේ රෝම කමිටුව විසින් සංවිධානය කළ සහෝදරත්වය දිනය තුන්වන වරටත් පැවැත්විය. එහි දී දේශන හා සංස්කෘතික ප්‍රසංගයක් පැවැත් විය. එම අවස්ථාවට ඉතාලියේ ප්‍රගතිශීලී සංවිධාන නියෝජිතයන් සහ ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් සහභාගි වූහ.




# පුංචි ඡන්දයේදී ඔබේ වගකීම

නව වසර එළෙඹීමත් සමග ඔබ අප කාගේත් අවධානයට ලක්ව ඇති කාරණය පළාත් පාලන මැතිවරණයයි. නැත්නම් ගමේ පුංචි ඡන්දය කියලා කියන්න පුළුවන්. මේ ඡන්දය පවත්වන්නේ නියමිත කාලයට වඩා අවුරුදු දෙකහමාරකටත් වඩා ප්‍රමාද වෙලයි. එහෙම වුණේ බලයේ ඉන්න පාලකයන්ට ජනතාවට දීපු පොරොන්දු ඉටුකරන්න බැරිවුණ නිසා. දැන් මැතිවරණය පවත්වන්නෙ තවදුරටත් කල්දාන්න බැරි තරමට විරෝධතා එල්ල වුණු නිසා.


එත් එක්කම මෙවර ගමේ පුංචි ඡන්දය එන්නේ ටිකක් වෙනස් විදියකට. ඒ කියන්නෙ කලින් තිබුණ මනාප ක්‍රමය වෙනුවට කොට්ඨාස ක්‍රමයකට. එනම් ගමක් දෙකක් වගේ එකතුවෙන් සෑදුන කොට්ඨාස ඇතුලෙ තියෙන ඡන්දයක් විදියටයි. මේ ඡන්දය එන විදිය අනුව වඩාත් සරලයි. ඒ කියන්නෙ ගමේ සාමාන්‍ය තරුණ තරුණියකට වුණත් ඡන්දෙට ඉදිරිපත් වෙලා දිනන්න අවස්ථාවක් තියෙනවා. දන්න කියන ගමේ නගරයේ අයගෙන් වගේම ඥාති හිතවතුන්ගෙන් ඡන්ද අරගෙන උනත් කොට්ඨාසයක් දිනල ප්‍රාදේශීය සභාවට, නගර සභාවට යන්න අවස්ථාවක් උදාවෙනවා. එනිසා මේ ක්‍රමය කලින් තිබුණ මනාප ක්‍රමයට වඩා හොඳ එකක්. ඒ වගේම අපේ රටේ කාන්තාවන්ට දේශපාලනයට එන්න මේ ක්‍රමය ඇතුළෙ වැඩි අවස්ථාවක් ලබාදීල තියෙනවා. ඒ පැත්තෙන් සලකන කොටත් මේක වඩා සාධනීය එකක්.

ඒ වගේම තමයි ගැමදාම වගේ බලයෙ හිටපු දේශපාලනයට ගම්මට්ටමේ තියෙන්නෙ ලොකු විරෝධයක්. වංචාව, දූෂණය, නාස්තිය හැමදාමත් ඉහවහා ගිහින් තිබුණු ප්‍රාදේශීය සභාව, නගර සභාව තුළින් ප්‍රදේශයේ ජනතාවගේ ප්‍රශ්න විසඳුවේ නැහැ. එනිසා පක්ෂ භේදයකින් තොරව බොහෝ දෙනෙක් කැමැත්තෙන් ඉන්නේ වෙනසක් දකින්න. ඒ හින්දම නැවුම් බලවේගයක් වුණු ජ.වි.පෙ. දිහා හැම දෙනාගෙම වගේ අවධානය යොමු වෙලා තියෙන්නේ. ඒක බස් එකෙත් වැඩ පොළෙත් කඩ පොළෙත් සමාන්‍ය මිනිස්සු අතර සිදුවෙන කතාබහෙන් තේරුම් ගන්න පුළුවන්.

අද දවස කියන්නෙ, සාම්ප්‍රදායික යල්පැනපු දේශපාලන පක්ෂවල පුද්ගලයො ප්‍රතික්ෂේප කරලා ඒ වෙනුවට අලුත් තරුණ බලවේගයන්ට සමාජයේ විශේෂ ආකර්ෂණයක් ඇතිවෙලා තිබෙන වෙලාවක්. ඒ හින්දා තරුණයින්ට මේක හොඳ අවස්ථාවක්, මේ වෙනස කල් තියා හදුනාගත්ත ජනතා විමුක්ති පෙරමුණ තරුණ තරුණියන් සඳහා විශේෂ අවස්ථාවක් මෙම මැතිවරණයේදී ලබාදීමට කටයුතු කර තිබෙනවා.

ඒ වගේම සෑම පළාත් පාලන ආයතනයකටම වැඩපිළිවෙළක් ඉදිරිපත් කරමින් ප්‍රදේශයේ ජනතාවට උපරිම සේවයක් මේ මහජන නියෝජිත ආයතන හරහා කරන්න සූදානමින් සිටිනවා. ඒ නිසා මේ ඇතිවෙලා තියෙන වෙනස තරුණයන් ලෙස අප නිසි ආකරයට පාවිච්චි කරමින් තමන්ගේ එදිනෙදා ජීවිතයේ කටයුතුවලට ඉතා සමීපතම පරිපාලන අයතනය වන ප්‍රාදේශීය සභාව, නගර සභාව වඩා හොඳ මහජන සේවා ස්ථානයක් බවට පත්කිරීමට ජනතා විමුක්ති පෙරමුණේ තරුණ තරුණියන් වැඩි වශයෙන් පත්කර යැවීමට කටයුතු කළ යුතුයි.

ධනපති සහ කොමියුනිස්ට් සමාජ අතර එකක් අනිකට විප්ලවීය ලෙස පරිවර්තනය වීමේ කාල සීමාවක් ද ඇත. මීට අනුරූප වන දේශපාලන පරිවර්තනයේ කාලසීමාවක් ද ඇත. එය අන් කිසිවක් නොව නිර්ධන පන්තියේ විප්ලවකාරී ආඥාදායකත්වය විය යුතුය.
- කාල් මාක්ස්



## පැණි කොමඩු

පැණි කොමඩු වැල
යන එන සෑම තැනකම
තියා යනවාමයි ගෙඩියක්
හේන මත
තහවුරු කරන්නට තම අයිතිය
ඒ විතරක්ම නොව
කැකිරි වැල් හා එක්ව
හිනාවෙනවා ඇද කර කර
හිස් අතින් ඉන්නවට
කොළ විතරක්ම වන වන

කෝමහරි මේ ළගදී
අලි ගැහැව්වට පස්සෙ ඔය හේනට
කැකිරි වැල් දරදඬුව
කොමඩු ගෙඩි ආගිය අතක් නැත
බතල වැල් ටිකත් සී සී කඩ

පාළුවට ගිය හේනක් නම් තමයි
දැන් එය
ඒත් තාමත් හේන ගාවින් යන අය
ඇහෙන බැව් කියනවා
බතල අල වගයක්
හුස්ම ගන්නා හඬ
හෙමිහිට

රුවන් බන්දුජීව

# පුංචි ඡන්දයේ වාසිය කාටද?

සියලු බාධා, අවහිරතා හා දේශපාලන කකුල් මාට්ටු මැද අවසානයේ පළාත් පාලන ඡන්දය 2018 පෙබරවාරි 10 දාට දින නියමවී ඇත. ඡන්දය කල්දැමීමේ හා ඡන්දය දිනාගැනීමේ සටන අවසන්වී දැන් ඡන්ද සටන ආරම්භ වී ඇත. මෙම ඡන්දය අපේ රටේ දේශපාලන ගමන් මඟ වෙනස් කරන ඡන්දයක් බව පෙරමඟ ලකුණුවලින්ම පෙන්වමින් තිබේ. මේ මැතිවරණය ජනතාවට ලැබුණේ, පාලක කණ්ඩායම්වල මැතිවරණ න්‍යාය පත්‍රයට අනුව නොව එයට අභියෝග කොට ජනතාවගේ වුවමනා සඳහා දිනාගනු ලැබූ ඡන්දයක් ලෙසය. එම ඡන්දයේ ආරම්භයේදීම පළමු ජයග්‍රහණය වාර්තා කිරීමට ජ.වි.පෙ. සමත් විය. ඒ, රට පුරාම සභා 300කට වැඩි ප්‍රමාණයකට නාම යෝජනා එකක්වත් ප්‍රතික්ෂේප නොවන ලෙස බාරදීමෙනි. මේ වනවිට මැතිවරණ ප්‍රචාරක ව්‍යාපාරයේද ඉදිරියෙන් සිටීමට ජ.වි.පෙ. සමත්වී සිටී.

මේ පුංචි ඡන්දයේ වඩාම වාසිය තිබෙන්නේ කුමන පක්ෂයකටද? ඡන්දයට පෙර ඒ ගැන හරිහැටි වටහා ගැනීම පුංචි ඡන්දයේදී 'ලොකු වෙනසක්' කිරීමේ අපේක්ෂාවෙන් කටයුතු කරන සැමට හොඳය.

මෙම ඡන්දයේදී පාලක කණ්ඩායම නියෝජනය කරන එ.ජා.ප.යට බිමේ ඇත්තේ අවාසිදායක තත්වයකි. මන්ද මෙම ඡන්දය එන්නේ, ඔවුන් ආණ්ඩුව පිහිටවනු ලැබූ වහාම නොව ආණ්ඩුව පිහිටුවා වසර දෙකහමාරක් ගෙවී ගිය පසුව නිසාය. මෙ වනවිට ජනතාවට ආණ්ඩුව එපාවී ඇති අතර එ.ජා.ප.ය කෙරේ ගොඩනැගී ඇත්තේ කලකිරීමක් හා විරෝධයකි. ආර්ථිකය බිඳවැටී බඩු මිල ඉහළයාම, ජනතාවගේ ආදායම් මාර්ග දුර්වලවීම, සේවා කප්පාදුව හා බදු බර නිසා ඇතිවන ජීවන දුෂ්කරතා, පෙට්‍රල් පෝලිම් ආදියත් රටේ සම්පත් විකිණීමේ එ.ජා.ප. ආර්ථික ප්‍රතිපත්තියත් නිසා ආර්ථික වශයෙන් එ.ජා.ප.යට ඇත්තේ ඔවුන්ගේ අසමත්කම පිළිබඳ ජනතා විරෝධයකි.

උපාධිධාරීන්ගේ රැකියා ප්‍රශ්නය, ගොවි ජනතාවට සහන නොලැබීම, සයිටම් අර්බුදය, උමා ඔය විනාශය වැනි ප්‍රශ්න විසින් ආණ්ඩු විරෝධී බලවේග සටනට පවා කැඳවා තිබෙන අතර එම සටන්වල නායකත්වය දැරුවේ හා දරන්නේ ජ.වි.පෙ.ය.

අනෙක් අතට හොරුන්ට දඬුවම් දීමට නොහැකිවීම, දූෂිතයන් රැකීම හා මහා බැංකු බැඳුම්කර මගඩිය ඇතුළු දූෂණ ක්‍රියා නිසාද එ.ජා.ප.යේ ප්‍රතිරූපය දෙදරාගොස් තිබේ. මේ තත්වය මත ගමට ගොස් 'ගම හැදීමට' ඉල්ලීමට හෝ වංචා දූෂණ නතර කරන බව කීමට එ.ජා.ප.යට පුළුවන්කමක් නැත. එසේම එ.ජා.ප.යේ බහුතරයක් අපේක්ෂකයින් ජනතාව ආකර්ෂණය කරගත හැකි අය නොවේ. මැතිවරණයේදී තම ඡායාරූපයට වඩා ලොකුවට තම නායකයින්ගේ ඡායාරූප පළකිරීමට ඔවුන්ට සිදුව තිබෙන්නේ ඒ නිසාය. එහෙත් ඉන්ද පලක් නැත්තේ එ.ජා.ප. නායකයන්ද දැන් ජනතාවට එපා වී තිබෙන නිසාය.



මේ අනුව රාජ්‍ය බලය යොදාගැනීම, රැකියා ඉල්ලුම්පත් බෙදීම, බඩු බෙදීම, වැනි මැතිවරණ නීතියට පටහැණි දේ කිරීමට එ.ජා.ප.යට සිදුව තිබීමෙන් පෙන්වන්නේද ඔවුන් මුහුණපා තිබෙන මෙම අර්බුදයය. අද මැතිවරණ ව්‍යාපාරය තුළ එ.ජා.ප.ය ජනතා ආකර්ෂණය නැති, සටන්පාඨයක් නැති බංකොලොත් තත්වයකට පත්ව තිබේ. ඔවුන් සතුව තිබූ සම්ප්‍රදායික ඡන්ද ටික හැරෙන්නට වෙන කිසිදු වාසියක් ඔවුනට නැත.

ඊළඟට ශ්‍රීල.නි.ප. තත්වය ඛේදවාචකයක් බවට පත්ව තිබේ. පසුගිය කාලයේ නිල නොවන ලෙස දෙපලුවී තිබූ ශ්‍රීල.නි.ප.ය දැන් නිල වශයෙන්ම දෙකඩ වී ඇත. 'සමගි' වීමට දැරූ සියලු ප්‍රයත්න නිෂ්ඵලවී ඇත. මේ දිනවල මහින්ද ළඟ සිටි සමහර අය මෛත්‍රී ළඟටත් මෛත්‍රී ළඟ සිටින සමහරු මහින්ද ළඟටත් පැනීම පටන්ගෙන ඇත. එහි ප්‍රතිඵලය වී ඇත්තේ ශ්‍රීල.නි.ප. කණ්ඩායම් දෙකම දුර්වල වීමය. පාක්ෂිකයා මානසික වශයෙන් දුබල වීමය. නාම යෝජනා බාර දීමේදීද මෛත්‍රී පාර්ශවයේ නාම යෝජනා දෙකක් ප්‍රතික්ෂේප වූ අතර මහින්ද කණ්ඩායමේ නාම යෝජනා පළමු වටයේ 6ක් හා දෙවන වටයේ 5ක් ලෙස 11ක් ප්‍රතික්ෂේප වී ඇත. එයම ඔවුන් ආරම්භයේදීම ලද පරාජයකි.

මෙයට පෙරද ශ්‍රීල.නි.ප.ය බෙදී තිබුණද මේ ආකාරයෙන් දෙකට බෙදී පක්ෂ දෙකක් ලෙස ඡන්දයකට මුහුණදීමට එයට සිදුවූයේ නැත. නමුත් දැන් නොවැළැක්විය හැකි ලෙස බෙදී වෙන්ව වෙන වෙනම ඡන්දයට යාමට සිදුවීම නිසාත් වර්තමානයේ පවතින මනාප නැති කොට්ඨාස ක්‍රමය සහිත ඡන්ද ක්‍රමය නිසාත් ශ්‍රීල.නි.ප.ය බෙදී පක්ෂ දෙකෙන් අපේක්ෂකයින් දෙදෙනෙක් ඉදිරිපත්ව කොට්ඨාසයේ ශ්‍රීල.නි.ප. ඡන්ද දෙකට බෙදුන විට ප්‍රතිඵලය වන්නේ, දෙපාර්ශවයම පරාජය වීමය. එබැවින් ශ්‍රීල.නි.ප. පාර්ශව දෙකම පවතින්නේ, විශාල අර්බුදයකය.

වෙනදා මහින්ද රාජපක්ෂගේ ඡන්ද ව්‍යාපාරවල කැපීපෙනෙන කාර්යයක් ඉටුකළ වීරවංශ කණ්ඩායම දැන් දුර්වලව නිහඬතාවයට පත්ව තිබේ. ඔවුන්ගේ කණ්ඩායමේ කිහිපදෙනෙක්ම මෛත්‍රී සරණ ගොස් තිබේ. ඒ නිසා මහින්දට දේශප්‍රේමය විකුනා ඡන්ද ගැනීම පහසු නැත. මෙ වනවිට මහින්ද රාජපක්ෂ සතුව තිබූ ඡන්ද වෙළඳපොළ වටිනාකම දුර්වලවී ඇත. දැන් මහින්දගේ ප්‍රතිරූපය විකුණා ගැනීමද පහසු නැත. කුමන උත්සාහ දැරුවද මෙම දේශපාලන පසුබෑමෙන් මිදීමට මහින්ද පාර්ශවයට නොහැක.

අනෙක් අතට මෛත්‍රී පිල සිටින්නේද උභතෝකෝටික තත්වයකය. මෛත්‍රීට බොහෝ තැන්වල අපේක්ෂකයින් ඉදිරිපත් කර ගැනීම පවා දුෂ්කර විය. ඔහු වටා සිටින ඇමතිකම් දරන අය පවා මේ ඡන්දයේදී එතරම් උනන්දුවකින් වැඩ කරන බව පෙනෙන්නේ නැත. මෛත්‍රීගේ පිරිස් බලය ඉතාම දුර්වලය. විවිධ පක්ෂවලින් පෞද්ගලික අරමුණු වෙනුවෙන් පලා එන දේශපාලන සරණාගතයින් වැනි අයට රැකවරණය දීමේ මධ්‍යස්ථානයක් බවටත්, ජ.වි.පෙ.න් ඈත අතීතයේ ඉවත් කරනු ලැබ, විවිධ දේශපාලන අම්බලම්වල ලගිමින් දේශපාලනිකව 'රස්තියාදු' ගැසූ දේශපාලන 'කුණුගොඩවල්' එකතුකර ගන්නා තැන බවටත් මෛත්‍රී පිල පත්ව තිබීමෙන්ම එය මුහුණදී ඇති අර්බුදයේ තරම පැහැදිලි වේ.

මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ, මෙවර ඡන්දයේ ප්‍රධාන ධනපති දේශපාලන කණ්ඩායම් තුනම ජනතා ආකර්ෂණය දිනාගත නොහැකි, දුර්වල තැනක සිටින බවය. ඒ අනුව මැතිවරණ සටන් බිමේ සැබෑ වාසිය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ සඳහාය. මේ වන විටත් පුංචි ඡන්දයෙන් 'වෙනසක් කිරීමේ' මනෝභාවය ඡන්දදායකයා තුළ තහවුරු වෙමින් තිබේ.

> මෙම කරුණුවලින් පැහැදිලි වන්නේ, මෙවර ඡන්දයේ ප්‍රධාන ධනපති දේශපාලන කණ්ඩායම් තුනම ජනතා ආකර්ෂණය දිනාගත නොහැකි, දුර්වල තැනක සිටින බවය. ඒ අනුව මැතිවරණ සටන් බිමේ සැබෑ වාසිය තිබෙන්නේ ජනතා විමුක්ති පෙරමුණ සඳහාය. මේ වන විටත් පුංචි ඡන්දයෙන් 'වෙනසක් කිරීමේ' මනෝභාවය ඡන්දදායකයා තුළ තහවුරු වෙමින් තිබේ.

'ජ.වි.පෙ.ට ගම දීල බලමු' යයි පොදු ජනතාව ප්‍රකාශ කරමින් සිටින්නේ, මේ දේශපාලන අදහසය. වංචා දූෂණවල තිප්පොලවල් බවට, හොර ගුහාවල් බවට පත්ව තිබූ පළාත් පාලන ආයතන මහජනතාවට සේවා සපයන, වංචා දූෂණවලින් තොර මිත්‍රශීලී මහජන ආයතන බවට පත්කිරීමේ හැකියාව පවතින්නේ ජනතා විමුක්ති පෙරමුණට බව ජනතාව තේරුම් ගනිමින් සිටී. එය වෙනත් අනෙක් පක්ෂවලට කළ නොහැක.

එසේම මහජන නියෝජිතයා තමන්ට වගකියන සැබෑ මහජන නියෝජිතයෙක් කර ගැනීමේදී ඒ පිළිබඳවද විශ්වාසය තැබිය හැකි අපේක්ෂකයින් සිටින්නේ ජ.වි.පෙ. තුළය. පළාත් පාලන ආයතන මගින් ගම ගොඩනැගීමේ සැබෑ විද්‍යාත්මක වැඩපිළිවෙළක් ඉදිරිපත් කර තිබෙන්නේද ජ.වි.පෙ. පමණි. එපමණක් නොව 'තිස්සමහාරාමයේ' ආදර්ශයද ජනතාවගේ මතකයේ පවතී. මේ තත්වය තුළ සභාවේ පාලනය ඉල්ලා ජනතාව අතරට තර්කානුකූලව යාහැකි එකම පක්ෂය ජ.වි.පෙ. පමණක්ව තිබේ.

අනෙක් අතට ජ.වි.පෙ.ට සහාය දීමට පෙළ ගැසෙමින් සිටින විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විවිධ වෘත්තීයවේදීන්, රාජ්‍ය සේවයේ හිටපු ප්‍රවීණයින්, කලාකරුවන්, ක්‍රීඩකයින්, රටට හිතැති දේශීය ව්‍යාපාරිකයින් වැනි අය දෙස බලන විටද මේ මැතිවරණයේදී අලුත් බලවේග සමග, අලුත් සහායක බලඇණි සමග සටනට පැමිණ සිටින්නේ ජ.වි.පෙ.ය. ජ.වි.පෙ. අපේක්ෂක කණ්ඩායම්ද තනි තනිව නොව සාමූහිකව වැඩ කරන ප්‍රබල අපේක්ෂක පිරිසකි. මේ සියලු කරුණු ජ.වි.පෙ.ට වාසිදායකව තිබේ.

මේ ඡන්දයේ ජ.වි.පෙ.ට අභියෝග නැතිව නොවේ. ලංකාවේ ඡන්ද දායකයාගේ ගතානුගතික හා සම්ප්‍රදායික බවත් පාලක පක්ෂය බඩු බෙදමින් අල්ලස්වලට ඡන්ද ගැනීමට දරන උත්සාහයත් ආරම්භයේ සිට අවසාන මොහොත දක්වා ජ.වි.පෙ.ට එරෙහිව අවලාද හා බොරු පැතිරවීමට පාලක කණ්ඩායම් දරන ප්‍රයත්නයත් ජ.වි.පෙ. මුහුණ දෙන අභියෝග වේ. එහෙත් ඒවා ජයගත හැකි අභියෝගයන්ය.

මේ ඡන්දයේ හොඳම අවස්ථාව හිමිව තිබෙන්නේ, ඡන්ද දායකයන්ටය. තම කොට්ඨාසයට හොඳ නියෝජිතයෙක් පත්කර ගැනීමට, තම සභාව හොඳම කණ්ඩායමකට බාරදීමට, දැන් ඔවුන්ට අවස්ථාව තිබේ. ඒ, මෙතෙක් බලය හෙබවූ කණ්ඩායම් දුර්වලව ජ.වි.පෙ. සවිමත්ව මෙවර පැමිණ තිබෙන නිසාය. දේශපාලනයේ මතුව තිබෙන මෙම වාසිදායක අවස්ථාව ජයග්‍රාහී නව දේශපාලන ගමනක් වෙනුවෙන් යොදාගැනීමට ජනතාව අදිටන්කර ගන්නේ නම් හා මෙම අවස්ථාව අත්නොහැර අත්පත්කර ගැනීමට ජ.වි.පෙ. සමත් වන්නේ නම් ඉතිහාසයේ ගමන්මඟ ස්ථිර ලෙසම වෙනස් වනු ඇත.



"සාමාන්‍ය නිද්‍රාශීලී ජීවිතයේදී ජනතාව අවුරුද්දකින් උගෙන ගන්නවාට වඩා දෑ විප්ලවයක් අතරතුර එක් සතියකදී ඔවුහු උගෙන ගනිති.එසේ වන්නේ, මුළු ජනතාවගේම ජීවිතයේ තියුණු වෙනස්වීමක අවස්ථාවේදී, ජනතාවගේ විවිධ පංති අනුගමනය කරන අරමුණුද, ඒවාට ඇති ශක්තියද, ඒවා උපයෝගී කරගන්නා ක්‍රමද, ඉතාමත් පැහැදිලි වන හෙයිනි."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05 වැනි වෙළුම**
**198 පිටුව**

# ආදර්ශයක් වූ ජ.වි.පෙ. ආචාර ධර්ම පද්ධතිය



වසර දෙකකට අධික කාලයක් කල් දමා තිබූ පළාත් පාලන මැතිවරණය පැවත්වීමට ආසන්නව තිබියදී ආණ්ඩුව විසින් එය නැවත් වතාවක් කල් දැමීමට කළ උත්සහය ආපසු හැරවීමට ජ.වි.පෙ. ප්‍රමුඛ ප්‍රගතිශීලී බලවේගයන්ට හැකි වීම ජනතාවගේ ජයග්‍රහණයක් විය.

කෙසේ වුවද මැතිවරණයට දින නියම වීමත් සමග එ.ජා.ප., ශ්‍රීල.නි.ප. හා ජී.එල්.ගේ පක්ෂය වැනි ධනපති පක්ෂවල සාමාජිකයෝ සුපුරුදු පරිදි තම තමන්ට ලැබෙන වරදාන හා වරප්‍රසාදවලට අනුව පක්ෂ හා කණ්ඩායම් අතර හුවමාරු වූහ. ඔවුන් එසේ කටයුතු කරමින් සිටියදී ජ.වි.පෙ පමණක් පක්ෂයක් ලෙස සමාජයේ පිළිගැනීමට ලක් වූ පුද්ගලයින්ට, උගතුන්ට, බුද්ධිමතුන්ටද අවස්ථාව සලසා දෙමින් පළාත් පාලන සටන් බිම දූෂණයට එරෙහි සටන් බිමක් බවට පත්කරගනිමින් සටන් වැදී සිටී.

එසේම පසුගිය දෙසැම්බර 17වැනිදා කොළඹ සුගතදාස ගෘහස්ථ ක්‍රීඩාංගණයේදී 'ගම ගොඩ නගන දූෂණය පරදන ජවය' යන තේමාව යටතේ පළාත් පාලන අපේක්ෂකයන්ගේ ජාතික මහා සමුළුවක් ජ.වි.පෙ. විසින් අති උත්කර්ශවත්ව පවත්වන ලදී. එහි විශේෂත්වය වූයේ එහිදි පළාත් පාලක අපේක්ෂකයන් සඳහා වන කරුණු 12කින් සමන්විත ආචාර ධර්ම පද්ධතියක් පළමුවරට ඉදිරිපත් කිරීමය. සියලුම පළාත් පාලන අපේක්ෂකයෝ එම වගන්ති කියවා එයට එකඟ බවට ප්‍රතිඥා ලබාදුන්නෝය. තමන් ප්‍රධාන යැයි කියාගන්නා ප්‍රධාන දූෂිත පක්ෂද පසුව ජ.වි.පෙ. අනුකරණය කරමින් දූෂණ විරෝධී ප්‍රතිඥා දෙනු දැකගත හැකි වීමෙන් එම සමුළුව කෙතරම් බලපෑමක් වන්නට ඇත්දැයි සිතා ගත හැකිය.

මෙම අවස්ථාවට ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා ඇතුළු දේශපාලන මණ්ඩලයේ සහ මධ්‍යම කාරක සභාවේ සහෝදරුවරුද එයට අමතරව පූජ්‍ය පක්ෂය, කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, ඇතුළු විද්වත් වෘත්තිකයෝ රැසක්ද සහභාගි වූහ.

# විද්වතුන්ගෙන් පිරි නාම යෝජනා ජ.වි.පෙ.න්

මෙවරද නාම යෝජනා බාර දීමේදී නොයෙක් අක්‍රමිකතා සිදුවූ බවට එ.ජා.ප. , ශ්‍රීල.නි.ප. හා ජී.එල්.ගේ පක්ෂයට චෝදනා එල්ල වී තිබේ. එය කෙරතරම් දුර ගියේදයත් මහින්ද රාජපක්ෂගේ පොහොට්ටු පක්ෂයේ නියෝජිතයෙකු තම නම ලැයිස්තුවට ඇතුලත් කිරීම සඳහා ලිංගික අල්ලස් ඉල්ලූ බවට එක් නිළියක මැතිවරණ කොමිසන් සභාවට පැමිණිලි කරමින් මැතිවරණ කොමිසන් සභාව ඉදිරිපිට උපවාසයකද නිරත වූවාය. එමෙන්ම නම ගිය පාතාල කල්ලිවල පුද්ගලයින් මෙන්ම මත් ද්‍රව්‍ය සහ වෙනත් දූෂණ චෝදනාවලට ලක් වූ පුද්ගලයින්ද මෙම පක්ෂවලින් තරග වැද සිටින බව මේ වන විටත් තහවුරු වී අවසානය.

එ.ජා.ප. , ශ්‍රිල.නි.ප. හා ජී.එල්.ගේ පක්ෂවලින් මෙසේ අපරාධකරුවන්, වංචා දූෂණවලට චෝදනා ලැබූවන් මෙන්ම ස්ත්‍රී දූෂකයන්ද තම නියෝජිතයින් ලෙස ඉදිරිපත් කරද්දී වෛද්‍ය රනිල් ජයසේන වැනි රට පිළිගත් වෛද්‍යවරුන් මෙන්ම කලාකරුවන්, විශ්වවිද්‍යාල ආචාර්යවරුන්, විද්වත් වෘත්තිකයින් ආදීන් රැසක් තම තරග ලැයිස්තුවලට ඇතුලත් කිරීමට ජ.වි.පෙ සමත් විය.

මෙවන් වටපිටාවක් තුළ පසුගිය දෙසැම්බර් මස 21වනිදා කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේදී



කොළඹ දිස්ත්‍රික්කයේ පළාත් පාලන ආයතනවලට අදාළ නාම යෝජනා විශාල ජනතා ප්‍රතිචාරයක් මැද ජ.වි.පෙ. විසින් බාර දෙන ලදී.

# ජ.වි.පෙ. අනුරාධපුර දිනන රැලිය




වේලාසන අවදි වූ පමණින් ඉර පායන්නේ නැති වුවද ඉර පායන විට වේලාසනින් අවදිවී සිටීම වැදගත් වනු ඇතැයි ජ.වි.පෙ. නිර්මාර්තෘ රෝහණ විජේවීර සහෝදරයා පැවසූ ආකාරයට අනෙක් පක්ෂ නාම යෝජනා සඳහා අපේක්ෂකයන් සොයා ගැනීමට ඒමේ අත දුවමින් සිටියදී. ජ.වි.පෙ. වංචා, දූෂණ චෝදනාවලින් තොර ග්‍රාමීය නායකයින් සූදානම් කරමින් සැමට කලින් මැතිවරණ ව්‍යාපාරයට අවතීර්ණ විය. දෙසැම්බර් 17වැනිදා පළාත් පාලන අපේක්ෂකයන්ගේ ජාතික මහා සමුළු පවත්වා රට පුරා දිස්ත්‍රින් මට්ටමින් යෝධ ජන රැලි පවත්වමින් උතුරු නැගෙනහිර ඇතුළු සියලු පළාත් ආවරණය කරමින් ජ.වි.පෙ. මැතිවරණ ව්‍යාපාරය තුළ සක්‍රීයව සිටී.

ජ.වි.පෙ. නායක අනුර දිසානායක, ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා, ප්‍රචාරක ලේකම් විජිත හේරත්, දේශපාලන මණ්ඩල සභිකයින් වන ලාල් කාන්ත, බිමල් රත්නායක, සුනිල් හඳුන්නෙත්ති යන සහෝදරවරු ඇතුළු ජාතික මට්ටමේ නායක නායිකාවෝ රැසක් මෙම මැතිවරණ ප්‍රචාරක කටයුතු සඳහා සහාභාගි වී සිටිති.

මෙම ප්‍රචාරක වැඩපිළිවෙළේ එක් ප්‍රධාන රැලියක් පසුගිය දෙසැම්බර් 27වැනිදා අනුරාධපුර කඩ පනහ ප්‍රදේශයේදී පැවැත්වුණි. අනුර දිසානායක, ලාල් කාන්ත සහ වසන්ත සමරසිංහ යන සහෝදරවරුන් ඇතුළු එම දිස්ත්‍රික්කයේ පළාත් පාලන අපේක්ෂකයන්ගේ ප්‍රධානත්වයෙන්ද අති විශාල ජනතාවගේ සහභාගිත්වයෙන්ද මෙම රැලිය පැවැත්වුණි.

# අයවැය හෙණ ගැන ජ.වි.පෙ. කියයි

රාජ්‍ය, පෞද්ගලික හා වතු යන ක්ෂේත්‍ර නියෝජනය කරමින් ක්‍රියාත්මක වන ජ.වි.පෙ. සමිති මෙරට වෘත්තීය සමිති ව්‍යාපාරය තුළ තීරණාත්මක සාධකයක් බවට පත්ව අවසන්ය. මෑතකදී සිදුවූ ඛනිජ තෙල් වර්ජනය, සයිටම් අර්බුදය ආදී වෘත්තීය ඉල්ලීම්වලින් ඔබ්බට ගිය ජාතික මට්ටමවේ අරගල සඳහාද ජ.වි.පෙ. වෘත්තීය සමිති ව්‍යාපාරය තම පූර්ණ සහයෝගය ලබාදුනි. රනිල් - මෛත්‍රී ආණ්ඩුව 2018 සඳහා ගෙනා අයවැය යෝජනාවලිය තුළින් වැඩ කරන ජනතාවගේ ඉල්ලීම් නොසලකා හැර ඇති බවට ජ.වි.පෙ. වෘත්තීය සමිති විසින් ආණ්ඩුවට බරපතළ ලෙස චෝදනා කර තිබිණි.

පසුගිය දෙසැම්බර් මස 05වැනිදාද ජ.වි.පෙ.ට අනුබද්ධ පෞද්ගලික අංශයේ ප්‍රධානම වෘත්තීය සමිතිය වන අන්තර් සමාගම් සේවක සංගමය යහපාලන ආණ්ඩුවේ 2018 අයවැය යෝජනාවලිය තුලින් පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන්ගේ අයිතිවාසිකම් සුරක්ෂිත වී නැති බව පවසමින් එයට එරෙහිව ඔවුන් දැනුවත් කිරීමේ වැඩපිළිවෙළෙහි පළමු අදියර කොළඹ දී ආරම්භ කරන ලදී.

"වැඩ කරන ජනතා හිස මත වැටෙන අයවැය හෙණ ගෙඩි" යන තේමාව යටතේ දෙසැම්බර් 05වැනිදා කොළඹ මහජන පුස්තකාල ශ්‍රවණාගාරයේදී පැවති මෙම දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණය අන්තර් සමාගම් සේවක සංගමයේ සභාපති වසන්ත සමරසිංහ, ලේකම් නීතීඥ ජානක අධිකාරි යන සහෝදරවරුන්ගේ ප්‍රධානත්වයෙන් සහ පෞද්ගලික අංශයේ සේවක සේවිකාවන් රාශියකගේ සහභාගිත්වයෙන් පැවැත්විණි.



# කෘමි සම්බාධකයට යටත් වූ ශ්‍රී ලංකා ආර්ථිකයේ වසරක්!

පසුගියදා රුසියාවේදී හමුවූ කෘමියෙකු ලංකාවේ ආර්ථිකයට සම්බාධක පැනවීය. 2017 වසර අවසන් කරන මොහොතේ ලංකා ආර්ථිකයේ මතු වූ සුවිශේෂී සිදුවීම මෙම කෘමි සම්බාධකයයි. කෘමි සම්බාධකයට ආසන්න සිදුවීම වූයේ රුසියාව විසින් ලංකාවෙන් ආනයනය කරනු ලැබූ තේ තොගයක් තුළ හඳුනා නොගත් කෘමියෙකු සිටීමයි. කෘමියෙකු නිසා රුසියාව ඍජු තීරණයක් ගෙන ලංකාවේ තේ මිලදී ගැනීම නතර කළේය. ලංකවේ තේ අපනයනයෙන් 28%ක්ම යවනු ලබන්නේ රුසියාවටය. රුසියාවේ තේ අවශ්‍යතාවයේ ප්‍රධාන ගැනුම්කරුවා ශ්‍රී ලංකාවය. නමුත් රුසියාව තමන්ගේ රටේ ජනතාවගේ තේ පරිභෝජනය ගැන දෙවරක් නොසිතා ලංකාවේ තේ වෙළඳපොළට සම්බාධකයක් පැනවීය.

ලංකාවට තේ සඳහා කෘමි සම්බාධකයක් පැනවූ විගස ලංකාව් ඇණූ සිවියකටත් වඩා සියුම් වී ඇති ආර්ථිකයේ හදවතටම එම ප්‍රහාරය වැදුණි. ප්‍රහාරයේ තරම කොතරම්ද යත් රටේ ජනාධිපතිවරයාම ඍජුව ප්‍රතිචාර දක්වමින්, තේ තොගයේ සිටි කෘමියා ගැන වග විභාගයකින් තොරව, පරිසරයට අහිතකර බව කියමින් රුසියාවෙන් ගෙන්වන ඇස්බැස්ටස් වෙත 2018 සිට පැනවීමට සූදානම් කර තිබූ තහනම ඉවත් කර ගත්තේය. පසුව රුසියාවද තම කෘමි සම්බාධකය ඉවත් කර ගන්නා ලදී. කෘමි සම්බාධකයේ ආසන්න හේතුව මිනිසුන්ට පිළිකා ඇති වීමට බලපෑමක් කරන බවට හඳුනා ගෙන තිබූ ඇස්බැස්ටස් ගෙන්වීම නතර කිරීමට ගෙන තිබූ තීරණය බව දැන් පැහැදිලිව හෙළිදරව් වී තිබේ.

මෙම කෘමි සම්බාධකය සරල සිදුවීමක් ලෙස බැහැර කරනු වෙනුවට ලංකාව මේ මොහොතේ මුහුණ දී ඇති දැවැන්ත ආර්ථික අර්බුදය තේරුම් ගැනීමේ කැඩපතක් ලෙස භාවිත කළ හැකිය.

පසුගියදා ලංකාවේ අග්‍රාමාත්‍යවරයාත් තවත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරයෙකු වන ජෝන් අමරතුංගත් ප්‍රකාශ කළේ එළවළු මිල අධික නිසා එළවළු පිටරටින් ගෙන්වන බවය. පොල් මිල ඉහළ නම් පොල්ද පිටරටින් ගෙන්වන බවය. තවත් මිල ඉහළ යන යමක් වේනම් ඒවා සියල්ල පිටරටින් ගෙන්වන බවය. ඒ මොහොතේ පොල්, එළවළු, පිටරටින් ගෙන්වීමට සල්ලි ගේන්නේ කොහොන්දැයි අසන්නට ධෛර්ය ඇති කෙනෙක් ළඟ පාතක සිටියේ නැත.

එසේම දැන් එ.ජා.ප.ය සාම්ප්‍රදායිකව වන්දනාමාන කළ ධනේශ්වර කඳවුරේ ආර්ථික අර්බුදය හේතුවෙන් ඔවුන්ට ජනතාවට මැජික් පෙන්වීම සඳහාවත් මුදලක් ඉල්ලා ගත හැකි තැනක්ද මේ වන විට නැත. ඔවුනට සිදුවී ඇත්තේ වඳින්න ගිය දේවාලය හිසේ කඩා වැටීමය. ඔවුන් මහත් සේ වෙහෙසවී රටේ ජනතාව වෙනුවෙන් දිනා දුන්නේයැයි පාරම්බෑ ජී.එස්.පී. පලස් තීරු බදු සහනය දෙසැම්බර් 31 දිනෙන් අවසන් කිරීමට ඩොනල්ඩ් ට්‍රම්ප් පියවර ගෙන තිබේ. දැන් රටට එහි බලපෑම අල්පයැයි විලිලැජ්ජාවකින් තොරව කියන්නේද ඔවුන්මය. රටේ ජනතාව මේ විගඩම් බලා සිටිය යුතුව තිබේ.




ආර්ථිකයේ අර්බුදය ඉහ උඩින් ගලා ගියත් වත්මන් ධනපති නායකයින් ඒ අර්බුදය අර්ථ දක්වා ගන්නේ තමන්ගේ ජයග්‍රහණයක් ලෙසටය. ගතවූ වර්ෂය (2017) එවැනි වහසි බස් වලින් පිරී ගිය නමුත් සැබැවින්ම රට අර්බුදයේ ගිලී ගිය වසරක්ම විය. 2015/2016 වසර බැඳුම්කර වංචාව නිසා රටේ ආර්ථිකයේ පොලී අනුපාත දෙතුන් ගුණයකින් ඉහළ ගියේය. බැඳුම්කර තමන්ගේ ප්‍රශ්නයක් නොව එය මහා බැංකුවේ ප්‍රශ්නයක් ලෙස අපේ ග්‍රාමීය අහිංසක ජනතාව සරලව තේරුම් කර ගෙන සිටියහ. එහෙත් ඔවුන් තම කණකර උකස් කර ණය ලබා ගන්නේ 7% හා, 8% වැනි පොලියකට නම් ඔවුන්ට යළි එම ණය පියවීමට වසරක් තුළ පමණක් 15% - 16% තරමේ පොලී අනුපාත ගෙවීමට සිදුවිය. ඒ, වසරක පොලී අනුපාත ඉහළ යාම ග්‍රාමීය - නාගරික, උගත් - නූගත්, දුප්පත් - පොහොසත් භේදයකින් තොරව සියලුම ජනතාවට බැරවූ ආකාරයයි; මහා බැංකු බැඳුම්කර වංචාව තමන්ට අදාළ නොවේ යැයි සිතූ ජනතාවටද අර්බුදය ගලා ගිය ආකාරයයි.

## පදනම දෙදරීම

ආර්ථික ක්‍රමවේදය සමාජවාදී වේවා, ධනවාදී වේවා ඕනෑම රටක ආර්ථිකයේ පදනම නිෂ්පාදනයයි. ආර්ථිකයකට අලුතින් වටිනාකමක් එකතු කරන්නේ නිෂ්පාදන ක්‍රියාවලිය තුළින් පමණි. ඒ අනුව ආර්ථිකය කොතරම් වේගයකින් අර්බුදයට ගමන් කරන්නේද? නැතහොත් අර්බුදය පියමං කරන්නේද යන්න තේරුම් ගත හැකිය. පසුගිය දශකයක කාලය තුළ මෙන්ම ගතවූ වසර තුළත් සුපුරුදු පරිදි සිදු වී ඇත්තේ, ආර්ථිකයේ පදනම දෙදරා යාමය. එනම් නිෂ්පාදන ක්‍රියාවලිය කඩා වැටීමය. 2015 හා සැසඳීමේදී තේ නිෂ්පාදනය 11%කින් හා වී නිෂ්පාදනය 8.3%කින් මෙට්‍රික් ටොන් මිලියන 44ක් දක්වා කඩා වැටුණි. රබර් නිෂ්පාදනයද සුළු අපනයන බෝග වගාවද එලෙසම කඩා වැටුණි. වී වගාවේ කඩා වැටීම කොතරම් දරුණු වීද යත් වී වගාවේ යෙදුණු ගොවියාට ප්‍රධාන කන්න 4ක් එකදිගට වගාකිරීමට නොහැකි විය. ගොවීන්ට වගා කර ගැනීමට නොහැකි වීම නිසා වගා වන්දි ඉල්ලා උද්ඝෝෂණය කිරීමට සිදුවිය.

තේ කර්මාන්තය මෑත ඉතිහාසයේ නිෂ්පාදනය පහළ වැටීමකට ලක්වූවත් යම් ප්‍රමාණයකට තේ මිල ස්ථාවර වීම විසින් තේ ගොවියා මහපාරට වැටීම වැළැක්වීය. නමුත් වගා එලදාව අඩුවීම නිසා ඔවුන්ටද අර්බුදයක් විය. මෙලෙස මුළු ආර්ථික දේහයම පැවැත්මේ අර්බුදයකට ලක්ව ඇති මොහොතක 'කෘමියකු' වුවත් ඉතා හානිකර විය හැකිය. විය හැකි ලෙසම සිදු වූයේද එයමය.

නායකයින් වහසි බස් දොඩමින් මැතිවරණ වේදිකා දෙදරුම් කැව්වද රටින් පොල්, එළවළු හෝ මොන දේ ගේන්නත් විදේශ විනිමය අවශ්‍යය. ගතවූ වසරද ආණ්ඩුව නොගෙවා ඇති ණය කන්දට අලුතින් ණය ගොඩක් එකතු වසරක් මිස අන් අලුත් ප්‍රතිඵලයක් ගෙනා වසරක් නොවේ. 2017 වසර ආණ්ඩුවේ අමාරුකමට එකම පිළිසරණ වූයේ 2017 ජුලි 29 දින චීනය සමග අත්සන් කළ හම්බන්තොට වරාය චීනයට විකිණීමේ ගනුදෙනුවය. එයින් චීනයට ගෙවිය යුතු ණයට හිලව්වට ඩොලර් මිලියන 1400ක් ආණ්ඩුවට ලැබුණි. ඒ වෙනුවට ලංකාවට අවුරුදු 99කට හම්බන්තොට වරාය අහිමි විය. 2017 වසර ආණ්ඩුව හුස්ම ගත්තේ හම්බන්තොට වරාය විකිණීමෙනි.

> නායකයින් වහසි බස් දොඩමින් මැතිවරණ වේදිකා දෙදරුම් කැව්වද රටින් පොල්, එළවළු හෝ මොන දේ ගේන්නත් විදේශ විනිමය අවශ්‍යය. ගතවූ වසරද ආණ්ඩුව නොගෙවා ඇති ණය කන්දට අලුතින් ණය ගොඩක් එකතු වසරක් මිස අන් අලුත් ප්‍රතිඵලයක් ගෙනා වසරක් නොවේ.

## වරාය විකිණීමේ පාඩුව

භාණ්ඩයක් විකුණන විට විකුණුම්කරු ඒ භාණ්ඩයේ විකුණන වටිනාකම වැඩිකර පෙන්වා ගැනීමට බොහෝ දේ එකතු කර ගැනුම්කරුවා රවටා ගැනීම ධනවාදී වෙළදාමේ සරලම උපක්‍රමයකි. අප හම්බන්තොට වරාය විකිණීමට සපුරා එරෙහිය. එහෙත් අඩු තරමේ හම්බන්තොට වරාය චීනයට විකිණීම මෙම ධනපති නායකයින් විසින් සිදුකර ඇත්තේ ඒ සරල උපක්‍රමවත් අනුගමනය නොකරමිනි. 2017 ජුලි මාසයේ විකිණීම අවසන් කිරීමෙන් පසු විකිණීමේ ඇමති වන මලික් සමරවික්‍රම 2017 දෙසැම්බර් 07 අංක 2048/32 දරන අති විශේෂ ගැසට් පත්‍රය අත්සන් තබමින් විකිණීම අවසන් කළ චීන වරාය ලබා ගත් සමාගමට තවත් අති විශේෂ බදු වරදාන පිරිනමන ලදී. ඒ අනුව වරාය ලබා ගත් චීන සමාගමින් අවුරුදු 25කට ලංකාව දේශීය ආදායම් පනතේ අදාළ ආදායම බදු අය කරනු නොලැබේ. එසේම එම බදු සහන කාලය ආරම්භ වන්නේද ගිවිසුම බලාත්මක වන දින සිට වසර 07කට පසුවය. එනම් බදු නිදහස් මුළු වසර ප්‍රමාණය අවුරුදු 32කි. ලංකාවේ තකතීරු ආණ්ඩුවක්, චීනයට හම්බන්තොට වරාය විකුණා පළමු රුපියලක හෝ ආදායම බද්දක් ලබා ගනු ලබන්නේ තවත් වසර 32කට පසුවය. (එනම්, මුළු බදු කාල සීමාවෙන් 1/3ක් ගෙවුණු පසුවය.) එපමණක් නොවේ. ලාභාංශ මත බද්ද අවුරුදු 25කට නිදහස්ය. රැඳවුම් බදු, උපයනවිට බදු, එකතු කළ අගය මත බදු, (VAT) වරාය ගුවන්තොටුපළ සංවර්ධන බදු, නිෂ්පාදන බදු, ජාතිය ගොඩනැගීමේ බදු, (NBT) වසර 07කට සම්පූර්ණයෙන්ම නිදහස්ය. මේ සියල්ල කුඩා සිල්ලර කඩ ව්‍යාපාරිකයාටද ඔහු ලාංකිකයකු නම් අදාළ ඒවාය. හම්බන්තොට වරාය කටයුතු මෙහෙයුම් කරන විටදී චීන සමාගමට නිදහස් සියලු බදු ශ්‍රී ලංකා රජයේ වරාය අධිකාරියට අදාළය. මේ සියලු සහන ලබා දෙනු ලැබුවේ 2017 වසර ගෙවා ගැනීමට චීනය ලංකාවේ දුබල දුර්වල මියැදෙමින් තිබෙන ධනපති ක්‍රමයටත්, ක්‍රමය පවත්වා ගෙන යාම ධනපති ආණ්ඩුවටත් කරන ලද උපකාරයට කෘතගුණ සැලකීමටය.

## 'ප්‍රතිලාභ' ප්‍රතිඵලය

ගතවූ වසර ආර්ථික විනාශය වෙනුවෙන් පරිසර පද්ධතිය බිලිදීමේ ප්‍රතිවිපාක විඳි වර්ෂයකි. එනම් 2017 වසරේදී ගංවතුරින් හානි වූ ජීවිත ගණන 206කි. විපතට පත් පවුල් 316,511 කි. අතුරුදහන් වූ 92කි. පූර්ණ හානි වූ නිවාස 1713 කි. 2017 වසරේදී මීතොටමුල්ල කුණු කන්දට පමණක් බිලි වූ ජීවිත ගණන 31කි. විවිධ විපත්වලට මුහුණ දුන් ජනතාව 15,32,529ක් බව ආණ්ඩුවේ වාර්තාම කියයි. ඩෙංගු ව්‍යසනය නිසා 2017 වසරේදී රට පුරා, වාර්තා වූ රෝගීන් ගණන 180,939කි. සිදුවූ මරණ ගණන 401කි. ලංකාව ලබා ගත් ආර්ථික පරිහානියේ ප්‍රතිඵල අතර ආසියාවේ මන්දපෝෂණයෙන් පෙළෙන රටවල් අතුරින් පාකිස්තානයද පරදවා 03වැනි ස්ථානය ලබා ගත්තේ 2012

15 වැනි පිටුවට



"මාක්ස්වාදය අරාජිකවාදයට වඩා වෙනස්ය. එය සාමාන්‍ය වශයෙන් විප්ලවවාදී අවදියකදී රාජ්‍යයක් හා රාජ්‍ය බලය තිබීමේ අවශ්‍යතාවය, විශේෂයෙන්ම ධනපති ක්‍රමයේ සිට සමාජවාදයට පරිවර්තනය වීමේ කාල පරිච්ඡේදයේදී එය තිබීමේ අවශ්‍යතාවය පිළිගන්නේය."

**ලෙනින්**
**තෝරාගත් කෘති,**
**05වැනි වෙළුම,**
**46 පිටුව**

# පළාත් පාලන බලය ජ.වි.පෙ.ට ලැබීම
# අනාගත පරම්පරාව ගොඩනැගීමේ අත්තිවාරමයි



ජනතා විමුක්ති පෙරමුණේ නායක
**අනුර දිසානායක සහෝදරයා**

අද අපි මේ ඡන්දයට මුහුණ දෙන්නේ 2012 වසරේදී පාර්ලිමේන්තුවේ සම්මත කරගත් ඉතාම විකෘති ඡන්ද ක්‍රමය යටතේ නොවෙයි. බහුපක්ෂ දේශපාලනය මුළුමනින්ම අකුළා දමා ද්විපක්ෂ දේශපාලනයකට දොරටු විවෘත කරන විකෘති ක්‍රමයක් තිබුණේ. 2017 සැප්තැම්බර් මාසයේදී ඒ ඡන්ද ක්‍රමය වෙනස් කොට, ජනතාවට හිතවාදී මැතිවරණ ක්‍රමයක් ඇතිකර ගන්න ජනතා විමුක්ති පෙරමුණ දැවැන්ත කාර්ය භාරයක් ඉටුකළා. ඒ ජයග්‍රහණයත් සමග ප්‍රජාතන්ත්‍රවාදී ලෙස ජනතාවට තමන්ගේ නියෝජිතයා තෝරා පත්කර ගැනීමේ අරමුණට පටහැණිව යම් දේශපාලන කඳවුරකට බලය තහවුරු කර ගැනීමේ සීමා නිර්ණයකුත් තිබුණා. මේ තත්වයන් වෙනස්කර ගන්න අභියාචනා කොමිෂන් සභාවක් මගින් අපිට හැකි වුණා. ඒ අභියාචනා කොමිෂන් සභාවේ සභාපති හැටියට කටයුතු කළ අශෝක පීරිස් මැතිතුමාත් ඒ කොමිෂන් සභාවේ සාමාජිකයෙකු ලෙස කටයුතු කළ නීතිඥ උපුල් කුමරප්පෙරුම මැතිතුමාත් මේ සමුළුවට සහභාගි වී ඉන්නවා. මේ වගේ ජයග්‍රහණ එක්කයි මේ මැතිවරණයට අපි එකතු වෙලා ඉන්නේ.

මෛත්‍රීපාල සිරිසේන ජනාධිපතිවරයාගේ කණ්ඩායම මැතිවරණය කල් දාගන්න අධිකරණ ක්‍රියාමාර්ගවලට ගිය බව අපි දන්නවා. ඉන් දවස් තුනකට පස්සේ එතුමා පාර්ලිමේන්තුවට ආවා. එනකොට අපි කතාකරමින් සිටියා. එදා අපි එතුමාට බල කරලා, අභියෝග කරලා, කිව්වා ඔයාගේ චක්ගෝලයන්ට කියලා මේ නඩුව ඉල්ලා අස්කර ගන්න කියලා. ඡන්දය කල් දාන්න පවරා තිබුණු නඩුව සතියක් යනකොට ඉල්ලා අස්කර ගත්තා. ජනතා විමුක්ති පෙරමුණ මෙම මැතිවරණයට අවතීර්ණ වෙන්නේ, ඡන්දය කල්දාන්න ආණ්ඩුව විවිධ උපක්‍රම අනුගමනය කළ වෙලාවක, ඒ සියලු කුමන්ත්‍රණ පරාජය කළ ජයග්‍රහණයත් එක්කයි. පළාත් පාලන මැතිවරණය කියන්නේ ජනතාවගේ ගම්වල තිබෙන ප්‍රශ්න විසඳා ගන්න නියෝජිතයන් පත්කර ගන්නා මැතිවරණයයි. නමුත් පසුගිය කාලය පුරාම, හොරුන්ගේ දූෂිතයන්ගේ සහ දාමරිකයන්ගේ ගුහාවක් බවට ප්‍රාදේශීය සභා පත්කරගෙන තිබුණා.

ඒ නිසා, අද අපිට වගකීමක් පැවරී තිබෙනවා. දූෂිතයන්ගේ, පාදඩයන්ගේ, සල්ලාලයන්ගේ තිප්පොළවල් බවට පත්වී තිබෙන, මේ ප්‍රාදේශීය සභා ජනතාවගේ නියෝජිත ආයතන බවට පත්කිරීමට. ඒ අභියෝගය සහ වගකීම ජනතා විමුක්ති පෙරමුණේ ඔබ අප හැමට තිබෙනවා. අපි ඒ කාර්ය භාරය ඉටුකළ යුතුව තිබෙනවා. ඒ ඇයි? ඉහළ ඉන්න ජාතික මට්ටමේ වංචනිකයන්ගේ, දූෂිතයන්ගේ පාලනයේ ආරක්ෂාව වෙනුවෙන් ප්‍රාදේශීය සභා යාන්ත්‍රණය ගොඩනගා තිබෙනවා. ඇමතිගේ ඡන්දයට වැඩකරන්න, ඇමතිගේ කොන්ත්‍රාත් එක කරලා දෙන, පහළ යාන්ත්‍රණයේ වංචනිකයන්ගේ, දූෂිතයන්ගේ, සල්ලාලයන්ගේ තැනක් බවට පත්කරගෙන තිබෙනවා. ගම්බිම් පිටින් ජනතාව බියට පත්කරමින් තිබෙනවා. දැරියන් දූෂණයට පත්කරනවා. මේ අය ක්‍රියා කළේ වනසරාලා වගේ. ඔවුන් විරාජමානව වැජඹුණා. මේ ප්‍රාදේශීය සභා මගින් හැදෙන යාන්ත්‍රණය ඉහළ බල අධිකාරය ශක්තිමත් කර තිබෙනවා. ඒ නිසා මේ **පළාත් පාලන මැතිවරණයේදී ඉහළ පාලන පාදඩ යාන්ත්‍රණය ගම් මට්ටමින් බිඳවට්ටා දුර්වල කොට, ජනතා විමුක්ති පෙරමුණේ යාන්ත්‍රණය ජයග්‍රහණය කොට, ශක්තිමත් මට්ටමින් ඔසවා තැබිය යුතුයි. ඉහළ පාදඩයන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ බලය ශක්තිමත් කළ පහළම තැනින් එය බිඳ දැමීම ආරම්භ කළ යුතුයි.**

දැන් අප ඉදිරියේ තියෙන පළාත් පාලන මැතිවරණය ආණ්ඩුව යොදා ගන්නේ කවර අරමුණකින්ද? යන්න අප සලකා බැලිය යුතුයි. රටේ සියලු සම්පත් විකුණා දමමින් දැනට ඉතිරිවී තිබෙන නිෂ්පාදන කර්මාන්ත පද්ධතිය බිඳ දමා ගෙන යන

> මේ පළාත් පාලන මැතිවරණයේදී ඉහළ පාලන පාදඩ යාන්ත්‍රණය ගම් මට්ටමින් බිඳවට්ටා දුර්වල කොට, ජනතා විමුක්ති පෙරමුණේ යාන්ත්‍රණය ජයග්‍රහණය කොට, ශක්තිමත් මට්ටමින් ඔසවා තැබිය යුතුයි. ඉහළ පාදඩයන්ගේ ආරක්ෂාව, රැකවරණය සහ බලය ශක්තිමත් කළ පහළම තැනින් එය බිඳ දැමීම ආරම්භ කළ යුතුයි.

විනාශකාරී ආර්ථික ප්‍රතිපත්තිය ගෙවී ගිය අවුරුදු දෙකහමාර ඇතුළත අවශ්‍ය පරිදි වේගවත් කර ගන්න බැරිවී තිබෙනවා. මේ පළාත් පාලන මැතිවරණයේදී ආණ්ඩුව ලබන කවර හෝ ජයග්‍රහණයක් තිබුණහොත් ඔවුන්ට තිබෙන යම් බාධාකාරී සීමාවන් ඉවත්කර ගන්න ඒක ලයිසන් එකක් හැටියට ඒක පාවිච්චි කරනවා. රනිල් වික්‍රමසිංහලාගේ, මලික් සමරවික්‍රමලාගේ මේ විනාශකාරී ආර්ථික ගමන පරාජයට පත්කරන්න නම්, එළඹෙන පළාත් පාලන මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය අනිවාර්ය ලෙස පරාජයට පත් කළ යුතුයි. එනිසා එය පරාජයට පත්කිරීමේ අභියෝගය අපිට තිබෙනවා. එය පරාජයට පත්කරන්නත් වරායේ, තෙල් සංස්ථාවේ, පුල්මුඩේ ඛනිජ වැලි නිධියේ සේවකයන්ට සටන් කරන්න ශක්තියක් ලැබෙන්නේ මේ මැතිවරණයෙන් විනාශකාරී ආර්ථිකයට ජනතාවගේ අනුමැතියක් නැති බව ඔප්පු කිරීමෙන් විතරයි. ගම්වල මැතිවරණයට තරග කරන අපේක්ෂක, අපේක්ෂිකාවන් හැටියට ඔබ වෙත පැවරී තිබෙන්නේ ඒ අභියෝගය ජය ගැනීමයි.

එක පැත්තකින් රනිල් වික්‍රමසිංහගේ කණ්ඩායමත්, අනික් පැත්තෙන් මහින්ද රාජපක්ෂ නායකයා නොවන ජී.ඇල්. පීරිස් නායකයා වන පොදුජන පෙරමුණත්, මෛත්‍රීපාල සිරිසේන මහත්මයාගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් මේ මැතිවරණයට ඉදිරිපත්වී තිබෙනවා. මේ පාර්ශ්ව තුනම අපිට එරෙහිව මැතිවරණ භූමියේ ඉන්නවා. මේ අය එකම කඳවුරක කොටස් තුනක් බව තේරුම් ගන්න ඕනෑ. කඳවුරු තුනක් නොවෙයි. හරියට තල් රායි, පොල් රායි, කිතුල් රායි වගේ. තුනම තාල වර්ගයේ ගස්. තුනටම මුදුන් මුලක් නැහැ. හැබැයි මේ ගස් තුනේ කොළ එකිනෙකට වෙනස්. ඒ වගේ තමයි එකම කඳවුරක මේ කණ්ඩායම් තුනත්. මේ මැතිවරණයේදී තමන් ළඟ තියෙන ආණ්ඩු බලය ගමේ සංවර්ධනයේදී යොදවන්න තමන්ට ඡන්දය දෙන්න කියලා රනිල් වික්‍රමසිංහ කියනවා. මේ කතාව බොරුවක්. ඇඹිලිපිටියේ ගමකින් ලියුමක් එවල තිබුණා, ඒ ගමට යන්න පාලමක් හදලා දෙන්න කියලා. මාර්ග සංවර්ධන අධිකාරියට මම ඒ ලිපිය යොමු කළා. ඒ නිලධාරීන් ගමට පාලම හදල දුන්නා. අපි ඒ දේ කළේ ආණ්ඩු බලය තිබිලා නොවෙයි. රාජ්‍ය ආයතනවල නිලධාරීන් පවා දැන් තේරුම්ගෙන තිබෙනවා ජනතා විමුක්ති පෙරමුණ යම් ඉල්ලීමක් කරන්නේ, තමන්ගේ පෞද්ගලික අරමුණු වෙනුවෙන් නොවන බව. ප්‍රාදේශීය සභාවල අපිට ලබාදෙන බලය තුළින් මෙන්න මේ වගේ ජනතාවගේ ප්‍රශ්න විසඳන්න පුළුවන්.

මහින්ද රාජපක්ෂ කියන්නේ රට බෙදීම වළක්වන්න තමන්ට ඡන්දය දෙන්න කියලයි. මේක රටේ ඉරණම තීරණය කරන ඡන්දය කියලා ඔවුන් දිගින් දිගටම කියනවා. රට බෙදන එක වළක්වන්න ජී. එල්.ගේ පක්ෂයට ඡන්දය දෙන්න කියන එකයි ඔවුන්ට ඉතිරිවී තිබෙන්නේ. බොරු දේශප්‍රේමීත්වය මේ ඡන්දයේදීත් පාවිච්චි කරනවා. මාතෘ භූමිය පිළිබඳවත්, රටේ ජනතාව පිළිබඳවත් ඔවුන්ට තියෙන්නේ ව්‍යාජ රඟපෑමක් විතරයි. ජනතා විමුක්ති පෙරමුණේ ඉන්නේ සිංහල, දෙමළ, මුස්ලිම් ජන කොට්ඨාසයන් තුනේම සම අයිතීන් වෙනුවෙන් පෙනී සිටින ජාතිකත්ව වශයෙන් නොබෙදී සිටිය යුතු රට බෙදීමට විරුද්ධ ස්ථාවරයකයි. ඊටත් වඩා වැඩි බරකින් අපේ රටේ ජාතිවාදයටත් විරුද්ධයි. ජාතික අසමානතාවයටත් ඒ වගේම විරුද්ධයි. ජාතික සමගිය වෙනුවෙන් හැම ජන කොට්ඨාසයකම සම අයිතිය වෙනුවෙන් එකමුතු වී සටන් කරන, මේ රටේ එකම දේශපාලන ව්‍යාපාරය ජනතා විමුක්ති පෙරමුණ පමණයි. අනික් පැත්තෙන් මෛත්‍රීපාල සිරිසේන ***15 වැනි පිටුවට***

# ජ.වි.පෙ. පළාත් පාල
# ජාතික ම

දෙසැම්බර් 17 සුගතදාස







# මානව ගරුත්වය පිළි
# ගමෙන් ආරම්භ කළ
# ජ.වි.පෙ.ට පමණි

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ
සිංහල අධ්‍යයන අංශයේ මහාචාර්ය
**ලියනගේ අමරකීර්ති මහතා**

මේ රටේ ජනතාව වැදගත් තීන්දුවක් 2015 ජනවාරි 8 වෙනිදා ගත්ත බව අපි දන්නවා. ඒ තීන්දුව ගන්න සහභාගි වූ අයෙක් ලෙස වගේම ජනතාවට කරුණු ඉදිරිපත් කළ අයෙක් ලෙස මෙවැනි අවස්ථාවක සුබ පැතුම් එක්කිරීමට ලැබීම විශේෂත්වයක්. ජනවාරි 08වැනිදා මේ රටේ ජනතාව ගත් තීන්දුව පරමාදර්ශයක් කිරීමට හැකි එකම බලවේගය ජනතා විමුක්ති පෙරමුණ බවට පත්වී සිටිනවා. ජනවාරි 08වැනිදා ගත් ජනතා තීන්දුව වඩාත් ඵලදායී අර්ථයෙන් මේ රටේ භාවිතයට නැගීම ගැන තීන්දුව ගත යුතුව තිබුණේ 2015 අගෝස්තු 17වැනිදා මහා මැතිවරණයෙන්. ඒ අවස්ථාවේදී මම පෞද්ගලිකව ජනතාවට අවධාරණය කළේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුන් දහයක් හෝ පහළොවක් පාර්ලිමේන්තුවට යවන්න කියන ඉල්ලීම කරමින්. නමුත් ඒක එහෙම වූයේ නැති බව අපි දන්නවා.

මේ රටේ හරවත් දේශපාලනයක් කරන ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරු එවැනි පිරිසක් පාර්ලිමේන්තුවේ සිටියා නම්, ජනතාව වෙනුවෙන් කළ හැකිව තිබුණු වැඩකොටස ගැන ඔබට පැහැදිලි කරන්න අවශ්‍ය නැහැ. මේ රටේ සමස්ත ජනතාව වෙනුවෙන් ඔවුන්ගේ ඡන්දයට හරවත් යමක් කිරීමේ හැකියාව තිබෙන එකම පිරිස ඉන්නේ ඔබේ පක්ෂයට බව දැන් කවුරුත් පිළිගන්නවා. විශ්වවිද්‍යාල ආචාර්යවරුන් ලෙස අපි ශිෂ්‍යයන්ට ඉතිහාසය උගන්වනවා. ඒවගේම ඉතිහාසය ලියනවා. මම මේ කරුණු ටික කියන්නේ මේ රටේ ඉන්න මධ්‍යම පාන්තික උගතුන් ටිකටයි. අපිට යුතුකමක් තියෙනවා ඉතිහාසය උගන්වන වගේම ඉතිහාසය ලියන අය හැටියට මේ රටේ සැබෑ ඉතිහාසය නිර්මාණය කරන මිනිසුන් එක්ක එකතුවීමේ සුවිශාල කාර්යභාරයේ

කොටස්ක
වෙන්න. ඒක
වඩා වගකීමක
වෙනුවෙන්
ඉටුකිරීමේ කැප
ජනතා විමුක්
පමණයි ක
පැහැදිලියි. ඒ
දශක දෙකක
තුළ මේ රටේ
උගතුන් ජන
පෙරමුණ ව
වෙමින් සිටි
ගමේ බලය
කාර්ය භාරය
පැවරීමේ කටයු
විශේෂ වගකීමක
මතක් කරන්න
ජනවාරි
වෙනස්කම කිරී
හොරුන් දූෂිත
නැති බව අපිට
ඒ අතර එක දෙය
කළ යුතු බව
ැනීමක් තිබෙ
08වැනිදා ල
පිටුපස තිබු
අගයන් පිළිබඳ
පිළිබඳවත් වග
අඩුම තරමින් ත

# ...ලන අපේක්ෂකයින්ගේ ...හ සමුළුව

...ගෘහස්ත ක්‍රීඩාංගණයේදී







# ...ළිබඳව දේශපාලනය ... හැක්කේ ...යි



...රුවෙකු ... යුතුකමකට ...ත්. ජනතාව ... වගකීම් ...වීම තිබෙන්නේ ...ති පෙරමුණට ...කියන එක ... නිසා පසුගිය ... පමණ කාලය ...මධ්‍යම පාන්තික ...නතා විමුක්ති ...වා එක්රොක් ...නවා වගේම ... ගොඩනැගීමේ ... මේ පක්ෂයට ...ත්ත වෙනුවෙන් ...ක් තිබෙන බවත් ...කැමතියි.

... 08වැනිදා ...මෙන් මේ රටේ ...යන් අල්ලන්නේ ... පැහැදිලි වුණා. ...යක් විශේෂයෙන් ...කාගේත් පිළිග...නවා. ජනවාරි ...බාදුන් බලය ...ණේ මානුෂීය ...වත් ශිෂ්ටත්වය ...කීම් ඉටුකිරීමයි. ...ජුඩීන් ඝාතනය ගැන පරීක්ෂණ පවත්වා ගෞරවනීය මරණ සහතිකයක් දීමේ යුතුකමක් සහ වගකීමක් පාලකයන්ට තිබුණා. ඒ වගේම පෝද්දල ජයන්තගේ අත පය කඩාදැමීම පිළිබඳව සොයා බලා ඒ වගකිව යුත්තන්ට නීතියෙන් දඬුවම් කිරීමේ වගකීමක් තිබුණා. නමුත් ඒ මානව ගෞරවනීයත්වයත් ඡන්දදායකයාට ප්‍රතිලාභයක් ලෙස මේ දක්වා ලබාදී නැහැ. දැන් ඒ ගෞරවය ලබාදීමේ වගකීම පිළිබඳ සටන් පාඨය අපට තිබෙන අතර, එය කළ හැක්කේ ජනතා විමුක්ති පෙරමුණට පමණක් බව පැහැදිලි වෙමින් තිබෙනවා. එවැනි හරවත් ශිෂ්ටත්වයක් පිළිබඳව මානව ගරුත්වය පිළිබඳව දේශපාලනය, අපි ගමෙන් පටන්ගත යුතුව තිබෙනවා.

පළාත් පාලන මැතිවරණයට නාම යෝජනා ඉදිරිපත්කර තිබෙන අනික් ප්‍රධාන පක්ෂ දෙක නැත්නම් දෙක හමාරේ අපේක්ෂක ලැයිස්තුවලින් එන්නේ මහා හොරුන්ගේ දූ පුතුන් හෝ ඥාතීන් බව පැහැදිලි වී තිබෙනවා. එසේ නොවන ශ්‍රී ලාංකික ජාතිය නියෝජනය කරන්න පුළුවන් දූ පුතුන් ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණේ ලැයිස්තුවල විතරයි. එළඹෙන පළාත් පාලන මැතිවරණයේදී ගෞරවනීය මිනිසුන්ගේ, ශිෂ්ටාචාරවත් මිනිසුන්ගේ හෘදයේ සාක්ෂිය විනිවිද ගමන් කිරීමේ අභියෝගය ජනතා විමුක්ති පෙරමුණට පැවරී තිබෙනවා. ඒ ගමන් කිරීමයි මේ ආරම්භ කර තිබෙන්නේ. ජනතාවට මානව ගෞරවය ලබාදෙන, ශිෂ්ටාචාරත්වය ලබාදෙන මේ ගමනට සියලු ශක්තිය සහ ධෛර්යය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. සුබ පතනවා.

# ජ.වි.පෙ. ගෞරවනීය දේශපාලන සංස්කෘතිය රටට අවශ්‍යයි



ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන ලේකම්

**ටිල්වින් සිල්වා සහෝදරයා**

ඔබ අපි කවුරුත් දන්නවා පළාත් පාලන මැතිවරණය වසර දෙකකට වැඩිය ප්‍රමාදයක් තිබුණු බව. අපි දැවැන්ත සටනක් ජයගෙන අලුත් මැතිවරණ ක්‍රමයක් යටතේ මනාප පොරය නැති කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් තෝරාගත හැකි අපේ රටේ ජනගහනයෙන් 51%ක් වන කාන්තා දේශපාලන නියෝජනය වැඩි ක්‍රමයක් යටතේ මේ මැතිවරණය එන්නේ. ජනතා විමුක්ති පෙරමුණේ අපි ප්‍රතිපත්තිමය දේශපාලනයකට අන්කවරදාත් වගේම මුලපුරා තිබෙනවා. මේ පවතින පාදඩ දේශපාලන සංස්කෘතිය වෙනස් කරලා හෘදය සාක්ෂියක් තිබෙන මානවවාදී දේශපාලන සංස්කෘතියක් මේ රටේ ගොඩනඟන්න මැදිහත් වෙන්නේ මේ රැස්වෙලා ඉන්න ආදරණීය අපේක්ෂක අපේක්ෂිකාවන්.

මේ රටේ පාලන බලය හොබවපු පක්ෂ දෙකේම අය නැවත ජනතාවගේ ඡන්දය ඉල්ලන්නේ අවුරුදු හතරක් යැපෙන්න හොඳ රස්සාවක් හදාගන්න. ලොකු දීමනාවක් නැති වුණාට, ලැබෙන දේශපාලන බලය පාවිච්චි කරලා ලොකු ධනස්කන්ධයක් උපයාගන්න පුළුවන් නිසා. මේ වගේ දේශපාලන සංස්කෘතියක් තුළ ජනතා විමුක්ති පෙරමුණේ අපි පුවත්පත් දැන්වීමක් පළ කළා. මේ මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ යටතේ අපේක්ෂකයන් වශයෙන් කැමති අය ඉදිරිපත් වෙන්න කියලා. අපි එහෙම කළේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයෙත් එක්සත් ජාතික පක්ෂයෙත් ඉන්න රට ගැන හැඟීමක් තියෙන කැපවීමෙන් රට ගොඩනඟන්න අපේක්ෂාවක් තියෙන ප්‍රතිපත්තිගරුක මිනිසුන් වෙනුවෙන් අපේ පක්ෂයෙන් ඉඩ ලබාදෙන්නයි. මේ සමුළුවේදී අපේක්ෂක අපේක්ෂිකාවෝ හැමදෙනාම ඒ බවට දිවුරා පොරොන්දු වුණා.

අපි මේ මැතිවරණයට එන්නේ රට පුරාම පළාත් පාලන ආයතනවලට අපේක්ෂක අපේක්ෂිකාවෝ ඉදිරිපත් කළ ජයග්‍රාහී පසුබිමක. පළාත් පාලන මැතිවරණයකට යාපනය, කිලිනොච්චිය, මුලතිව් වගේ දිස්ත්‍රික්කවලින් අපේ පක්ෂයෙන් අපේක්ෂකයන් ඉදිරිපත් කළ පළමුවෙනි අවස්ථාව මේක. ඒක ජනතා විමුක්ති පෙරමුණ විදිහට ලබාගත් විශාල ජයග්‍රහණයක්. අපේ පක්ෂයේ ගෞරවණීය දේශපාලන සංස්කෘතිය රටට අවශ්‍යයි. එය ජයග්‍රහණය කරා ගෙනයන්න ඉන්නේ මෙතනට රැස්වෙලා ඉන්න ඔබ සැමදෙනායි. මේ දක්වා අපේ රටේ මැතිවරණ සිතියම හැදුවේ බලයේ සිටින පාලක පක්ෂයයි. මේ මැතිවරණය ජනතාවගේ ජයග්‍රහණය වෙනුවෙන් වඩාත් හරවත් ආකාරයෙන් දිනාගන්නට අනුර කුමාර සහෝදරයා ඇතුළු අපේ පක්ෂයේ මන්ත්‍රී සහෝදරවරු සමත් වුණා. අද මෛත්‍රීපාල සිරිසේන මහත්තයා ඡන්දයට එන්නේ නාවන්න බල්ලන් ගෙනියනවා වාගේ. ඡන්දය කල්දාන්න යටිකුට්ටු ආකාරයට පෙත්සම් ඉදිරිපත් කළා. ඒ පෙත්සම් ඉවර වෙනවාත් එක්කම මහින්ද රාජපක්ෂ මහත්තයාගේ කණ්ඩායමත් තවත් විදිහකින් පෙත්සම් ඉදිරිපත් කළා. ඒ වගේම එක්සත් ජාතික පක්ෂයත් අනුන් තුළ හැංගිලා ඡන්දය කල්දාන්න කැමැත්තෙන් සිටියේ. ඒ සියලු තත්වයන් දැන් පරාජය කරනු ලැබ තිබෙනවා.

මේ මැතිවරණයට විශ්වාසයෙන් ඉදිරිපත් වෙන එකම පක්ෂය ජනතා විමුක්ති පෙරමුණ පමණයි. ජනතාවගේ පැත්තෙන් ඉල්ලා හිටිය මනාප පොරය නැති කොට්ඨාසයට වගකියන මන්ත්‍රීවරයෙක් සහිත අවම වශයෙන් කාන්තා නියෝජනය 25%ක් සක්‍රීයව දේශපාලනයට සම්බන්ධවන අලුත් තත්වයක් තුළ අපි මේ මැතිවරණයට මුහුණ දෙනවා. මේ නිසා ඡන්ද කල්දැමීමේ කුමන්ත්‍රණ පරාජයට පත්කර, සටන් කිරීමෙන් ලබාගත් ඡන්දයේ ප්‍රතිඵල ජනතාවට වාසිදායක ආකාරයට ලබාගත හැකි වන්නේ ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයන් වැඩි පිරිසක් මහජන නියෝජිතයන් වශයෙන් පත්කර ගත්තොත් පමණයි. මේ වන විට අප ඉදිරියේ තියෙන ප්‍රධාන අභියෝගයත් ඒකයි. කොට්ඨාස වගේම පළාත් පාලන ආයතන රැසක බලය බිම් මට්ටමෙන් ලබාදීමෙන් ජනතාවට වැඩි ජයග්‍රහණ ලබාගන්න පුළුවන්. පල්වෙලා ගඳ ගහන, වංචා - දූෂණ පිරුණු, මත්ද්‍රව්‍යවලට ලොල් බවක් දක්වන ජාවාරම්කාරයන්, හොරෙන් වැලි ගොඩ දාන්නන්, වගේ අයගෙන් හොර ගුහාවක් වූ මේ ආයතනය මහජන මිත්‍රශීලී ආයතන බවට පත්කරන්න ඕනෑ. පහුගිය හැත්තෑවසර පුරා වගේම විශේෂයෙන් 1977න් පස්සේ පාදඩකරණය කළ දේශපාලනය මේ රටේ අස්සක් මුල්ලක් නැර පැතිරුණා. මේ තත්වය වෙනස් කරන්න දේශපාලනඥයා මහජන මිත්‍රශීලී මහජන සේවකයෙකු කරන්න ඕනෑ. එයට මුල පුරන්න හොඳම තැන පළාත් පාලන ආයතනයි.

> ජනතා විමුක්ති පෙරමුණේ අපි බෙදන්නේ, බඩු නෙවෙයි. ජනතාව දැනුවත් කරන අදහස්. බඩු බෙදන ඒවා ටික දවසකින් විනාශ වෙලා ඉවර වෙනවා. අපි බෙදන අදහස් මිනිසුන්ගේ හදවත්වල සදාකාලිකව පවතිනවා. සමාජය ගොඩනඟන්න ජනතාව පෙළගස්වන්න ඕනෑ බඩුවලින් නොවෙයි. අදහස්, මතවාද, ප්‍රතිපත්ති සහ ආදර්ශවලින්.


මේ දක්වා එක්සත් ජාතික පක්ෂයේ හෝ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ දේශපාලනය තුළ සිටි අවංක ක්‍රියාකාරිකයන් රැසක් ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයන් විදිහට ඇවිත් තියෙනවා. ඔවුන් ඇවිත් තිබෙන්නේ විවිධ දුෂ්කරතා දරාගන්න, වැඩියෙන් කැපකිරීම් කරන්න, පඩි නැතිව වැඩකරන්න විතරක් නොවෙයි, බැණුම් අහන්නත් බලාගෙනයි. අවලාද අපහාස අහන්නත් බලාගෙනයි. මේ හැමදෙනාම ජනතාව අතරට යන්නේ, ජනතා විමුක්ති පෙරමුණේ ගම ගොඩනඟන වැඩපිළිවෙළක් සහිත අපේක්ෂකයන් හැටියටයි. ඒ වෙනුවෙන් තමන්ගේ තිබෙන කැපවීම, ප්‍රතිඥාවකින් ප්‍රකාශ කළා. ගම ගොඩනැඟීමේ වැඩපිළිවෙළ මේ බිමේ යථාර්ථයක් කරන්න ඉන්නේ ජනතා විමුක්ති පෙරමුණ විතරයි. අපි සතුරාව පරාජය කරන්න ඕනෑ, ඡන්දයෙන් විතරක් නොවෙයි; දේශපාලන වශයෙනුත් පරද්දන්න ඕනෑ. දේශපාලන වශයෙන් පරාජය කළ හැක්කේ ආදර්ශ දීමෙන්. දුෂ්කරතා විඳදරා ගනිමින් කැපකිරීමෙන්. මහජනතාවගේ පොදු අරමුණු වෙනුවෙන් පෞද්ගලික ජීවිතයේ සුබ විහරණය, කැපකිරීමෙන් විතරයි. ජනතා විමුක්ති පෙරමුණ ඒ පොදු අරමුණු වෙනුවෙන් දිවිපුදා ගොඩනඟාගත් පක්ෂයක්.

අපේ පක්ෂයේ කැපකිරීම් කළේ, බිම් මට්ටමේ ක්‍රියාකාරිකයන් විතරක් නොවෙයි. මහජන නියෝජිතයා සත්‍ය වශයෙන්ම ජනතා සේවකයෙක් බව තහවුරු කළේ, 1981 දිස්ත්‍රික් සංවර්ධන සභාවලදී මන්ත්‍රීවරුන් 13දෙනෙකු තේරී පත්වූ අවස්ථාවේ ඉඳලයි. එදා අපේ පක්ෂයෙන් මන්ත්‍රීවරුන් සඳහා ප්‍රතිපත්තියක් හැදුවා. තමන්ට ලැබෙන දීමනාව පෞද්ගලිකව පරිහරණය නොකළ යුතු බවට. 1994 මුල්වරට හම්බන්තොට දිස්ත්‍රික්කයේ ජනතාව, අපේ පක්ෂයට පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයක් ලබාදුන්නා. එදා ඉඳලා අද දක්වාම නිහාල් ගලප්පත්ති සහෝදරයා ඒ ගෞරවනීය ආදර්ශය රටට ලබාදෙමින් සිටිනවා. 1997 පළාත් පාලන මැතිවරණයෙන් මන්ත්‍රී ධුර 101 ක් ලබාගත්තා. පළාත් සභාවලින් මන්ත්‍රී ධුර 24ක් ලැබුණා. ඒ ඔස්සේ ජනතා විමුක්ති පෙරමුණේ මහජන මන්ත්‍රී අරමුදල වැඩි වුණා. මන්ත්‍රී වැටුප් හා දීමනා විතරක් නොවෙයි කාර්ය මණ්ඩල වැටුප් හා දීමනාත් මේ අරමුදලට එකතු වුණා. අපි මුලින්ම මේ අරමුදල යොදවලා හම්බන්තොට දිස්ත්‍රික්කයෙන් විශ්වවිද්‍යාලයට තේරී පත්වුණු ආර්ථික දුෂ්කරතා තියෙන ශිෂ්‍යයන් පිරිසකට ආධාර ලබාදුන්නා. මම මේ ඉතිහාසය මතක් කරන්නේ අපේ අපේක්ෂකයන් වශයෙන් පක්ෂයට එකතු වුණු අලුත් සහෝදර සහෝදරියන්ගේ දැනගැනීමටයි. මන්ත්‍රී අරමුදල යොදවලා කුරුණෑගල දුෂ්කර විදුහලක පුස්තකාලයක් සංවර්ධනය කර දුන්නා. අපි ඒක නම් කළේ සුමිත් අතුකෝරල පුස්තකාලය කියලයි. ඒ වගේම අද වගේ පරිගණක පහසුකම් නොතිබුණු 2000ට ඉස්සෙල්ලා කාලයේ රට පුරා විශ්ව පරිගණක මධ්‍යස්ථාන පහක් පටන් ගත්තා. නොමිලයේ පරිගණක පුහුණු ලබාදුන්නා. මන්ත්‍රී වැටුප් නොගෙන ඒ වගේම කාර්ය මණ්ඩලවල වැටුප් නොගෙන මහජනතාව වෙනුවෙන් ***15 වැනි පිටුවට***

# අලුත් ලෙස සිතන වසරකට...

2018 නව වසර ආරම්භ වී ඇත්තේම පළාත් පාලන මැතිවරණ උණුසුමත් සමඟය. ඒ, පෙබරවාරි 10 වන දිනට පැවැත්වීමට නියමිත පළාත් පාලන මැතිවරණය හේතුවෙනි. එය කරුණු කිහිපයක් නිසා කලින් පැවැති මැතිවරණවලට වඩා සුවිශේෂී වේ. මෙම මැතිවරණයේ සිට පළාත් පාලන ආයතනයන්හි කාන්තා නියෝජනය 25%ක් වීම එක් සුවිශේෂී කරුණකි.

අඩුලුහුඩුකම් මධ්‍යයේ වුවද කාන්තා නියෝජනය යම් ප්‍රමාණයකින් හෝ ඉහළ දැමීම වෙනුවෙන් පියවර ගැනීම හොඳ දෙයකි. අපේ රටේ ජනගහනයෙන් 51%ක් කාන්තාවන්ය. එසේම අපේ රටේ ආර්ථිකයට කාන්තාවන්ගේ දායකත්වයද විශාලය. ලංකාවේ තවමත් ආදායම් ලැබෙන ක්‍රම දෙස බැලීමෙන් මෙය තේරුම් ගත හැක. අප රටට ආදායම් ලබා



දෙන එක් කර්මාන්තයක් වන්නේ තේ නිෂ්පාදනයය. එහි වැඩිම දායකත්වය කාන්තාවන් ගෙනි. මන්ද දළු නෙලන්නේ කාන්තාවන් වන නිසාය. රබර් නිෂ්පාදනයේදී කිරි කපන වැඩි දෙනා කාන්තාවන්ය. ඇඟලුම් කර්මාන්තයේ සාතිශය බහුතරය කාන්තාවන්ය. විදේශ රැකියා සේවයේදී මැදපෙරදිග කාන්තා දායකත්වය විශාලය. එසේම අධ්‍යාපනය තුළ ගුරුවරියන් ලෙස, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ හෙදියන් හා වෛද්‍යවරියන් ලෙස කාන්තාව දක්වන දායකත්වය විශාලය. එහෙත් දේශපාලන පක්ෂ තුළ, ව්‍යවස්ථාදායකය තුළ, මහජන නියෝජිත ආයතන තුළ කාන්තාවන්ගේ නියෝජනය ඇත්තේ ඉතාම පහළ මට්ටමක වීම ඉතා ඛේදජනකය.

අපේ රටේ පවතින ධනපති දේශපාලන පක්ෂවල ක්‍රියාපටිපාටියද සාමාන්‍ය කාන්තාවන් දේශපාලනයට පිවිසීම වැළැක්වීමට යම් රුකුලක් වී ඇත. එවැනි පක්ෂයක දේශපාලනය කිරීමට නම් දේශපාලන පවුල් පසුබිමක් සහිත නැතහොත් ධනය හෝ බලය සහිත තැනැත්තියක විය යුතුය. බොහෝ ධනපති දේශපාලන පක්ෂ කාන්තාවන් යොදා ගන්නේ බලය ලබා ගැනීමේ මෙවලම් වශයෙනි. ඒ සඳහා විවිධ පොරොන්දු ලබාදෙමින්ද ඉන් ඔබ්බට ගොස් විවිධ අල්ලස් ලබාදෙමින්ද අපේ රටේ කාන්තාවන් රැවටූ වාර කොතෙක් නම් ඇත්ද?

ධනපති දේශපාලන පක්ෂවල වංචාව, දූෂණය, අල්ලස ජාති ලක්ෂණය වී ඇති විටෙක ජනතාව රැවටීමෙන්, මුලා කිරීමෙන් තොර දේශපාලනයක් ඔවුන්ට නැත. මෙවර එක් මහ නගර සභාවක් සඳහා නාමයෝජනා සකස් කිරීමේදීත් අපේක්ෂකත්වය ලබාදීම සඳහා ලිංගික අල්ලස් ලබා ගැනීමට උත්සාහ කල අවස්ථාවක් පසුගියදා මාධ්‍යයන්හි කතාබහට ලක්ව තිබිණි.

මෙවැනි තත්වයක් තුළ ධනපති දේශපාලන පක්ෂ තුළින් පත් කර ගන්නා මන්ත්‍රීවරුන් හා මන්ත්‍රීවරියන් දූෂණයට වංචාවට එරෙහිව හඬ නගාවි යැයි සිතීමම මුලාවකි. එවැනි දේශපාලන පක්ෂවල මන්ත්‍රීවරියන් ඔලුගෙඩි ගණනින් වැඩි වුවද ඔවුන් ගෙන් අලුත් දේශපාලන ගමනක් බලාපොරොත්තු විය නොහැකිය.

අපේ රටේ අගමැතිවරියක් හා ජනාධිපතිවරියක් පාලන බලය හෙබවූවත් ඔවුන්ගේ පාලන කාලය තුළ රටේ කාන්තාවන් ආර්ථික, දේශපාලන, සමාජීය වශයෙන් සවිබල ගැන්වෙන ආකාරයේ කිසිදු වැඩපිළිවෙළක් ක්‍රියාත්මක වූයේ නැත. පාර්ලිමේන්තුව නියෝජනය කළ, කරන ඇතැම් මන්ත්‍රීවරියන් කාන්තා කටයුතු පිළිබඳ ඇමති ධුර දැරුවද අපේ රටේ කාන්තාවන්ගේ අභිවෘද්ධිය වෙනුවෙන් ගත්තා යැයි කිව හැකි කිසිදු තීන්දු තීරණයක් හෝ ක්‍රියාමාර්ගයක් නොමැත.

එවැනි තත්වයක් තුළ අවංක හැඟීමකින් දේශපාලනයට පිවිසීමට සිතන කාන්තාවන් තමන් දේශපාලනය කරන්නට තෝරා ගන්නා පක්ෂය ගැන නැවත වරක් සිතා බැලිය යුතුය. එසේම ඡන්දදායකයින් අපේක්ෂිකාවන් තෝරා ගැනීමේදීද ඔවුන් නියෝජනය කරන්නේ කවර දේශපාලන පක්ෂයක් දැයි සොයා බැලීමද අවශ්‍යය. එම දේශපාලන පක්ෂවල ප්‍රතිපත්තීන් පිළිබඳව මෙන්ම ඒවායේ වත්මන් ක්‍රියාකාරිත්වය පිළිබඳවද සලකා බැලිය යුතුය. එසේ නැතහොත් ධනපති දේශපාලන මඩ ගොහොරුවේ ගිලී යන තවත් එක් කාන්තා ඔළුගෙඩියක් වෙනවා හැරෙන්නට අන් කිසිවක් සිදුවන්නේ නැත.

කාන්තා ඡන්දදායිකාවන් ලෙස මෙවර මැතිවරණයේදී බුද්ධිමත් තීරණයක් ගැනීමට අප තවත් පමා විය යුතුද? රැල්ලට, ඔලුගෙඩි වැඩි දේශපාලනය තුළ සිරවෙමින් අප ගත් තීන්දු තීරණවල නරක ප්‍රතිඵල, හෙට දවසේ ඉපදෙන්නට පෙරුම් පුරනා නූපන් දරු පරම්පරාවන්ටද මේ වනවිට උරුම කරදී හමාරය. ඉදින්, අප තවදුරටත් මංමුලා වෙමින් අපේ දරු පරම්පරාවන්ද අඳුරු අගාධයන්ට ඇඳ දැමීම කොතැනින් හෝ නතර කළ යුතු නොවේද?

එසේම ගොඩනැගුණු නව මැතිවරණ ක්‍රමයේ උපරිම ඵල නෙළා ගැනීමට කටයුතු කළ යුතුව තිබේ. හුදු කාන්තා ඔළුගෙඩි ගණනක් වැඩි කිරීම වෙනුවට ජනතාව ගැන සිතන, ජනතාව වෙනුවෙන් කැපවීමට සූදානම් කාන්තාවන්ගෙන් එම 25% ඉඩ පිරවිය යුතුව ඇත. ඒ සඳහා රටට, ජනතාවට ආදරය කරන, දූෂණයට වංචාවට එරෙහිව කටයුතු කරන, පෞද්ගලික ප්‍රතිලාභ බලාපොරොත්තු නොවෙමින් ජනතාවට සේවය කරන දේශපාලන පක්ෂයක් සමඟ අත්වැල් බැඳ ගනිමින් කටයුතු කිරීමට ලාංකේය කාන්තා පරපුරට ධෛර්යය ලැබේවායි මේ නව වසරේදී අපි ප්‍රාර්ථනා කරමු.

## බලන් සුබ නිමිති...

අඳුරු මේ කුළු පහව යන
අලුත් එළියක මඟ ලකුණු දැක
ඉතින් හිනැහෙන්, ඇහි පියන් යට
ගොඩ ගැසුණු කඳුළු බර අතහැර

දොර දොර නැවුම් වෙන
මුව මුව සිනා කැන්දන
දනන් නින්දෙන් මුදනු කැමතිව
ඇසෙයි දසතින් සීනු නාදය


හිවල් සැණකෙළි නිමකර
කොවුල් කූජනය ළඟ එන
බලන්, සුබ නිමිති පෙරටුව
වෙනස් වසරක්ය මේ එළැඹෙන

සියලු දොස් දුරුවෙන
තුන්කල් පෙනෙන නුවණින
අලුත් ලිප් ගල් බැඳ
ඉතින් අවුලමු කිරි බතට ලිප



## සිව්දෙසින්

### හිංසනයට එරෙහිව හඬ නගන විරාලි මෝදි...



මහ මඟ සහ පොදු ප්‍රවාහන සේවාවලදී ස්ත්‍රීන් ලිංගික හිංසනයට ලක්වීමට එරෙහිව ඉන්දියාවේ ආබාධිත තරුණියක් වන විරාලි මෝදි හඬ නගමින් සිටියි.

ඉන්දියානු දුම්රියක් වෙත ඇතුල්වීමට දුම්රිය සේවකයන්ගේ සහාය පැතූ අවස්ථාවේ තමා ලිංගික හිංසනයට ලක් වූ බව ඇය පවසයි. එම සිදුවීමට මුහුණ දුන් පසුව ඇය විසින් ආබාධිත ස්ත්‍රීන්ගේ ආරක්ෂාව සහ ඔවුන් සඳහා වන පහසුකම් වෙනුවෙන් වූ ව්‍යාපාරයක් ආරම්භ කරනු ලැබ තිබේ.

### වැටුප් අසමානතාව දිගටම...



ලෝකයේ වැඩ බිම් තුළ කාන්තාවන් හා පිරිමින් අතර ඇති අසමානතාවය අවසන් වීමට ධනවාදයට තවත් ශතවර්ෂ දෙකකට වැඩි කාලයක් ගතවනු ඇති බව නවතම පර්යේෂණයකින් හෙළි වී ඇත.

ලෝක ආර්ථික සංසදය විසින් ඉදිරිපත් කළ වාර්තාවක දැක්වෙන්නේ, වැටුප් අසමානතාවය හා රැකියා සඳහා වූ සමාන අවස්ථා නොලැබීම තවත් වසර 217ක කාලයක් පවතිනු ඇති බවය. තවද, ඔවුන් පවසන්නේ සෞඛ්‍යය, අධ්‍යාපනය හා දේශපාලන සහභාගිත්වය වැනි ක්ෂේත්‍ර තුළ ලිංගික අසමානතාවය අවසන් වීමට වසර 100ක පමණ කාලයක් ගතවනු ඇති බවය.

දැනුම, සමාජය හා චින්තනය 24


# ප්‍රචාරණය හා පරිභෝජන වහල්භාවය



"ද්‍රව්‍යමය ජීවනයේ නිෂ්පාදන ක්‍රමය විසින් සමාජමය දේශපාලනමය හා චෛතසික ජීවනයේ ක්‍රියාදාමයන් පොදු වශයෙන් හැඩගස්වනු ලැබේ. මිනිසුන්ගේ සත්තාව නීර්ණාය කෙරෙන්නේ ඔවුන්ගේ විඥානය විසින් නොවේ. ඊට ප්‍රතිකූල වශයෙන් ඔවුන්ගේ විඥාණය නීර්ණාය කෙරෙන්නේ ඔවුන්ගේ සමාජ සත්තාව විසිනි "

**ලෙනින්**
**තෝරාගත් කෘති**
**01 වැනි වෙළුම**
**20-21 පිටු**

අධිරාජ්‍යවාදීන් වර්තමානයේ ලෝකයේ සමාජ චින්තනය පාලනය කරන්නේ හා හසුරුවන්නේ ප්‍රවෘත්ති ආයතන (News Agency) හා දැවැන්ත ජනමාධ්‍ය ආයතන මගින්ම පමණක් නොවේ. දැවැන්ත ඒකාධිකාරී චිත්‍රපට නිෂ්පාදන සමාගම්, රූපවාහිනී වැඩසටහන් නිපදවන දැවැන්ත සමාගම් මගින්ද මෙම කාර්ය කරයි. එහිදී රූපවාහිනී සමාගම් සුවිශේෂීය. මන්ද තම අරමුණු හා මතවාද සෑම නිවසකම මැද සාලයටම ගෙනවිත් නිවැසියන්ගේ ඔලු කුහර තුළට පහසුවෙන් ඇතුල් කිරීමට එමගින් අධිරාජ්‍යවාදීන්ටත්, ප්‍රාග්ධන හිමියන්ටත්, වෙළඳුන්ටත් පහසුකම ලැබෙන නිසාය.



### 'රියලිටි ෂෝ' හා ආත්ම ගෞරවය

වර්තමානයේ ලොව පුරාම රූපවාහිනිය තුළ ඉතාම ජනප්‍රිය වැඩ සටහන් බවට පත්ව ඇත්තේ 'රියලිටි ෂෝ' ලෙස හඳුන්වන සජීවී වැඩසටහන්ය. මේවා අපේ රටේද පවතින අතර ඒ සියල්ල බටහිරින් හා ඉන්දියාවෙන් කොපි කරන ඒවාය. බටහිර රටවලදී හා ඉන්දියාවේදී පවා මේවා විවිධ පරාස තුළ පැතිර පවතී. ප්‍රසිද්ධ පුද්ගලයන් ගෙන්වා ඔවුන්ගේ ජීවන වතගොත කථාකරමින් ඔවුන් අනුකරණය කිරීමට, ඔවුන් ලෙස තම ජීවිතය ගොඩනගා ගැනීම ජීවිතයේ 'අරමුණ' බවට පත්කිරීමට ඔවුන්ට වන්දනාමාන කිරීමට නරඹන්නන් පොළඹවන වැඩසටහන් රැසක් තිබේ. ඊට අමතරව විවිධ වැඩසටහන් හා තරග පවත්වා බහුජාතික සමාගම්වල අනුග්‍රහයෙන් 'තෑගි' ලබාදෙන වැඩසටහන්ද තිබේ. ඒවාට වැඩිපුර සම්බන්ධකර ගන්නේ කාන්තාවන්ය. නැතිනම් ළමුන්ය (කාන්තාවන්ද සමග). එසේම විවිධ හැකියාවන් පෙන්වීමට දෙනවායයි කියන සංගීත, නැටුම් ඇතුළු විවිධ ක්‍රියාකාරකම් සහිත 'තරු' (Star) තෝරන වැඩසටහන්ද තිබේ. මෙම 'තරු' වැඩසටහන් ලංකාවේද තිබේ. මේ සියල්ල මගින් සැබැවින්ම කරන්නේ, 'තරු' තේරීම හෝ යමෙක් 'තරුවක්' බවට පත්කිරීම නොව, ජනතාව මෝහනය කොට තබාගෙන 'කෙටි පණිවිඩ' සඳහාද ජනතාවගේ සාක්කුවට විද, වෙළඳ දැන්වීම් මගින් කෝටි ගණන් උපයමින් ජනතාවට 'තරු' පෙන්වීමය. ලංකාවේ මෙම 'තරු' ගණනාවකට අනවසරයෙන් අනුන්ගේ ගීත ගැයීම නිසා නඩුද වැටී ඇත.

මෙහි බරපතළ කරුණ වන්නේ, මෙම වැඩසටහන්වලදී මානව ගරුත්වය බිඳ දමා මිනිසුන් රටක් ඉදිරියේ දුර්වලයන් බවට හෝ පරිභෝජන භාණ්ඩ වන්දනාමාන කරන 'හිඟන්නන්' බවට පත්කිරීමය. බටහිර රූපවාහිනී නාලිකාවල පෙන්වන මෙම සමහර වැඩසටහන්වල කාන්තාවන් සඳහා විවිධ තරඟ පැවැත්වෙන අතර ඉන් ජයගන්නා තැනැත්තියට ත්‍යාගයක් දෙනු ලැබේ. එය ඇත්තෙන්ම අත්‍යාවශ්‍යද නොවන, විශාල මිලක්ද නැති භාණ්ඩයකි. (සමහරවිට ප්ලාස්ටික් භාණ්ඩයක් විය හැක) එහෙත් එම ත්‍යාගය 'දිනාගත්' විට 'ජයග්‍රාහී' කාන්තාවෝ ප්‍රීතියෙන් උඩ පනිති. එකිනෙකා වැලඳ ගනිති. සමහරු සතුට දරාගත නොහැකිව හඬාවැලපෙති. අදාළ මාධ්‍ය ආයතනයට කෙළවරක් නැතිව ස්තුති කරති. ඒ ඇයි? ඉතාම සරල, වටිනාකමක් නැති භාණ්ඩයක් නොමිලේ ලැබුන විට (ත්‍යාගයක් සේ) මෙතරම් සතුටුවීමට මිනිසුන් පොළඹවා තිබෙන්නේ කෙසේද? ඒ තරමින් මිනිසුන්ගේ ආත්ම ගෞරවය බිඳදමා තිබෙන්නේ කෙසේද? ඒ ධනවාදය තුළ වෙළඳ භාණ්ඩ පරිභෝජනය මිනිසා ගෙනැවිත් තිබෙන තැනය. ලංකාවේ සමහර හා රූපවාහිනී හෝ FM නාලිකාවකින් රු. 5,000ක් හෝ රු. 1000ක් දුන්විට උන්හිටි තැන් අමතකවී අදාළ නාලිකාවට පින් පමුණුවා එහි ප්‍රවර්ධනයේ කොටස්කාරයෙක් බවට නොදැනුවත්වම පත්වන්නේ, මේ මානසිකත්වය නිසාය. ධනවාදය තුළ හැම දෙයක්ම මිල කර තිබේ. මිල අධිකය. මිලදී ගැනීම දුෂ්කරය. එවිට යමක් 'නොමිලේ' ලැබීම හෝ තමන්ට 'මුදලක්' ලැබීම ධනවාදය තුළ විශ්මයජනක දෙයකි. එවිට ජනතාව ඉහත ආකාරයෙන් හැසිරෙති. මාධ්‍ය හිමිකරුවා එම හැසිරීම නැවත 'මිල කොට' බහුජාතික සමාගම්වලින් ලක්ෂ ගණනින් උපයති. අවසානයේ ත්‍යාගය ලද තැනැත්තා අසුවී තිබෙන්නේ වෙළඳ ගැටයකටය. එහෙත් කනගාටුවට කරුණ ඔහුට එය නොවැටහීමය. ඒ 'ප්‍රචාරණය' ඔහුව මුලාකොට තිබෙන නිසාය.

> වෙළඳ ප්‍රචාරණය මිනිසාගේ සියලු සියුම් දුර්වල නිලයන් හඳුනාගෙන ඒවාට ආමන්ත්‍රණය කරනු ලබයි. එම 'නිල' කිතිකවනු ලබයි. එවිට සමාජය තුළ ජීවත් වූ සාමාන්‍ය මිනිසා 'පාරිභෝගික වහලෙක්' බවට පත්වේ. වෙළඳ 'ප්‍රචාරණය' මගින් රූපවාහිනිය උපයෝගී කරගෙන, සඟරා හෝ පුවත්පත් උපයෝගී කරගෙන මෙම පාරිභෝගික වහල්භාවයට පත් මිනිසුන් භාණ්ඩ මිලදී ගැනීමේ උමතුවකට පත් කොට අනාගතය උගසට තබා භාණ්ඩ මිලදී ගන්නා කෙනෙක් බවට පත් කෙරේ.

### පරිභෝජන වහල්ලු

ධනවාදය යනු ලාභය සඳහා වෙළඳ භාණ්ඩ නිපදවන හා එම භාණ්ඩ මිලදී ගැනීමට පුරුදු වූ මිනිසෙක්ද නිපදවන ක්‍රමයක් බව අප මීට ඉහත ලිපි මගින්ද සාකච්ඡා කර තිබේ. එහෙත් මෙම කරුණ හොඳින්ම වටහා ගැනීම සඳහා විවිධ පැතිවලින් ඒ වෙත ප්‍රවේශවීම අවබෝධය සඳහා හොඳය. ධනපති වෙළඳපොළ තුළ භාණ්ඩ වැඩිපුර විකුණා ගැනීම නිෂ්පාදකයාගේ පරම වුවමනාව වේ. ඒ වැඩිපුර ලාභ සඳහා වැඩිපුර විකිණිය යුතු නිසාය. එය එසේ වූ විට යම් භාණ්ඩයක් තමන්ට ප්‍රයෝජනවත් වුවත් නැතත්, අතේ මුදල් තිබුණත් නැතත් එම භාණ්ඩ මිලදී ගැනීමට පෙලඹෙන පාරිභෝගිකයෙක් අවශ්‍ය වේ. සාමාන්‍ය මිනිසා එවැනි පාරිභෝගිකයෙක් බවට පරිවර්තනය කිරීම පහසු කටයුත්තක්ද නොවේ. එම භාරදූර හා දුෂ්කර කාර්යය පහසුවෙන්ම ඉටුකරනු ලබන්නේ වෙළඳ ප්‍රචාරණය මගිනි. වෙළඳ ප්‍රචාරණය මිනිසාගේ සියලු සියුම් දුර්වල නිලයන් හඳුනාගෙන ඒවාට ආමන්ත්‍රණය කරනු ලබයි. එම 'නිල' කිතිකවනු ලබයි. එවිට සමාජය තුළ ජීවත් වූ සාමාන්‍ය මිනිසා 'පාරිභෝගික වහලෙක්' බවට පත්වේ. වෙළඳ 'ප්‍රචාරණය' මගින් රූපවාහිනිය උපයෝගී කරගෙන, සඟරා හෝ පුවත්පත් උපයෝගී කරගෙන මෙම පාරිභෝගික වහල්භාවයට පත් මිනිසුන් භාණ්ඩ මිලදී ගැනීමේ උමතුවකට පත් කොට අනාගතය උගසට තබා භාණ්ඩ මිලදී ගන්නා කෙනෙක් බවට පත් කෙරේ.

ඔබේ නිවසේ තබා ඇති කිසිවිටක ප්‍රයෝජනයට නොගත් හා ප්‍රයෝජනයට නොගන්නා භාණ්ඩ වර්ග කොපමණ ඇත්දැයි විමසා බලන්න. එවැනි භාණ්ඩ රැසක් ඔබට හමුවනු ඇත. එහෙත් ඒවා ඔබ හෝ නිවසේ කිසිවෙකු විසින් 'මිලට' ගනු ලැබූ ඒවාය. තමන්ට අත්‍යාවශ්‍ය නොවන දෙයක් ඔබ මිලදී ගෙන තිබෙන්නේ ඇයි? වෙළඳ ප්‍රචාරණය සියුම් ලෙස ඔබට ඒවා මිලදී ගැනීමට පොළඹවා ඇති නිසාත් ඔබ ඊට අවනතව ඇති නිසාත්ය. සමහර භාණ්ඩයක් මිනිසුන් මිලදී ගන්නේ ඉන් 'ලාභයක්' ලැබෙන නිසාය. දෙකක් මිලදී ගත් විට එකක් නොමිලේ දීමේ වෙළඳ උපක්‍රමයට කෙනෙක් හසුවන්නේ ඉහත 'ලාභයක්' ලැබීමේ මනෝභාවය නිසාය. දෙකක් මිලදී ගත්විට එකක් 'නොමිලේ' ලැබේ නම් එය මාර ලාභයකි. එම නොමිලේ එක වෙනුවෙන් පාරිභෝගිකයා දෙවරක් නොහිතා දෙකම මිලදී ගනිති. අවසානයේ ලාභය අත්ව ඇත්තේ ඔහුට නොවේ. එම භාණ්ඩ තුනේම වටිනාකම දෙකකට ඇතුල්කොට භාණ්ඩ තුනක්ම විකුණාගත් නිෂ්පාදකයාටය. පාරිභෝගිකයා තමන්ට ප්‍රයෝජනයක් නැති භාණ්ඩ තුනක් රැගෙන ගොස් නිකරුනේ මුදල් වියදම් කර තිබේ. එකී මනෝභාවයට මිනිසා පත්කරනු ලබන්නේ වෙළඳ ප්‍රචාරණය විසිනි. එය ඉතාම රුදුරු එහෙත් සූක්ෂම වූවකි.

### අර්බුදයට විසඳුම වෙනුවට...

සමාජයක් තුළ ජීවත්වන මිනිසුන්ගේ මූලික අවශ්‍යතාවයන් සැපිරීම, ඔවුන්ගෙන් ප්‍රමුඛ සේවාවන් ලබාදීම එම සමාජයේ රාජ්‍ය පාලනයේ වගකීමකි. සරල ලෙස පැවසුවහොත් මිනිසුන්ගේ වුවමනා ඉටුකිරීම සඳහා වන සේවාවන් ලබාදීම ආණ්ඩුවක වගකීමකි. එහෙත් ධනවාදයට එම සේවාවන් ලබාදිය නොහැක. සෑම පවුලකටම නිවාසයක්, පහසු ගමනාගමන ක්‍රමයක්, අධ්‍යාපනය, සෞඛ්‍ය, ආණ්ඩුවක් විසින් ලබා දිය යුතු වුවත් ඒවා ලබාදීමට ධනවාදය අපොහොසත්ය. එවිට සිදුවන්නේ එම සේවාවන් නොලැබීමෙන් පීඩාවට පත්වන ජනතාව ඊට එරෙහිව සටන් කිරීමත් තම ජීවිතවලට අත්‍යාවශ්‍ය සේවාවන් හා අයිතීන් සඳහා සමාජ ක්‍රමය වෙනස් කිරීම දක්වා, ආණ්ඩු පෙරළි දක්වා පෙරට ඒමත්ය. මෙය ධනවාදයට හිතකර නැත. එනිසා ධනවාදය, රජය විසින් සැපයිය යුතු පොදු සේවාවන් පෞද්ගලික දේවල් බවට පත්කර ඒවා තනි තනිව ලබා ගත හැකිය, ලබාගත යුතුය යන වැරදි මනෝභාවයට ජනතාව යොමුකරවයි. ඒ සඳහා ඔවුහු 'ප්‍රචාරණය' යොදාගනිති.

උදාහරණයක් ලෙස ලංකාවේ ගමනාගමනය පිරිහී තිබේ. ගමනාගමන පහසුකම් නැත. එය ලබාදීමටද ආණ්ඩුවට හැකියාව නැත. එවිට වෙළඳ ප්‍රචාරණය ඒ සඳහා ඉදිරිපත් වේ. ඔබ 'ගමන් යාමේ අපහසුවෙන්' මුදා ගැනීමට ඔවුහු ඔබට අපූරු යෝජනාවක් කරති. ඒ ඔබේ ගමන් සඳහා 'ඔබේම වාහනයක්' ගැනීමය. එය කුඩා මොටර් රථයක් හෝ යතුරුපැදියක් විය හැක. වෙළඳ ප්‍රචාරණය ඔබට එහි ඇති වාසි රැසක් පවසමින් ඔබ ඊට පොලඹවයි. එහෙත් ඔබ අතේ මුදල් නැතිනම් එය කළ නොහැක. වෙළඳපොළ බලවේගයන්ට ඊටද විසඳුමක් තිබේ. ඒ 'පහසු ගෙවීමේ ක්‍රමයට' 'අතේ ඇති මුදලට' ඔබට වාහනය රැගෙන දීමට සමාගමක් ඉදිරිපත් වීමෙනි. ඒ අනුව ඔබ අනාගතයේ ඉපැයීමට බලාපොරොත්තු වන වත්කම් උගසට තබා පොලියද සහිතව ණයට වාහනයක් (ඔබේම වාහනයක්) මිලදී ගනියි. ඉන් ධනවාදයට වාසි රැසකි. දැන් ඔබ ප්‍රවාහන පහසුකම් ඉල්ලා ආණ්ඩුවට

15වැනි පිටුවට

# අවසන් විසඳුමක් නැති රැකියා විරහිත උපාධිධාරී අර්බුදය

රැකියා විරහිත උපාධිධාරීන්ගේ රැකියා අර්බුදයට ආණ්ඩුව විසින් විසඳුම් දෙන්න උත්සාහ කරන්නේ අතීසාරයට අමුඩය ගසා උත්තර හොයන්න දඟලන ආකාරයටය. ඒ නිසා අද වනවිට රැකියා විරහිත උපාධිධාරීන්ගේ රැකියා අර්බුදය සමාජයේ අලුත් වටයකින් කතා බහට ලක්වීමට පටන්ගෙන ඇත. උපාධිධාරීන් රැකියා ඉල්ලමින් රටේ විවිධ ස්ථානවල විරෝධතා පුවරු ප්‍රදර්ශනය කරමින් විරෝධතා දක්වන්නට පටන්ගෙන තිබුණු අයුරු දක්නට ලැබෙන්නේ මේ තත්වය තුළය.

ඕනෑම රටක සංවර්ධනයේ දර්ශකයන් සැලකිල්ලට ගැනීමේදී ඒ රටේ දියුණු කරන ලද මානව සම්පත ජනගහනයට සාපේක්ෂව ඉහළ මට්ටමක සිටීම වැදගත් කරුණකි. අප රට සාක්ෂරතාවය අතින් ඉහළ ස්ථානයක සිටින අතර, දියුණු කරන ලද උසස් මානව සම්පතක් අප රට සතුවීමද රටට ආඩම්බර විය හැකි කරුණකි. නමුත් උගත් දියුණු කරන ලද මානව සම්පතක් වන උපාධිධාරීන් දශක ගණනාවක සිට තමන්ට සුදුසු රැකියා අවස්ථා ඉල්ලා සටන් කරමින් සිටින්නේද අපේ රටේ වීම සැලකිල්ලට ගත යුතු යුතු කරුණකි.

වර්ෂයකට පාසල් සිසුහු ලක්ෂ දෙකහමාරකට (2,50,000) ආසන්න ප්‍රමාණයක් උසස් පෙළ සඳහා ඉදිරිපත් වෙති. ඉන් ආසන්නම වර්ෂය 2016 ගත් විට විශ්වවිද්‍යාල වරම් හිමිකර ගෙන ඇත්තේ 25,000කට ආසන්න ප්‍රමාණයකි.

| වර්ෂය | බඳවාගෙන ඇති සිසුන් ප්‍රමාණය |
|---|---|
| 2011 | 28,908 |
| 2012 | 24,198 |
| 2013 | 25,200 |
| 2014 | 25,643 |

(විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභා වාර්ෂික වාර්තාව ඇසුරෙනි)

මේ අනුව පෙනී යන්නේ උසස්පෙළ සඳහා ඉදිරිපත් වන සිසුන් ප්‍රමාණයෙන් විශ්වවිද්‍යාල වරම් හිමිකර ගන්නේ 10% ක වැනි සිසුන් ප්‍රතිශතයකි. අපේ රටේ ඉහළම තරඟකාරී විභාගය වන අ.පො.ස./උසස් පෙළ සඳහා ඉදිරිපත් වී ඉතාම ඉහළම ලකුණු ලබා සුදුසුකම් ලබන දියුණු මානව සම්පතක් වාර්ෂිකව උසස් අධ්‍යාපන ක්ෂේත්‍රයට එක්වේ.

ජාතික විශ්වවිද්‍යාල පද්ධතියට උසස්පෙළ සමත්ව ප්‍රවේශ වරම් ලබන අභ්‍යන්තර සිසුන්ට අමතරව උසස් පෙළ සමතුන් අතරින් සැලකිය යුතු ප්‍රමාණයක් බාහිර උපාධිධාරීන් ලෙස විශ්වවිද්‍යාලවල ලියාපදිංචි වන අතර එම ප්‍රමාණය අභ්‍යන්තර සිසුන් ප්‍රමාණය ඉක්මවන්නකි. බාහිර උපාධිධාරී සිසුන්ගෙන් රජය යම් ආදායමක් උපයනු ලබන අතර අභ්‍යන්තර සිසුවෙකු ගොඩ නැගීම සඳහා රජය වාර්ෂික අයවැයෙන් යම් මුදල් ප්‍රමාණයක් වෙන් කරනු ලබයි.

එම වෙන්කරන මුදල රජයට වියදමක් සේ වාර්තා වූවද රටක් ලෙස ගණන් බැලිය යුතු මූල්‍යමය ආයෝජනයකි. මහජනතාවගේ බදු මුදලින් විශ්වවිද්‍යාල සිසුන්ගේ මහපොළ ශිෂ්‍යත්ව, ශිෂ්‍යාධාර සඳහා මාසික මුදලක් වැය කෙරෙන අතර නේවාසිකාගාර, පුස්තකාල සහ අනෙකුත් සුභසාධන කටයුතු සඳහාද රජය වැය බරක් දරයි.

එම කරුණ කොළඹ විශ්වවිද්‍යාලයේ ආර්ථික විද්‍යා අධ්‍යයන අංශයේ 2016 වර්ෂයේ සිදුකළ ආර්ථික සමීක්ෂණ වාර්තාවක් මගින් මේ ආකාරයෙන් එම වියදම පෙන්වා දෙයි.

| එක් සිසුවෙකුට | වාර්ෂික වියදම රුපියල් |
|---|---|
| වෛද්‍ය | 256,000/= |
| ඉංජිනේරු | 128,000/= |
| විද්‍යා | 143,000/= |
| කෘෂි විද්‍යා | 212,000/= |
| කළමනාකරණ | 59,500/= |
| කලා | 92,100/= |

ඉහත පෙන්නුම් කරනුයේ, වසර 03 සිට වසර 05 දක්වා වෛද්‍ය උපාධියේ සිට කලා උපාධිය දක්වා වන කාල පරිච්ඡේදයේ එක් වර්ෂයක් වෙනුවෙන් රජය කරනු ලබන වියදමයි. රජය සාමාන්‍යයෙන් වාර්ෂිකව උසස් අධ්‍යාපනය සඳහා වෙන්කරනුයේ දළ ජාතික නිෂ්පාදනයෙන් 1.4% ක ආසන්න ප්‍රතිශතයකි. එය ආසන්න වශයෙන් බිලියන 170කි. එම වෙන්කරන ලද මුදල් පවා විශ්වවිද්‍යාල සිසුන්ගේ අවම පහසුකම් සහ අධ්‍යයන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් නොවන බවට විශ්වවිද්‍යාල තුළින් නිරන්තරව නැගෙන විරෝධතාවලින්ද පැහැදිලි වනු ඇත.

අර්බුදය ආරම්භ වනුයේ මින් අනතුරුවය. සාමාන්‍ය උපාධියක් සඳහා වසර 03ක් වන අතර විශේෂවේදී උපාධියක් සඳහා වසර 04ක්ද, වෛද්‍ය උපාධිධාරියෙකු උපරිම වසර 05ක් වශයෙන් උපාධි පාඨමාලා කාලය සම්පූර්ණ කළ යුතුව ඇත. මේ ආකාරයෙන් උපාධියක් සම්පූර්ණ කර නැවත සමාජගත වන උපාධිධාරීන් රටේ රැකියා ක්ෂෙත්‍රය සඳහා යොදා ගැනීමේ ස්ථිර හා විධිමත් වැඩපිළිවෙලක් ලංකා ආණ්ඩුව සතුව නැත. වෛද්‍ය, පශු වෛද්‍ය, දන්ත වෛද්‍ය උපාධිධාරීන් හැරුණු කොට ඉංජිනේරු, කෘෂි, කලා, විද්‍යා, වාණිජ ආදී උපාධිධාරීන් රටේ ජාතික ආර්ථිකයත් සමග බද්ධ කරගත් ජාතික සැලැස්මක් ආණ්ඩුව සතු නොවීම මෙම අර්බුදයේ මූලබීජය වේ. ඒ නිසාම දැවැන්ත බුද්ධිගලනයක් රට තුළ අඛණ්ඩව සිදුවේ. රටේ මහජනතාව විසින් උපාධිධාරියෙකු වෙනුවෙන් දරන ලද වැය බර නැවත පෙරළා ලංකාවේ ආර්ථිකය ශක්තිමත් කර ජනතාවගේ ආර්ථික ශක්තිය නංවාලන හෝ ජනතාවගේ ජීවිතය පහසු කිරීමේ වැඩ පිළිවෙලක් නොමැතිකම නිසාම රටට අත්වන පාඩුව අතිවිශාලය.

ඒ නිසාම විශ්වවිද්‍යාල අධ්‍යාපනය අවසන් කරන උපාධිධාරීන්ට තමන් හදාරා ඇති උපාධි පාඨමාලාවට ගැලපෙන සුදුසු රැකියාවක් දිනා ගැනීම වෙනුවෙන් අඛණ්ඩව අරගල කිරීමට සිදුව ඇත.

මෑත ඉතිහාසයේ උපාධිධාරීන් රැකියා ලබාගත් අවස්ථා කිහිපයක් දක්නට ඇත. 1999, 2004, 2008, 2012 වර්ෂවලදී රැකියා අවස්ථා දිනාගැනීමට උපාධිධාරීන්ට හැකි විය. ඒ අනුව ඉහත වර්ෂවලදී උපාධිධාරීන්ට රැකියා අවස්ථා හිමිවූයේ ඔවුන් ගෙනගිය දැවැන්ත උද්ඝෝෂණ ක්‍රියාමාර්ග හේතුවෙනි. ඒකාබද්ධ රැකියා විරහිත උපාධිධාරී සංගමයේ හා උපාධිධාරී ජාතික මධ්‍යස්ථානයේ නායකත්වය යටතේ ගෙන ගිය අරගල හේතුවෙන් එම සටන් ජයග්‍රහණයෙන් අවසන් කිරීමට හැකිවූ බව ඉතිහාසයේ සටහන්ව ඇත. එදා සිට මේ දක්වා එවැනි ආකාරයේ සිදුකරන ලද දැවැන්ත මැදිහත්වීම් මගින් දිනාගෙන ඇති රැකියා අවස්ථා 110,000කට ආසන්නය.

2012/03/30 දිනෙන් පසු විශ්වවිද්‍යාල මගින් උපාධිය ලබාගෙන ඇති කිසිදු උපාධිධාරියෙකු සඳහා මේ දක්වා ආණ්ඩුව රැකියා අවස්ථා ලබාදී නොමැත. ගෙවුණු වසර 05 තුළ එනම් උපාධිධාරීන්ට රැකියා ලබාදී නොමැත.

> පැවති හා පවතින කිසිදු ආණ්ඩුවකට උපාධිධාරීන් සඳහා රැකියා ලබාදීම වෙනුවෙන් වැඩපිළිවෙලක් නොවීය. රැකියා විරහිත උපාධිධාරීන්ගේ අරගල හමුවේත් එම අරගල මගින් ඇති කරනු ලබන දේශපාලන අර්බුදයට ආණ්ඩුව මුහුණදෙන ප්‍රමාණය අනුවත් රැකියාදීමේ අවස්ථා ඇති වූ බව පමණක් අප දන්නා සත්‍යයයි. ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමේදී උපාධිධාරීන්ටත් රැකියා හිමිව ඇත්තේ ඔවුන් සංවිධානාත්මකව අරගල කළ අවස්ථාවලදී පමණි.

මෙම අර්බුදකාරී තත්වය හමුවේ අද වන විට රැකියා විරහිත උපාධිධාරී සංගමය හා උපාධිධාරී ජාතික මධ්‍යස්ථානය එක්ව 2012/03/30න් පසු උපාධිය අවසන් කර ඇති උපාධිධාරීන්ට රැකියා දිනාගැනීමේ සටන ආරම්භ කර ඇත. ඒ සඳහා මේ වනවිටත් රැකියා විරහිත උපාධිධාරීන් පළාත් මට්ටමින් සංවිධානය කරමින් අරගල කරනු දක්නට ලැබේ. දැනට රැකියා විරහිත උපාධිධාරීන් 60,000කට ආසන්න ප්‍රමාණයක් සිටින බව පසුගිය දිනවල ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් කැඳවා තිබූ ඉල්ලුම්පත් ප්‍රමාණය අනුව තහවුරු වේ.

පැවති හා පවතින කිසිදු ආණ්ඩුවකට උපාධිධාරීන් සඳහා රැකියා ලබාදීම වෙනුවෙන් වැඩපිළිවෙලක් නොවීය. රැකියා විරහිත උපාධිධාරීන්ගේ අරගල හමුවේත් එම අරගල මගින් ඇති කරනු ලබන දේශපාලන අර්බුදයට ආණ්ඩුව මුහුණදෙන ප්‍රමාණය අනුවත් රැකියාදීමේ අවස්ථා ඇති වූ බව පමණක් අප දන්නා සත්‍යයයි. ඉතිහාසය දෙස ආපසු හැරී බැලීමේදී උපාධිධාරීන්ටත් රැකියා හිමිව ඇත්තේ ඔවුන් සංවිධානාත්මකව අරගල කළ අවස්ථාවලදී පමණි. ආණ්ඩුව උපාධිධාරීන්ට රැකියා ලබාදීමේ අර්බුදයට විසඳුමක් සොයනවා වෙනුවට අද වන විට බඳවා ගැනීමේ වයස් සීමාවන් පහළ දැමීම මගින් උපාධිධාරීන් සැලකිය යුතු ප්‍රමාණයක් රැකියා හිමිවීමේ වයස් සීමා මට්ටමෙන් පිටමං කරමින් සිටී.

ගරාවැටෙන වෙළඳපොළ ආර්ථිකය හමුවේ ජාතික ආර්ථිකයද බිඳවට්ටන පාලකයින් ජනතාවගේ ජීවිත අපහසු කරන හා දුක්බදායී කරන කොල්ලකාරී ධනවාදී ආර්ථිකය හමුවේ වත්මන් ආණ්ඩුවට හෝ පැවති ආණ්ඩුවලට තමන්ගේ රටේ දියුණු මානව සම්පතක් වන උපාධිධාරීන් සඳහා වන ස්ථිර ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ගැනීමට නොහැකි වී ඇත. එවැනි ප්‍රතිපත්තියක් හා සැලැස්මකින් තොරව මෙම අර්බුදයට ස්ථිර විසඳුමක් නිර්මාණය නොවනු ඇත.



# නේපාලය රතට හැරෙයි



නව ව්‍යවස්ථාවක් හඳුන්වා දීමෙන් පසු නේපාලයේ පැවති පළමු මැතිවරණයෙන්ම 2/3ක බලයක් ලබා ගැනීමට නේපාල කොමියුනිස්ට් පක්ෂ සන්ධානය සමත් විය.

නව පාර්ලිමේන්තුවක් හා පළාත් පාලනයක් තෝරා පත් කර ගැනීම සඳහා වූ මැතිවරණය නොවැම්බර් 26 දින හා දෙසැම්බර් 07 යන දෙදින පැවැත්වුණි. එහිදී කේවල කොට්ඨාස 165න් 116කම බලය හිමි වූයේ, කොමියුනිස්ට් පක්ෂ සන්ධානයටයි(නේපාලයේ එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය ආසන 80ක් සහ නේපාල කොමියුනිස්ට් පක්ෂය - මාවෝ කේන්ද්‍රය - ආසන 36ක් වශයෙනි). එය මුළු කේවල ආසන ප්‍රමාණයෙන් 70.3% ක ප්‍රතිශතයකි. නේපාලයේ ප්‍රධානතම ධනේශ්වර දේශපාලන පක්ෂය වන නේපාල කොන්ග්‍රසයට දිනාගත හැකි වූයේ, කේවල ආසන 23ක් පමණි. එනම් කේවල කොට්ඨාසවලින් 13.9% ක ප්‍රතිශතයක් පමණි.

සමානුපාතික මන්ත්‍රී ධුර 110 අතරින් 58ක් දිනා ගැනීමට වාමාංශික කොමියුනිස්ට් පක්ෂ සන්ධානයට හැකි වූ අතර නේපාල කොන්ග්‍රසයට හිමි වූයේ, සමානුපාතික මන්ත්‍රී ධුර 40ක් පමණි. සමස්ත පාර්ලිමේන්තු මන්ත්‍රී ධුර 275න් මන්ත්‍රී ධුර 174ක් හිමි කර ගැනීමට වාමාංශික සන්ධානයට හැකි විය. නේපාල කොන්ග්‍රසයට හිමි වූ මුළු මන්ත්‍රී ධුර සංඛ්‍යාව 63කි.මීට අමතරව නේපාලයේ ප්‍රමුඛ වාමාංශික පක්ෂයක් වන නේපාල කම්කරු ගොවි පක්ෂයද (NWPP) එක් කේවල ආසනයක් දිනා ගැනීමට සමත් විය.

නේපාල කොන්ග්‍රසයේ පසුගිය පාලනයන් විසින් නේපාලයට ජයග්‍රහණ ගෙන ඒමට අසමත් වීමත් විශේෂයෙන් එකී කාලය තුළ නේපාලය ඉන්දියාවේ කොලනියක තත්වයට පත් කිරීමත් නේපාල ජනතාවගේ විරෝධයට හේතු වී තිබේ. මේ අතර මැතිවරණය ආසන්නයේදී නේපාලයේ ප්‍රධාන වාමාංශික පක්ෂ දෙක පොදු සන්ධානයකට පැමිණීම විසින් නේපාල ජනතාවට නව ආශ්වාදයක් ඇති කළ අතර ඉන්දියාවේ නිල නොවන සම්බාධක පැනවීමේදී හා නේපාල භූමිකම්පාව ඇතුළු අනිකුත් අර්බුදකාරී අවස්ථාවලදී වාමාංශික පක්ෂ ජනතාව සමඟ කටයුතු කළ ආකාරයත් ඔවුන්ගේ ජනප්‍රියතාව ඉහළ දැමීමට හේතු වී තිබේ.

නේපාලය රතට හැරවූ මෙම ජයග්‍රහණය ඉන්දියානු පාලකයන්ගේ අපේක්ෂාව නොවන බවත් මේ තත්වය තුළ ගොඩනැගෙන වාමාංශික පාලනය අර්බුදයට පත් කිරීමට ඉන්දියාව කටයුතු කරනු ඇති බවටත් විචාරකයෝ මත පළ කරති. එසේ වුවත් චීනය නේපාලයේ වාමාංශික පක්ෂවල මැතිවරණ ජයග්‍රහණයට සුභ පැතුම් එක් කර ඇති අතර චීන නේපාල සබඳතා තවදුරටත් ශක්තිමත් වෙනු ඇති බවට මත පළ වේ.

කෙසේ වෙතත් නේපාලයේ වාමාංශික පක්ෂ ලැබූ මෙම ජයග්‍රහණය කලාපය තුළ ප්‍රගතිශීලී ජනතාවගේ බලාපොරොත්තු ඉහළ නංවන්නක් වී ඇති අතර එය කලාපය තුළ දේශපාලන ප්‍රවණතාවක් බවට පත් වීමටද ඉඩ තිබේ.

| නව පාර්ලිමේන්තු සංයුතිය | කේවල ආසන | මුළු ඡන්ද ගණන | ප්‍රතිශතය % | සමානුපාතික ආසන | මන්ත්‍රී ආසන |
|---|---|---|---|---|---|
| නේපාල කොමියුනිස්ට් පක්ෂය (එක්සත් මාක්ස් ලෙනින්වාදී පක්ෂය) (CPN-UML) | 80 | 3,173,494 | 33.25 | 41 | 121 |
| නේපාල කොමියුනිස්ට් පක්ෂය (මාවෝ කේන්ද්‍රය) (CPN-Maoist Centre) | 36 | 1,303,721 | 13.66 | 17 | 53 |
| නේපාල කොන්ග්‍රසය | 23 | 3,128,389 | 32.78 | 40 | 63 |
| රාෂ්ට්‍රිය ජනතා පක්ෂය නේපාලය | 11 | 472,254 | 4.95 | 06 | 17 |
| ෆෙඩරල් සමාජවාදී සංසදය | 10 | 470,201 | 4.93 | 06 | 16 |
| රාෂ්ට්‍රිය ප්‍රජාතන්ත්‍ර පක්ෂය | 01 | 196,782 | 2.06 | - | 01 |
| නාය ශක්ති පක්ෂය, නේපාලය | 01 | 81,837 | 0.86 | - | 01 |
| රාෂ්ට්‍රිය ජන මෝචා | 01 | 62,133 | 0.65 | - | 01 |
| නේපාල කම්කරු ගොවි පක්ෂය (NWPP) | 01 | 56,141 | 0.59 | - | 01 |
| ස්වාධීන | 01 | | | - | 01 |
| | 165 | | | 110 | 275 |

# ලෝක පොලිස්කාරයා හුදෙකලා වෙයි




එක්සත් ජනපද ජනාධිපති ඩොනල්ඩ් ට්‍රම්ප් විසින් පසුගිය දෙසැම්බර් 06වැනිදා ජෙරුසෙලම ඊශ්‍රායලයේ අගනුවර ලෙස ඒක පාර්ශ්විකව ප්‍රකාශයට පත් කිරීමත් ටෙල්අවිව් නුවර ඇති තම තානාපති කාර්යාලය ජෙරුසෙලමට ගෙන ඒමට තීරණය කිරීමත් සමඟ එක්සත් ජනපදය ලෝකය තුළ හුදෙකලා වී තිබේ. ඒ බව හොඳින්ම තහවුරු වූයේ පසුගියදා පැවති එක්සත් ජාතීන්ගේ සංවිධානයේ විශේෂ මහා සමුළුවේදීය. එහිදී එක්සත් ජනපදයේ වුවමනාවට පටහැණිව එය පරාජය කරමින් සමුළුවේ සාතිශය බහුතරයක් රටවල් විසින් ඡන්දය ප්‍රකාශ කරනු ලැබිණි.

එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් පලස්තීන ප්‍රශ්නය සම්බන්ධයෙන් ගෙන ඇති ස්ථාවරය වන්නේ පලස්තීනය ස්වාධීන හා ස්වෛරී රාජ්‍යයක් බවත් බටහිර ජෙරුසෙලම එහි අගනුවර වශයෙන් ගෙන 1967ට පෙර තිබූ දේශ සීමා ඔස්සේ පලස්තීන රාජ්‍යය නැවත ස්ථාපිත කළ යුතු බවත් ඊශ්‍රායලය හා පලස්තීනය වෙනම රාජ්‍යයන් ලෙස පවතින අතර ඊශ්‍රායලයේ බලහත්කාරී ක්‍රියාවන් හා නැවත පදිංචි කිරීම් වහාම අත්හිටවිය යුතු බවත්ය.

එහෙත් ඩොනල්ඩ් ට්‍රම්ප් ජනාධිපතිවරයා පසුගියදා එක්වරම ප්‍රකාශ කළේ ඊශ්‍රායලයේ අගනුවර ජෙරුසෙලම බවය. එම ප්‍රකාශයට සමස්ත ප්‍රගතිශීලී ලෝක ජනතාවම විරෝධය පළ කළ අතර එකී ප්‍රකාශය එක්සත් ජනපදය විසින් ඉවත් කරගත යුතු යැයිද ජෙරුසෙලමෙහි දැනට පවතින තත්වය වෙනස් කිරීමට ඉඩ නොදිය යුතු යැයිද එහි තානාපති කාර්යාල පිහිටුවීම වැළැක්විය යුතු යැයිද ඊජිප්තුව එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයට යෝජනා කළාය. ඒ සඳහා පැවති ඡන්ද විමසීමේදී ආරක්ෂක මණ්ඩල සාමාජික රටවල් 15න් 14ක්ම ඊජිප්තු යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළද එය සම්මත වීම එක්සත් ජනපදය විසින් වළක්වන ලද්දේ නිෂේධ බලය පාවිච්චි කිරීමෙනි. එහිදී එක්සත් ජනපද හිතවාදී රටවල් වන බ්‍රිතාන්‍යය, ප්‍රංශය, ඉතාලිය, ජපානය හා කටාරයද එක්සත් ජනපදයට එරෙහිව ඊජිප්තු යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කළහ.

මේ අතර දෙසැම්බර් 21 වනදා තුර්කිය හා යේමනය එක්ව එක්සත් ජාතීන්ගේ සංවිධානයේ හදිසි විශේෂ සැසි වාරයට මේ පිළිබඳ යෝජනාවක් ගෙන ආහ. එම යෝජනාව වූයේ ජෙරුසෙලමෙහි දැනට පවතින තත්වය වෙනස් කිරීමට දරන උත්සාහය බල රහිත කරන ලෙසත් එවැනි උත්සාහයන් පරාජය කරන ලෙසත් අවලංගු කරන ලෙසත්ය. මෙම යෝජනාවට ඡන්දය විමසනු ලදුව පක්ෂව ඡන්ද 128ක් ලැබුණු අතර විරුද්ධව ඡන්දය ප්‍රකාශ කළේ රටවල් 09ක් පමණි. එනම් ගෝතමාලාව, හොන්ඩුරාස්, මාෂල් දිවයින්, මැක්‍රොනීසියාව, නාවුරු, පලාවු, ටෝගො, එක්සත් ජනපදය හා ඊශ්‍රායලයයි. රටවල් 35ක් ඡන්දය දීමෙන් වැළකී සිටියහ.

මෙම ඡන්ද විමසීමට පෙර එක්සත් ජනපදය ලොව අනෙකුත් රටවලට අනතුරු අඟවා සිටියේ යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුනහොත් එකී රටවලට ලබාදෙන ආධාර නවතා දමන බවය. එක්සත් ජාතීන්ගේ සංවිධානයට ලබාදෙන ආධාරද නවතා දමන බවය. එහෙත් එකී තර්ජනයන් නොසලකමින් ලෝක ප්‍රජාවගේ සාතිශය බහුතරය එක්සත් ජනපද පාලකයන් සමස්ත ලෝක ජනතාව අතර හුදෙකලා කරමින් යෝජනාව ජයග්‍රහණයට පත් කළහ. මෙය එක් පසෙකින් පලස්තීන ජනතාවගේ සාධාරණ අරගලයට නව ජවයක් සපයන අතරම ලොව පුරා ප්‍රගතිශීලී ජනතාව දිරිගන්වන්නක් බවට පත්ව තිබේ.

# පුටින් පිටිය ශුද්ධ කරයි



රුසියාවේ මීළඟ ජනාධිපතිවරණය සඳහා ඉදිරිපත් වීම එරට විපක්ෂ නායක ඇලෙක්සි නවාල්කිට තහනම් කරනු ලැබ තිබේ. ඔහුට 2017 පෙබරවාරියේදී දැව සමාගමකින් වංචා කිරීම පිළිබඳව අධිකරණය විසින් වරදකරු කර අත්හිටවූ සිර දඬුවමක් නියම කර ඇත. ඒ හේතුවෙන් ඔහුට ජනාධිපතිවරණයට ඉදිරිපත් වීමට ඉඩ දිය නොහැකි යැයි එරට මැතිවරණ කොමිසම ප්‍රකාශයට පත් කළේය.

අවුරුදු 06කට වරක් පවත්වන රුසියානු ජනාධිපතිවරණය 2018 වර්ෂයේ මාර්තු මාසයේදී පැවැත්වීමට නියමිතව ඇත. ඒ සඳහා වත්මන් ජනාධිපති ව්ලැද්මීර් පුටින්ද ඉදිරිපත් වේ. මැතිවරණ කොමිසම ඉහත තීරණය ප්‍රකාශයට පත් කිරීමත් සමඟම ජනාධිපතිවරණය වර්ජනය කරන ලෙස රුසියානු විපක්ෂ නායකවරයා ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

# රාවුල්ට තවත් මාස දෙකක්



පසුගිය දෙසැම්බර් 21වැනිදා රැස්වූ කියුබානු පාර්ලිමේන්තුව ජනාධිපති රාවුල් කස්ත්‍රෝගේ ධුර කාලය මාස 02කින් එනම් ලබන අප්‍රේල් මාසය දක්වා දීර්ඝ කිරීමට තීරණය කළේය. එය ඒකමතික තීරණයක් විය.

මෙසේ ජනාධිති රාවුල් කස්ත්‍රෝගේ ධුර කාලය දීර්ඝ කිරීමට සිදු වූයේ කියුබාව හරහා හමා ගිය ඉර්මා කුණාටුව හේතුවෙන් ඔක්තෝබර් මාසයේ පැවැත්වීමට නියමිතව තිබූ මැතිවරණය නොවැම්බර් දක්වා කල් දැමීමට සිදු වූ නිසාවෙනි.

ඉර්මා කුණාටුව හේතුවෙන් කියුබාවේ 10 දෙනෙකු මිය ගිය අතර දැවැන්ත දේපළ හා සම්පත් ප්‍රමාණයක් විනාශ විය. වත්මන් පාර්ලිමේන්තුවේ නිල කාලය නියමිත ලෙසට අවසන් විය යුතුව තිබුණේ 2018 පෙබරවාරියේ වුවද දැන් එය අප්‍රේල් දක්වා දීර්ඝ කර තිබේ.

තමා 2018 වසරේදී ධුරයෙන් ඉවත් වන බවට රාවුල් කස්ත්‍රෝ ජනාධිපතිවරයා ප්‍රකාශ කර තිබුණි. ඔහු ජනාධිපති ධුරයෙන් ඉවත් වුවද කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ ප්‍රධාන ලේකම් ධුරයේ තවදුරටත් රැඳී සිටිනු ඇත.

# මදුරෝට ජය පිට ජය



පසුගිය දෙසැම්බර් 10වැනිදා වෙනිසියුලාවේ පැවති නගර සභා මැතිවරණයේදී නගර සභා 335න් නගර සභා 308ක බලය ලබා ගැනීමට එරට ජනාධිපති නිකොලාස් මදුරෝගේ පක්ෂය සමත් විය. එහිදී ඔවුන් ඡන්ද 6,517,606 ක් ලබා ගනිමින් 71% ක ඡන්ද ප්‍රතිශතයක් ලබාගත් අතර විපක්ෂයට ලබා ගත හැකි වූයේ ඡන්ද 2,749,000ක් පමණි.

2013 වසරේදී ජනාධිපති චාවේස්ගේ පක්ෂයට දිනාගත හැකි වූයේ නගර සභා 255ක් පමණි.

# කැටලෝනියානු බෙදුම්වාදය පසුබසී



කැටලෝනියානු කලාපීය මැතිවරණයෙන් වෙන්වීමට එරෙහි සන්ධානය ජයග්‍රහණය කර තිබේ. පසුගිය දෙසැම්බර් 21වැනිදා වන විට 99.5%ක ඡන්ද ගණනය කර තිබූ අතර ඒ වන විට එම සන්ධානය ගණන් කර තිබූ ඡන්ද ප්‍රමාණයෙන් 25.36%ක් ලබා තිබුණි. ඒ අනුව ඔවුන් ආසන 136න් ආසන 37ක් දිනා තිබුණි.

වෙන්වීම වෙනුවෙන් පෙනී සිටි හිටපු කැටලෝනියානු නායකවරයාගේ පක්ෂයට ලබා ගත හැකි වූයේ ආසන 34ක් පමණි. ඒ 21.68% ක ඡන්ද ප්‍රතිශතයකි.

කවුළුව හැර තබමි

# ලොව ඉහළින්ම ලෙළදෙන රතු ධජය



මෙම ජනවාරි 01වැනි දිනට කියුබානු විප්ලවය සිදුවී අවුරුදු 59ක් සැපිරේ. සමාජවාදී ධජය කියුබානු භූමිය තුළ තවමත් නොසැලී අභිමානයෙන් බබලයි.

1959 ජනවාරි 01වැනි දින හවානා නගරයත් මොන්කාඩා බැරැක්කයත් කියුබානු විප්ලවවාදීන් අතට පත්වීමත් සමග කියුබානු ජනතාවගේ විප්ලවීය ජයග්‍රහණය තහවුරු කෙරිණි. 1975 දෙසැම්බරයේදී පැවති කියුබානු කොමියුනිස්ට් පක්ෂයේ පළමුවෙනි සමුළුවේදී විප්ලවයේ ජයග්‍රහණ ෆිදෙල් සංඛ්‍යා ලේඛනද සහිතව පැහැදිලි කළේ මෙසේය.

විප්ලවය ජයගත් පසු 1975 වන විට, කියුබාවේ නිකල් නිෂ්පාදනය දෙගුණ විය. මිලියන 3-6ක්ව පැවති ඛනිජතෙල් පිරිපහදු කැණීම් 1975 වැනි විට මිලියන 5-9 දක්වා වැඩි විය.

වානේ නිෂ්පාදනය ටොන් 200,000 සිට 240,000 දක්වා වැඩි විය. විදුලි ජනනය කිලෝ වොට් පැය බිලියන 2.55 සිට බිලියන 6.5 දක්වා වැඩි විය. 1958 ටොන් 196,000ක් වූ පොහොර නිෂ්පාදනය 1975 දී ටොන් මිලියන 1.002ක් දක්වා වැඩි විය. මාළු අස්වැන්න 06 ගුණයකින් වැඩි විය. ට්‍රැක්ටර් භාවිතය 1958-79 කාලය තුළ 9,000 සිට 54,000ක් දක්වා ඉහළ ගියේය. ළදරු මරණ අනුපාතිකය 1000ට 11.5 දක්වා පහත බැස්සේය. ගැහැණු පිරිමි දෙපාර්ශවයේම දරුවන් 100%කින්ම ප්‍රාථමික අධ්‍යාපනය නිම කළේය. සෞඛ්‍ය, ක්‍රීඩා හා අනෙකුත් ක්ෂේත්‍රවල විශ්මිත ජයග්‍රහණ රැසකි. ඒ සමාජවාදයේ විශ්මය කියුබාව ලොවට කියාදුන් අන්දමය.

# හැපි නිව් ඉයර්...



ගංවතුර හේතුවෙන් මියගිය සංඛ්‍යාව 206කි. විපතට පත් පවුල් ගණන 311,511කි. පුද්ගල අතුරුදන්වීම් 92කි. මීතොටමුල්ල කුණු කන්ද කඩා වැටී සිදුවූ මරණ සංඛ්‍යාව 31කි. ගණිකා වෘත්තියේ නියැලෙන කාන්තාවන් සංඛ්‍යාව 50,000 දක්වා වැඩි විය. එච්අයිවී ආසාදිතයන් 2500 දක්වා ඉහළ ගියේය. ඩෙංගු රෝගීන් 180,939කි. ඉන් සිදුවූ මරණ සංඛ්‍යාව 401කි. සමස්ත ජනගහණයෙන් මන්දපෝෂණ ප්‍රතිශතය 22%ක් දක්වා ඉහළ ගොස්ය. ගැබිණි මව්වරුන්ගෙන් 50%කට මන්දපෝෂණයය. දරුවන් අතර එම ප්‍රතිශතය 25%ටත් වැඩිය. පාසල් යන වයසේ දරුවන් 452,661ක් පාසල් නොයයි. ඒ අතරින් දරුවන් 51,249ක් කිසිදා පාසල් ගොස් නැත. මනුෂ්‍ය ඝාතන 457කි. සියදිවි නසාගත් සංඛ්‍යාව 2,675කි. අවුරුදු 18ට අඩු දරුවන් දූෂණය කිරීම් 322කි. ස්ත්‍රී දූෂණ 1854කි. සෑම විනාඩි 90කටම වරක් ලංකාවේ කොතන හෝ කාන්තාවක් දූෂණය වේ. වංචා දූෂණ අතින් ලංකාව ලෝකයේ 04වැනි ස්ථානය දිනාගෙන තිබේ.

අපි ඉහතින්ම කිවුවේ විප්ලවයෙන් පසු කියුබාවේ තත්වයයි. ඊට පසු මෙහි කියා ඇත්තේ 2017 ගෙවෙන විට ලංකාවේ තත්වයයි. අපේ රටේ මිනිස්සු අවුරුද්දට සුභපතා ගන්නේ මෙවැනි නාරා වලක සිටගෙනය. මෙවැනි රටක හදවතින්ම එය කළ හැකිද? මදකට සිතා බලන්න. කියුබානු ජනතාවට ලැබූ හැම අවුරුද්දක්ම සුභ වෙනවිට ලාංකේය ජනතාවට එහි සම්පූර්ණයෙන්ම ප්‍රතිවිරුද්ධ පැත්තය. අවුරුදු 70ක් රට කරපු පාලකයන්ගේ ශාපය එයයි. අලුත් අවුරුද්ද ඇත්තටම සුභකරගත හැක්කේ කෙසේද? සිතන්න.

# “හැදෙන්නකෝ අයියේ, දැන්වත් හිතන්නකෝ අයියේ...”

“ගම හදන ගජ බලය”

“විකල්ප නොමැත, පොහොට්ටුව පමණි”

“හොරෙක් නොවන අපේ එකෙක්”

“ගමට වැඩ්ඩෙක්”

මේ දිනවල ගම් පළාත්වල ප්‍රදර්ශනය වන මැතිවරණ ප්‍රචාරක පෝස්ටර්වල සඳහන් සටන් පාඨ කිහිපයකි. මේවා අවුරුදු 70ක් පුරා රට කාපු හොරුන්ගේ සුපුරුදු සටන් පාඨය. ලංකාවේ ලොකුම දේශපාලන කසළ කඳු දෙකේ ලගින උන්ගේ විහිළු කතාය. මේ වන විට ශ්‍රී ලංකාව ලෝකයේ දූෂිතම රාජ්‍ය අතර 04වැනි ස්ථානය දිනාගෙන ඇත්තේ අර දේශපාලන අම්බරුවන්ගේ හපන්කම් නිසාය. නැවත නැවතත් මේවා ගැන කියා වැඩක් නැත. හිසේ සිට පාදාන්තය දක්වා ජනතා දේපොළ ගසා කා දහජරාව තවරාගත් දේශපාලුවෝ මේ දිනවල ශුද්දෝධනලා මෙන් පෝස්ටර්වල විරිත්තාගෙන සිටිති.

“රැවටෙන්න, නැවත නැවතත් රැවටෙන්න” කියන ප්‍රාර්ථනය සහිතව ඔවුන් මේ හිනා පනාව දාන්නේ මේ රටේ ඡන්දදායකයාටය.

අපි රටේ ජනයාගෙන් ඉල්ලන්නේ එකම දෙයකි. අවුරුදු 70ක කොළ නිල් දේශපාලන කෙරුවාවෙන් ඉතිරි වූ රටේ ශේෂ පත්‍රය රැගෙන බලන්න. පසුගිය කාලය පුරාවටම ජ.වි.පෙ. ශේෂ පත්‍රයද ඒ සමග සංසන්දනය කර බලන්න. තීරණය ගැනීම ඉතා පහසුය.




# පොලිටිකල් පංතිය

“ළමයිනේ අද අපි සිංදුවක් කියමු”පොලිටික්ක හිටියෙ මාර ජොලියක. “අද වාරෙ අන්තිම දවසනෙ”

“අන්න මරු වැඩේ. සර්ටත් පහළ වෙන්නෙ අපිට පහළ වෙන ‘දාර්ශනික’ සිතුවිලිමනෙ!” කනිය අයින්ස්ටයින් ලුක් එකක් දැම්ම.

“මොන සිංදුද කියන්නෙ සර්. ආනන්දයෙන් ප්‍රඥාවට යන ඒවාද? ප්‍රඥාවෙන් ආනන්දයට යන ඒවද?” මංජුවත් දාර්ශනික අදහස්වලින්ම අතෑරිය.

“අපි සින් කරන්නෙ ඩාන්සින් එක්කද සර්?” වසන්තියට සිංදු කිවුවහම මතක් වුණේ සංගීතයක්.

“නෑ මේ අපි නිකං සිංදු... හැමදාම කියන ඒවා කියමු.” පොලිටික්ක සීරියස් ගන්නෙ නැතුව කියල දැම්ම.

“හැමදාම බයිල කියල හරියන්නෙ නෑ. මේ සැරේ මිනිස්සුන්ට වෙන අතක් බලන්නම වෙනවා” සමන කිවුවෙ හිමිහිට.

“මොකක්ද සමන් කිවුවෙ.” පොලිටික්ක සමනගේ කට හෙළවෙන එක ගැන උනන්දුවෙන් ඉඳලා කියල තේරුණා.

“නෑ සර්, හොඳ සිංදුවක් කියමු කියල කිවුවෙ. දැන් කවුරුත් අහන්න ආස හොඳ සිංදු.” සමන අදහස පොදු කළා.

“ඔව් ඔව්. ඔය තියෙන්නෙ. “පිපී පිපී රේණු නටන වනේ මලක හැප්පිලා... මලින් මලට ඉගිලුණාට... මල් මල් හීනය සීතල උදයේ... ” පොලිටික්කගෙ කට කණේ, කණ සාක්කුවෙ.

“මොකද සර් මේ මල් ගැනම සිංදු මතක් කරන්නෙ” මංජුව දැම්මෙ මනමාල හිනාවක්.

“නෑ ළමයිනේ... මලුත් ලස්සනයි... මල් ගැන සිංදුත් ලස්සනයි.” පොලිටික්කගෙන් අහිංසක මූණක් මතුවුණා.

“මල් ගැන තව සිංදුවක් මටත් මතක් වුණා සර්...” කනිය ඔළුව කහනව. “නෙළුම් මලේ පෙති කඩලා... ඔරුව” කනිය කියන්න හදන කොටම පොලිටික්ක නැවැත්තුව.

“හා... හා... අව කැපෙන කතා කියන්න එපා ළමයිනේ” පොලිටික්ක බැගෑපත් වුණා.

“අයියෝ සර්. මොකද්ද අවුල. මං කියන්න හැදුවෙ අහිංසක සිංදුවක්නෙ.” කනියගෙ ඇවටිල්ල.

“නෑ ළමයිනේ, කියනවනම් ඔය තියෙන්නෙ කාලෙටත් ගැලපෙන සින්දු... පොට්ටු පොට්ටු මල් පොහොට්ටු මල් ලෝකෙට හිනැහෙනවා...” පොලිටික්ක හිතේ හිරකරගෙන හිටපු සිංදුවක් පැන්න.

“ආ... දැන්නෙ සර් මුට්ටිය දාපු කාරණෙ තේරුණෙ.” මංජුව මුට්ටියට තඩිබාන්න හැදුව.

“මොකද්ද සර් මුට්ටිය?” කනියට මීටර් නෑ... “රා මුට්ටියක්ද?”

“නෑ නෑ... මේක පොහොට්ටු මුට්ටිය” මංජුව තේරුම් කළා හැමෝටම ඇහෙන්න.

“වැරදිලා වුණත් කනිය කිවුව එක හරි හරි. දැන් පොහොට්ටුව පිපෙන්න කලින් පෙති කැඩෙනව. කට්ටිය සීසීකඩ යනවා, පුවක් වල්ල පොලේ ගැහුව වගේ. දැන් කට්ටියක් මෛත්‍රීගේ දෑත් ශක්තිමත් කරන්න යනව පෝලිමේ. බැසිල් යූඑන්පී ඩීල්ලු. ගෝඨා රටෙත් නෑලු. තවත් අය තමන්ගෙ අයට නාම යෝජනා දුන්නෙ නෑ කියල හොටු හූරනව. බැසිල්ගෙන් කැපිල්ලලු. මහින්ද එයාල ගැන බලන්නෙ නැල්ලු. වැටිලා හිටිය මහින්ද නැගිට්ටුවෙ එයාලලු. ඒකට කෙළෙහිගුණ නැල්ලු. රටට අවනඩුව කියනව. දැන් පොහොට්ටු කට්ටිය නාම යෝජනාවලට කුලල් කා ගත්ත. ඒත් අන්තිමට රණ්ඩු වෙලා රණ්ඩු වෙලා භාර දීපු නාම යෝජනාත් හබක්. දැන් මණ්ඩලේ ෆුල් කචල්ලු. පොහොට්ටුව ලත් තැනම ලොප් කියලයි රට්ටු කියන්නෙ.” සමන ලොකු කතාවක් කෙටියෙන් කිවුව.

“එතකොට පොහොට්ටුව පිපෙන්නෙ නැද්ද?” අනුරුද්දිය මල් පිපෙනකම් ඉඳල.

“නෑ... මේ යන විදිහට ඔහොම්මම... පරවෙයි.” සමන ඇල්වතුරත් නිවල බිවුව.

“දුක සැප දෙක නිති පෙරළේ ... රිය සක ලෙස ලෝ කුහරේ....” පොලිටික්ක හුස්මක් අරන් හයියෙන් කියන්න පටන් ගත්තෙ කතාව තවත් දිග්ගැස්සෙයි කියලද කොහෙද.

## ජනතාව සුවිශේෂී...

03 පිටුවෙන්

කිසිවෙකුට තම අයිතියක් සහිත ආණ්ඩු බලයක් මුදාහැරීමේ හැකියාව දුර්වල වී තිබෙනවා. ඒ වගේම මැතිවරණය කල්දැමීම සඳහා දරන ප්‍රයත්නයේදී විශේෂයෙන් මෛත්‍රීපාල සිරිසේන පාර්ශ්වයේ උත්සාහය පරාජයට පත්කිරීම වෙනුවෙන් මැතිවරණ කොමිසම විශේෂ කාර්යභාරයක් කළා. ඒ නිසා අපි දකිනවා, මේක ස්වාධීන මැතිවරණ කොමිසමක් යටතේ එන පළමු මැතිවරණය. ඒ නිසා ස්වාධීන මැතිවරණ කොමිසම තමන්ගේ කාර්යභාරය ශක්තිමත්ව කරනවා නම්, ආණ්ඩු බලය හෙබවීම කිසිදු වාසිසහගත තත්වයක් නිර්මාණය කරන්නේ නැහැ.

***නියමුවා:- ඒකාබද්ධ විපක්ෂය ජී.එල්.ගේ පක්ෂයෙන් මැතිවරණයට ඉදිරිපත් වුවත් විවිධ වුවමනාකම් සහිත මෙම කල්ලිය ඒකරාශී කිරීමටත් ඡන්දදායකයින් ආකර්ෂණය කරගැනීමටත් එය කැපී පෙනෙන ලෙස අසමත්ව තිබෙනවා. මෙම තත්වයට බලපා ඇත්තේ කෙබඳු වටපිටාවක්ද?***

*අනුර දිසානායක සහෝදරයා:-* විශේෂයෙන්ම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ජී.එල්.පීරිස් නායකත්වය දරන පිල අතිශය දුර්වල පිරිසක් අතට පත්වී තිබෙනවා. ඒ පිලේ සියලු දෙනා එකතුවී තිබෙන්නේ පොදු සම්මුතියකින් නෙමෙයි. ඔවුන්ට ආර්ථික වශයෙන් හෝ රටේ ජාතික ප්‍රශ්න පිළිබඳව හෝ රටේ වැදගත් කාර්යයක් පිළිබඳ කිසිදු ප්‍රතිපත්තියක් නැති කණ්ඩායමක්. ඒ වගේම තමයි මේ පළාත් පාලන ආයතන දීර්ඝ කාලයක් පාලනය කරනු ලැබුවේ ඔවුන්. ඔවුන්ගේ සභාපතිවරුන්, මන්ත්‍රීවරුන්, ස්ත්‍රී දූෂකයන්, දූෂණ චෝදනා, මිනීමරු චෝදනා, අපරාධ චෝදනා, වංචා දූෂණ චෝදනා එල්ල වූ කණ්ඩායම. ඒ නිසා මෙම රාජපක්ෂ, ජී.එල්. පීරිස්, ශ්‍රීල.නි.ප. කල්ලිය අද ඒකමතිකභාවයට පත්වී තිබෙන්නේ ඔවුන්ගේ වංචා, දූෂණ යටපත්කර ගැනීම සහ ඉන් ආරක්ෂාවීම යන කරුණ මත පමණයි. මෙම කණ්ඩායම තුළ තිබෙන්නේ අවංකභාවයේ එකතුවක් වෙනුවට වංකභාවයේ එකතුවක්. එම නිසා විටින් විට කුඩා කුඩා චලනයන් මගින් පවා එය බෙදීමට ලක්වෙමින් තිබෙන බව පෙනෙනවා. ඒ වගේම මැතිවරණයේ ආරම්භය තුළම ඔවුන් අතර අර්බුද ගණනාවක් නිර්මාණය කර තිබෙන නිසා එය දුබල තත්වයට පත්වී තිබෙනවා.

***නියමුවා:- ආණ්ඩුව පොහොසත් රටක් පිළිබඳව කියමින් සිටියේදී බඩු මිල පවතින්නේ, ජනතාවට උහුලා ගත නොහැකි තත්වයකයි. රටේ සම්පත් විකිණීම හැරෙන්නට ඔවුනට වෙනත් ආර්ථික ගමනක් ඇති බවක් පෙනෙන්ටද නැහැ. මේ තත්වය තුළ එලඹෙන මැතිවරණය හමුවේ ජනතාවට දිය යුතු ඔබේ පණිවිඩය කුමක්ද?***

*අනුර දිසානායක සහෝදරයා:-* මේ අවුරුදු තුනක කාලපරිච්ඡේදය තුළ මේ ආණ්ඩුව ක්‍රියාත්මක කරන ලද ක්‍රියාමාර්ග මේ රටේ කිසිවෙකුට අනුමත කළ නොහැකියි. එක්සත් ජාතික පාක්ෂිකයෙකුටවත් මෙම ආණ්ඩුව අනුගමනය කරමින් තිබෙන ප්‍රතිපත්තීන් පිළිබඳ එකඟතාවයකට ආ නොහැකියි. වංචනිකයන් අල්ලන්න ආපු ආණ්ඩුව වංචනිකයන් රකිනවා. හොරකම් නතර කරන්න ආපු ආණ්ඩුව හොරකම් කරනවා. ආර්ථිකය වර්ධනය කරන්න ආපු ආණ්ඩුව ආර්ථිකය කාබාසිනියා කර තිබෙනවා. යහපාලනය ඇති කරන්න ආපු ආණ්ඩුව කිසිදු පාලනයකට නැති තත්වයකට රට පත්කොට තිබෙනවා. රැකියා නිර්මාණය කරන්න ආපු ආණ්ඩුව රැකියා කප්පාදුකොට තිබෙනවා. ජාතික සම්පත් විකුණමින් තිබෙනවා. සහනාධාර කප්පාදු කරමින් තිබෙනවා.

ආණ්ඩුවේ විනාශකාරී ගමන පිළිබඳ ජනතාව තැන තැන බනිමින් ඉන්නවා. මළ ගෙදරදි, කඩපොළේදි, බස් රියේදි, දුම්රියේදි, ආණ්ඩුවට බරපතළ විවේචන එල්ලකරමින් සිටිනවා. හැබැයි කෝච්චියේ, බස්පොළේ, කඩපොළේ බැන්නයි කියල ඒ ක්‍රියාමාර්ග ආපසු හැරවෙන්නේ නැහැ. ඒ නිසා ඒ ක්‍රියාමාර්ග ආපසු හැරවීම සඳහා හොඳම අවස්ථාව තමයි මේ මැතිවරණය. ආණ්ඩුව විසින් අනුගමනය කරන ලද මේ තුන් අවුරුදු පාලනයේ ඒ ක්‍රියාමාර්ගවලට විරුද්ධ බව ප්‍රකාශයට පත්කිරීම සඳහා ජනතාව තීන්දුවක් ගත යුතුයි. සැබැවින් පතුලෙන්ම ආණ්ඩුවේ වංචා, දූෂණ, ත්‍රාඩකම්වලට එරෙහි විය හැක්කේ, ජනතා විමුක්ති පෙරමුණට පමණයි. ජනතා විමුක්ති පෙරමුණේ සීනුව ඉදිරියෙන් ඡන්දය සලකුණු කිරීමෙන් පමණයි, මේ ආණ්ඩුවේ පාලනයට විරුද්ධව සැබෑ ජනමතයක් ප්‍රකාශ කළ හැකි වන්නේ.

මොකද මේ වනවිටත් සුසිල් ප්‍රේමජයන්ත ප්‍රකාශ කර අවසන් ඔවුන් මහින්දගේ පාර්ශ්වයත් එක්ක එකතු වී ආණ්ඩුවක් ගොඩනගන බව. ජී.එල්. ප්‍රකාශ කොට අවසන් ඔවුන් එක්සත් ජාතික පක්ෂය සමග එකතු වී ආණ්ඩුව ගොඩනගන බව. ඒ නිසා ඔවුන් ඉතා පැහැදිලි ලෙස පෙන්නුම් කර තිබෙනවා කවරාකාරයේ හෝ ආණ්ඩුවත් එක්ක බද්ධවීමකට තමයි ඔවුන් යන්න සූදානම් කියන එක. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව සමග, මෛත්‍රීපාල සිරිසේන ආණ්ඩුව සමග ශ්‍රී ලංකා නිදහස් පක්ෂයත් සමග එකතු වෙනවා කියන්නේ ඔවුන් එකට අත්වැල් බැඳගැනීමක්.

ඒ නිසා මෙම ආණ්ඩුවේ ක්‍රියාකලාපයට එරෙහිව ප්‍රබලතම මතය ප්‍රකාශ කළ හැකිවන්නේ, ජනතා විමුක්ති පෙරමුණට ඡන්දය ලබාදීමෙන් පමණයි. අපි ජනතාවට ආරාධනා කරනවා මැතිවරණයේදී ජනතා විමුක්ති පෙරමුණ සමග අත්වැල් බැඳගන්න කියලා.

## පළාත් පාලන බලය...

08 පිටුවෙන්



මහත්තයාගේ කණ්ඩායම ඉන්නවා. මේ කඳවුරු තුනක් නොවන බව දැන් හොඳටම පැහැදිලියි. මෙච්චර කාලයක් ඒ බව හංගලා තිබුණා. හැබැයි මේ ගෙවීගිය දින කිහිපය ඇතුළේ මේ සියලු දෙනාම එක කඳවුරක බව වෙන කවරදාටත් වඩා හොඳින් ඔප්පුකර තිබෙනවා.

මේ වන විට ජනතාවගේ සතුරුභාවයට පත්වී තිබෙන මේ ප්‍රාදේශීය සභා ජනතාවගේ ඥාතියෙක් බවට පත්කර ගන්නා මැතිවරණ ජයග්‍රහණයක් ලබාගන්න ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කරනවා. පළමුව දූෂණය නතර කරනවා. දෙවනුව කාර්යක්ෂමතාවය ඇති කරනවා. පළාත් පාලන ආයතනවලට පැවරී තිබෙන කාර්යභාරය අතරින් ප්‍රමුඛම වැඩ ටික අපි ඉටුකරනවා. මේ ජයග්‍රහණ ලබාගත හැක්කේ ප්‍රාදේශීය සභා මැතිවරණයේදී ජනතාවගේ ජීවිත සමග බද්ධ වුණු ප්‍රාදේශීය සභා බලය ජනතා විමුක්ති පෙරමුණට වැඩි වශයෙන් ලබාදීමෙන් පමණයි. ලස්සන නගරයක්, සුන්දර පරිසරයක් සහිත ප්‍රාදේශීය සභාවක් ළමා හා මාතෘ සායන පහසුකම් සහිතව ගොඩනගා අනාගත පරම්පරාව ගොඩනැගීමේ අත්තිවාරම දමනවා. මේ කාර්ය භාරය ඉටුකිරීමට ජනතා විමුක්ති පෙරමුණේ කැපවීම ඉහළින්ම ලබාදෙන මේ අපේක්ෂක අපේක්ෂිකාවන් ගම්මට්ටමේදී ජයග්‍රහණය කිරීමේ කාර්යභාරය ඉටුකළ යුතුව තිබෙනවා. මේ රට නව දේශපාලන සංස්කෘතියකට රැගෙන යන මුල් පියවර වශයෙන් එළඹෙන පළාත් පාලන මැතිවරණය සියලුම ජයග්‍රහණයන් ලබා ගැනීමට ඔබ වෙත පැවරී තිබෙන කාර්යභාරය ශක්තිමත්ව නොපිරිහෙළා ඉටුකරාවි කියන විශ්වාසයෙන් යුතුව ඊට අවශ්‍ය ශක්තිය ධෛර්යය ලැබේවා යැයි ප්‍රාර්ථනා කරනවා.

## ජ.වි.පෙ. ගෞරවනීය දේශපාලන...

09 පිටුවෙන්




පරිත්‍යාග කරන ආදර්ශය අපි ගොඩනැඟුවේ ඒ විදිහටයි.

මේ සමාජයේ හොඳ මිනිහෙක් වෙන්න අමාරුයි. මේ සමාජ ක්‍රමය ඉල්ලා සිටින්නේ ජරාජීර්ණ වූ, තමන් ගැන විතරක් හිතන අතිශය ආත්මාර්ථකාමී වූ මිනිස් කොට්ඨාසයක්. එවැනි තත්වයක් හමුවේ සාමූහිකත්වයෙන් තමන්ගේ මනාප අංකය පවා අනික් අයට නොකියා මනාප පොරය යටතේත් අපේ පක්ෂය මැතිවරණ ආදර්ශයන් ලබාදී තිබෙනවා. ජ.වි.පෙ. නියෝජිතයින් අපේක්ෂකත්වය ලබාගන්නේ තමන් දිනන්න නොවෙයි; ප්‍රතිපත්ති දිනවන්න. ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රතිපත්ති මේ මහ පොළවේ යථාර්ථයක් කරන්න. අපිට තියෙන්නේ පොදු අරමුණුම නිසා, පළාත් පාලන ආයතනවලින් තේරී පත්වෙන අපේ මන්ත්‍රීවරුන්ගේ දේශපාලන වගකීම තියෙන්නේ තමන්ගේ කොට්ඨාසයට විතරක් නොවෙයි, මුළු රටටම බවත් මතක් කරන්න ඕනෑ. ජනතා විමුක්ති පෙරමුණේ මැයි දිනයකින් පස්සේ පිට්ටනිය සුද්ද පවිත්‍රකර, ආදර්ශ දෙනවා වගේ ජනතා විමුක්ති පෙරමුණේ අපේක්ෂකයන් දිනුවට පස්සේ තමන්ගේ කොට්ඨාසය වෙනමම ආදර්ශවත් කොට්ඨාසයක් වශයෙන් ගොඩනගලා පෙන්වමු. රට වෙනස් කරන්න ආදර්ශය දෙන්න ඕනෑ ගමෙන්. 2020දී ආණ්ඩු වෙනස් කිරීමේ හැකියාව පෙන්වන්න ඕනෑ, මේ මැතිවරණයෙන්. ජන සහභාගී සංවර්ධනය ගමෙන් පටන් ගන්න ඕනෑ. එවැනි දේශපාලන සංස්කෘතියක් ගොඩනැගීමේ විශාල වගකීමක් ඔබ සියලු දෙනාට පැවරී තිබෙනවා.

අනික් පක්ෂවලින් මේ අපේක්ෂක ලැයිස්තු හැදීමේදී පෙන්වා තියෙන්නේ හිරගෙවල්වල ඉන්න ඕනෑ මිනිස්සු මහජන නියෝජිතයන් වශයෙන් සභාවලට පත්කරන්න උත්සාහ කරන බව. ඒ අය නීතිය මඟින් හිරගෙවල්වලට යවන එකත් අපි කල්පනා කරමු. අලුත් දේශපාලන සංස්කෘතියක් ගොඩනගන්න ජනතාව පෙළගස්වන එකත්, මේ මැතිවරණයෙන් අපි පෙන්වමු. අනික් පක්ෂ කරන්නේ ජනතාවට සිමෙන්ති, ටකරන් තහඩු, ගිනිපෙට්ටි, වගේ දේවල් බෙදා දෙන එකයි. ඡන්දවලදි තාම, බෙදුවේ නැත්තේ මිනීපෙට්ටි විතරයි. ජනතා විමුක්ති පෙරමුණේ අපි බෙදන්නේ, බඩු නෙවෙයි. ජනතාව දැනුවත් කරන අදහස්. බඩු බෙදන ඒවා ටික දවසකින් විනාශ වෙලා ඉවර වෙනවා. අපි බෙදන අදහස් මිනිසුන්ගේ හදවත්වල සදාකාලිකව පවතිනවා. සමාජය ගොඩනගන්න ජනතාව පෙළගස්වන්න ඕනෑ බඩුවලින් නොවෙයි. අදහස්, මතවාද, ප්‍රතිපත්ති සහ ආදර්ශවලින්. අපට ඕනෑ ජනතාවට වගකියන පාලනයක් බිහිකරන්න. එහෙම ආණ්ඩුවක් හදන්න මුලපුරන ඡන්දයක් බවට මේ මැතිවරණය පත්කර ගනිමු. මුළු රටම ඒ වෙනුවෙන් සූදානම් කරමු. හැත්තෑවසරක් පුරා මේ රට වෙළාගත්ත ජඩ පාදඩ දේශපාලන ගමන්මඟ අවසන්කර, වංචාව - දූෂණය පරදවන ගම හදන ඡන්දයක් බවට පත්කර ගනිමු.

## ප්‍රචාරණය හා...

11 පිටුවෙන්



බනින්නේ නැත. පොදු ප්‍රවාහන සේවයක් සඳහා සමාජය වෙනස් කිරීමට කල්පනා කරන්නේද නැත. මන්ද ඔබේ 'ප්‍රශ්නය' 'විසඳී' ඇතැයි ඔබ සිතන නිසාය. එය ආණ්ඩුවට වාසියකි. අනෙක් අතට වෙළඳපොළේදී රථවාහන සමාගම්කරුවෝ තම නිෂ්පාදනයක් ඔබට විකුණා ගැනීමට සමත්වී ඇත. එය ඔවුනට වාසියකි. එසේම ධනපති ණය දෙන සමාගමක් ඔබට පොලියට ණයක් ලබාදී ඇත. එය ඔවුන්ගේ ව්‍යාපාරයට වාසියකි. හැම දෙනාම 'තමන්ට වාහනයක්' ප්‍රතිපත්තියට ගොස් ණයට වාහන මිලදී ගත්විට මහමඟ වාහන තදබදය වැඩිවී නව අර්බුදයක් අලුතින් උපදී. වාහනය ගෙදර තබා 'පයින් යාම' හොඳයයි එවිට සිතේ. එහෙත් දැන් පාරිභෝගිකයා මෙම වෙළඳ උගුලට හසුවී අවසන්ය. ඔහු එම උගුලට හසුකර ගත්තේ අන් කිසිවෙකු නොව වෙළඳ 'ප්‍රචාරණ' යයි. මෙය නිවාස, අධ්‍යාපන වැනි සේවාවන්වලටද අදාළය. වෙළඳ ප්‍රචාරණය ධනවාදය තුළ භාණ්ඩ අලෙවි කරන්නෙක් පමණක් නොවේ. ධනවාදයට එරෙහිව නිර්මාණය විය හැකි ජනතා විරෝධයන් කැරලි හා සටන් දුර්වල කොට, ප්‍රශ්න විසඳා ගැනීමේ පොදු ක්‍රම වෙනුවට මිනිසුන් හුදකලා මාවත්වල අතරමංකොට ධනවාදය රැකදෙන්නෙක්ද වේ.

මේ අනුව පෙනෙන්නේ ධනවාදය තුළ 'ප්‍රචාරණය' ඉතා බලගතු අවියක් බවය. එය නිවැරදිව වටහාගෙන ඉන් මිදීමට අසමත් වුවහොත් ලෝකය වඩා යහපත් තැනක් බවට පත්කර ගැනීම වඩා දුෂ්කර විය හැක.

මිනිසා ධනවාදයේ චින්තන වහලෙක් නොවී නිදහස් හා නිවැරදි චින්තනයක් සහිත කෙනෙක් බවට පත් කළ යුත්තේත්, පත්විය යුත්තේත් මේ නිසාය.

## කෘමි සම්බාධකයට...

07 පිටුවෙන්




වසරේදීය. මෙ වනවිට සමස්ත ජනගහනයෙන් 22%ක් පෝෂණ ඌනතාවයෙන් පෙළෙයි.

2017 වර්ෂයේ ජනවාරි 01 සිට දෙසැම්බර් 08 දක්වා වාර්තා වූ ළමා අපයෝජන ගණන 8548 කි. ලිංගික අතවර පැමිණිලි වාර්තා වූ ප්‍රමාණය පමණක් 481කි. අවු. 18ට අඩු දරුවන් දූෂණය වීම 322කි. සෑම විනාඩි 90කටම වරක් ලංකාවේ කොතනක හෝ ස්ත්‍රියක දූෂණයට ලක්විණි. 2017 වසර තුළදී මනුෂ්‍ය ඝාතන 457කි. සියදිවි නසා ගැනීම් 2675කි. මේ වසරක ආර්ථික පරිහානිය සමාජ ජීවිත උඩුයටිකුරු කළ ආකාරයයි.

සුපුරුදු පරිදි සුභ නව වසරකට සම්ප්‍රදායිකව අප මේ වසර ආරම්භයේදීම සුභ පතා ගෙන ඇත. මෙවරත් ඒ සාම්ප්‍රදායික චාරිත්‍රයම ඉටුකර තිබේ. නමුත් ආර්ථිකයේ ඇති වුණු බේදවාචකයට පාලකයින්ට පිළිතුරු නැති නිසාම ජනතාවද අසරණය. ඒ නිසා ආර්ථිකය පණ ගසන නව දැක්මක් ඇවැසි යුගය එළඹ ඇත. නැතිනම් 2018 වසරටද කෘමීන් කා දමන ආර්ථිකයක්ම උරුම වසරක් වීම වැළැක්විය නොහැකිය.

## ජ.වි.පෙ. දැන් රට පුරාම...

16 පිටුවෙන්

තනි පක්ෂයක් ලෙස ශක්තිමත්ව ඡන්දෙට ඉදිරිපත් වෙන්න ජනතා විමුක්ති පෙරමුණට පුළුවන්.

ජනතා විමුක්ති පෙරමුණට අපේක්ෂයින්ගේ මදිකමක් නැහැ. නමුත් අපි මෙම මැතිවරණයේදී දේශපාලන වෙනසකට මුල පුරන්න වංචාව, දූෂණය නතර කිරීමට, ගම ගොඩනැගීමට කොට්ඨාස මට්ටමෙන් මන්ත්‍රීවරුන් අවශ්‍යයි. එනිසා ගම් මට්ටමේ සිට අලුත් දේශපාලන සංස්කෘතියක් ගොඩනැගිය යුතුයි. වංචාවට-දූෂණයට එරෙහි ගම වෙනුවෙන්, රට වෙනුවෙන් වැඩ කිරීමට සූදානම් නමුත් දේශපාලනයේ නොමැති විශාල පිරිසක් රට තුළ ඉන්නවා. එනිසා ඔවුන්ට අවස්ථාව උදාකිරීම සඳහා ඉඩක් දෙන්න ජනතා විමුක්ති පෙරමුණ තීරණය කළා. ඒ වෙනුවෙන් අපි පුවත්පත් දැන්වීමක් දාලා දූෂණයට විරුද්ධ අවංකව ස්වේච්ඡාවෙන් වැඩ කළ හැකි එ.ජා.ප.- ශ්‍රීල.නි.ප. දේශපාලනයට අකමැති අයට ආරාධනා කළා. අපිට විශාල ලිපි ප්‍රමාණයක් ලැබුණා. එම ලිපිවලින් තෝරාගත් පිරිසකට අපි මෙම මැතිවරණයට ඉදිරිපත් වීමට අවස්ථාව ලබාදුන්නා.

කතාවක් තිබෙනවා, යම් දෙයක් නොදන්නවාට වඩා බාගෙට ඉගෙන ගන්න එක භයානකයි කියලා. සමහර අයට දේශපාලනය හරියට ඉගෙන ගත්තත් තමන්ට ලාභ ප්‍රයෝජන ලබා ගැනීමේ මානසිකත්වයක් හැදෙනවා. එහෙම අය ජ.වි.පෙ.න් ඉවත් වුණොත් තමන්ගේ ලාභ ප්‍රයෝජන වෙනුවෙනුයි. ගියපු තැන ඒවා නැතිවුණාම තව තැනකට යනවා. ජ.වි.පෙ.ට දොස් කියලා ගිය පිරිස් බංකොලොත් රස්තියාදුකාරයින් බවට පත්වෙලා තිබෙනවා. අපේ රටේ ඡන්ද කාලය කියන්නේ, ඡන්ද සර්කස් තියෙන කාලයක්. එහෙට පනිනවා, මෙහෙට පනිනවා. ඇතැම් අය පනින්නේ කොහේටද කියලා ඔංචිල්ලාවේ පැද්දෙනවා. එහෙට මෙහෙට පනින අයගෙන් අපිට වැඩක් නැහැ. රට හදන්න හැඟීමක් තිබෙන හොඳ අය එකතු කරගෙන මේ පුංචි ඡන්දෙන් අපි ඒ ගමන ආරම්භ කරනවා."


නියමුවා
ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම පුවත්පත
464/20. පන්නිපිටිය පාර පැලවත්ත. බත්තරමුල්ල දුර. 0112-785612 Email: niyamuwanews@gmail.com

# නව දේශපාලනයක් භුක්ති විඳීම වෙනුවෙන් ජ.වි.පෙ. වටා එක්රොක් වෙන්න

## පළාත් පාලන මැතිවරණයේ කාව සටහන...













## ජ.වි.පෙ. නායක
## අනුර දිසානායක සහෝදරයා



රාජපක්ෂ, රනිල්, මෛත්‍රී කණ්ඩායම් තුනම අලුත් දේශපාලන දැක්මක් නැති යල් පැනගිය දේශපාලන ව්‍යාපාර බව පෙන්වා දුන් ජනතා විමුක්ති පෙරමුණේ නායක අනුර දිසානායක සහෝදරයා, අලුත් දේශපාලන දැක්මක් සහිත අලුත් පණිවිඩයක් ජනතාව අතරට ගෙන යන ව්‍යාපාරය ජ.වි.පෙ. බැවින් නව දේශපාලනයක් භුක්ති විඳීම වෙනුවෙන් ජනතා විමුක්ති පෙරමුණ වටා එක්රොක් වෙන්නැයි ජනතාවගෙන් ඉල්ලා සිටියේය.

ඔහු මෙම අදහස් පළ කළේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවේදීය. පළාත් පාලන ආයතනවලට විශාල කාර්යභාරයක් පැවරී තිබුණද මේ වනවිට පළාත් පාලන ආයතන ජනතාව රස්තියාදු කරන ජනතාවගේ සතුරු ආයතන බවට පත්වී ඇතැයි පෙන්වා දුන් අනුර දිසානායක සහෝදරයා, ජනතාවගේ සතුරන් බවට පත්වී ඇති පළාත් පාලන ආයතන ජනතාවගේ සමීපතම නෑදෑයන් බවට පරිවර්තනය කළ යුතුව ඇතැයිද ප්‍රකාශ කළේය. මෙහිදී වැඩිදුරටත් අදහස් දැක්වූ අනුර දිසානායක සහෝදරයා මෙසේද පැවසීය.

"මෙවර ජනතා විමුක්ති පෙරමුණේ මැතිවරණය තේමාව වූයේ 'ගම ගොඩනගන, දූෂණය පරදන ජවය' යන්නයි. රට ගොඩනගන කාර්යභාරයක් තිබෙන අතර එය පළාත් පාලන ආයතනවලින් ආරම්භ කළ යුතුව තිබෙනවා. එමෙන්ම මේ වන විට දේශපාලන මැදිහත්වීම අන්ත දූෂිත එකක් බවට පත්වී තිබෙනවා. අද රටේ ලාභදායීම ව්‍යාපාරය වී තිබෙන්නේ දේශපාලනයයි. අපේ රටේ ජනාධිපතිවරයාගේ සිට ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරයා දක්වා වංචාව-දූෂණය, අල්ලස පගාව පිරුණු රටක් බවට පත්වෙලා තිබෙනවා. එම නිසා මෙම හොර තිප්පොළවල් බවට පත්වී තිබෙන මහජන නියෝජිත ආයතන පිරිසිදු කිරීමේ වගකීම අපිට තිබෙනවා. ජාතික වශයෙන් පිරිසිදු කිරීම කළ යුතු අතර එය ප්‍රාදේශීය වශයෙන් ආරම්භ කළ යුතුව තිබෙනවා. ඒ සඳහා ජනතාවට විශාල කාර්යභාරයක් තිබෙනවා. හොර තිප්පොළවල් බවට පත්වෙලා තිබෙන ආයතන වසා දමා පිරිසිදු කිරීමේ කාර්යභාරය කළ යුතුව තිබෙනවා."

## ජ.වි.පෙ. දැන් රට පුරාම පැතිරුණු ශක්තිමත් සංවිධාන ජාලයක්

### ජ.වි.පෙ. ප්‍රධාන ලේකම්
### ටිල්වින් සිල්වා සහෝදරයා



ජ.වි.පෙ.න් අවස්ථා දෙකකදී කණ්ඩායම් දෙකක් ඉවත් වී තිබෙන බවත් දෙවැනි අවස්ථාවේදී අපේ පක්ෂයේ සංවිධානවල සුළු බිඳවැටීමක් සිදුවූ නමුත් මේ වන විට ජ.වි.පෙ. මුළු රට පුරාම ශක්තිමත් සංවිධාන ජාලයක් ගොඩනගා අවසන් බවත් ජ.විපෙ. ප්‍රධාන ලේකම් ටිල්වින් සිල්වා සහෝදරයා ප්‍රකාශ කළේය.

ටිල්වින් සිල්වා සහෝදරයා මෙම අදහස් පළ කළේ පසුගිය 12වැනි දින ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පවත්වන ලද මාධ්‍ය හමුවට එක්වෙමිනි. මෙහිදී මාධ්‍යවේදීන් නගන ලද ප්‍රශ්නවලට පිළිතුරු දෙමින් ඔහු මෙසේද පැවසීය.

"යාපනය, මඩකලපුව, දිස්ත්‍රික්කවල පළාත් පාලන ආයතනවලට පවා නාමයෝජනා ලබාදීමට අපි සමත්වෙලා තිබෙනවා. මේ මැතිවරණයේදී විශේෂත්වයක් තිබෙනවා. ලයිස්තු දාලා බේරෙන්න පුළුවන්කමක් නැහැ. කොට්ඨාශ මට්ටමින් ක්‍රියාකාරී අපේක්ෂකයින් ඡන්දෙට ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. බිමේ ඇත්ත නියෝජනය නාමයෝජනාවලට ඇතුළත් කළ යුතුව තිබෙනව. අපිට ක්‍රියාකාරී සාමාජිකයින් නැත්නම් එහෙම කරන්න පුළුවන්කමක් නැහැ. අපේ පක්ෂය කඩාගෙන වෙන පක්ෂ හදන්න ගිය අය අද ඉතිහාසයේ කුණු කූඩයට වැටිලා තිබෙනවා. විමල් වීරවංශ පක්ෂෙන් ගියේ අලුත් වමක් හදන්නයි. දැන් වම දකුණ හොයාගන්න බැරුව ඉන්නවා. රට රකිනවා කියන විමල් බොරුව කරන්නේ කියලා ඉන්න හතර පස්දෙනාත් අද විමල් දාලා යනවා. පෙරටුගාමී අය ඡන්දෙ ඉල්ලන්නෙත් නැහැ. ඒකට හේතුවක් කියාගන්නත් බැහැ. මොකද, ඒ අයට ජනාධිපතිවරණයෙදී තිබුණේ ඡන්ද 7,000යි මේ මැතිවරණයට අපේක්ෂකයෝම 8,000ක් විතර ඕනෑ. ඒ නිසා අපිට කිසි ප්‍රශ්නයක් නැහැ. එහෙන් මෙහෙන් අහුලන්නේ නැතිව කොට්ඨාස මට්ටමෙන් අපේක්ෂකයෝ දාන්න අපි සමත් වෙලා තිබෙනවා. 15වැනි පිටුවට

## ගම ගොඩනගන්න නම් ගමේ නායකත්වයට දූෂණය පරදන ජවයක් ඕනෑ

### ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම්
### විජිත හේරත් සහෝදරයා



ගම හා නගරය ගොඩනැගීමට නම් පළමුව දූෂණය පරාජය කළ යුතු යැයි අවධාරණය කළ ජ.වි.පෙ. ප්‍රචාරක ලේකම් විජිත හේරත් සහෝදරයා, 'ගම ගොඩනගන, දූෂණය පරදන ජවය' යන්න මෙවර ජනතා විමුක්ති පෙරමුණේ තේමාව වූ බවත් ගම ගොඩනැගීමට නම් දූෂණය පරාජය කළ හැකි ජවයක් ගමේ නායකත්වයට අවශ්‍ය බව කියා සිටියේය.

විජිත හේරත් සහෝදරයා මේ බව කියා සිටියේ, පසුගිය 22වැනි දින පැලවත්ත ජ.වි.පෙ. ප්‍රධාන කාර්යාලයේ පැවැති මාධ්‍ය හමුවේදීය. මෙහිදී වැඩිදුරටත් කරුණු දැක්වූ ඔහු මෙසේද පැවසීය.

"තිස්ස ප්‍රාදේශීය සභාව ජනතා විමුක්ති පෙරමුණේ පාලනයක් තුළ ගම ගොඩනගන ආකාරය පෙන්වා දී තිබෙනවා. 2002දී තිස්ස ප්‍රාදේශීය සභාවේ බලය පළමු වරට ජනතා විමුක්ති පෙරමුණට ජනතාව ලබාදුන්නා. පළමු අවුරුදු 4ක පාලන කාලයේදී දස වැදෑරුම් වැඩපිළිවෙළක් යටතේ ප්‍රාදේශීය සභාව ගොඩනැගුවා. වසරක් පාසා හොඳම ප්‍රාදේශීය සභාව ලෙස තේරී පත්වුණා. එවකට දකුණේ මහ ඇමතිවරයා විසින් තමයි එම සම්මාන ප්‍රදානය කළේ. මුළු රටේම පළාත් පාලන ආයතනවලින් අංක එකට පත්වෙන්න තිස්ස ප්‍රාදේශීය සභාවට හැකි වුණා. 2006දී දෙවන වතාවටත් තිස්සමහාරාම ජනතාව වැඩි මන්ත්‍රී ප්‍රමාණයක් ලබා දෙමින් ප්‍රාදේශීය සභාවේ බලය ජවිපෙට ලබා දුන්නා. මේ ආදර්ශයම ප්‍රමාණවත් වෙනවා ජනතාවට ජනතා විමුක්ති පෙරමුණේ පාලනයක් හඳුනා ගන්න. ආණ්ඩුව කියනවා, ගම ගොඩනගන්න නම් පවතින ආණ්ඩුවටම ගමේ බලයත් දෙන්න කියලා. ඒ කතාව පට්ටපල් බොරුවක්. ජනතා විමුක්ති පෙරමුණේ අපි ආණ්ඩු බලයක් නැතිව ප්‍රාදේශීය සභාව ගොඩනගන විදිහ තිස්සෙදී පෙන්නුවා.

මිනිසෙකුගේ උපතේ සිට විපත දක්වා සියලුම යටිතල පහසුකම් ලබා දෙන්නේ ප්‍රාදේශීය සභාව හෝ නගර සභාවයි. මෙම ආයතනවලට ආදායම ලැබෙන්නේ වරිපනම් බදු මුද්දර ගාස්තු, සහ එම පළාත් පාලන බල ප්‍රදේශය තුළ එකතු කරන දඩ මුදල්වලින්. එමෙන්ම එම බල ප්‍රදේශය තුළ පළාත් පාලන ආයතනය මැදිහත් වී සිදුකරන ආණ්ඩුවේ ව්‍යාපෘතිවලින් ආදායමක් ලැබෙනවා. කොළඹ නගර සභාවේ පසුගිය වසරේ ආදායම කෝටි 1400ක්. 2018 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායම කෝටි 1600යි. එනිසා පළාත් පාලන ආයතනවලින් ජනතාවට මූලික යටිතල පහසුකම් ලබාදීමට ආදායම් උපයා ගන්න පුළුවන්. එනිසා ආණ්ඩුව කරන පක්ෂයටම ප්‍රාදේශීය සභා ලබාදෙන්න ඕන නැහැ. අපි ජනතාවගෙන් ඉල්ලනවා, පළාත් පාලන ආයතනවල බලය ජ.වි.පෙ.ට දෙන්න අපි හදලා පෙන්වනන්නම් කියලා."



ජනවාරි 01 දාට යෙදෙන
කියුබානු විප්ලවයේ
59 වන සංවත්සරයට
අපේ විප්ලවීය
සුභපැතුම්!
ජනතා විමුක්ති පෙරමුණ

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාරේ 464/20 හි පදිංචි එම්.ටිල්වින් සිල්වා වන මා විසින් අංක 43/20, නුගගහ පෙදෙස, පිළියන්දල පාර, මහරගම පිහිටි නියමුවා ප්‍රකාශන ආයතනයේ මුද්‍රණය කරවා ප්‍රසිද්ධ කරන ලදී.